# රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව 2023

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

2022 නොවැම්බර් 14

# රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව 2023


**රනිල් වික්‍රමසිංහ**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය


2022 නොවැම්බර් 14

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ, රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය-2023 (4, 5 සහ 6 වගන්තිවලට අනුකූලව) සහ අයවැය ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව-2023 (7, 8 සහ 9 වගන්තිවලට අනුකූලව) ගරු මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින් නිකුත් කරනු ලැබේ.

**ISBN** 978-624-5674-11-4

කොළඹ 08, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 118 දරන ස්ථානයේ පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරන ලදුව, ශ්‍රී ලංකාවේ කොළඹ 01, මහලේකම් කාර්යාලයේ පිහිටි මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් පළ කරන ලදී.

## පටුන


| | පිටු අංකය |
|---|---|
| මූලික ආර්ථික දර්ශක | vii |
| 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ ඉදිරිපත් කළ යුතු වාර්තා | viii |
| අනුකූලතාවය - 2022 | ix |
| **I කොටස** | |
| රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය - 2023 | xiii |
| **01. මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය** | |
| 1.1 සමාලෝචනය | 3 |
| 1.2 මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයන් | 5 |
| **I I කොටස** | |
| අයවැය, ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2023 | 11 |
| **01. රාජ්‍ය මූල්‍ය උපනතීන්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ විදේශ මූල්‍යයනය** | |
| 1.1 සමාලෝචනය | 15 |
| 1.2 රජයේ ආදායම | 18 |
| 1.3 රජයේ වියදම | 29 |
| 1.4 භාණ්ඩාගාර මෙහෙයුම් | 32 |
| 1.5 විදේශ මූල්‍යයනය | 34 |
| **02. ආර්ථික උපනතීන්** | |
| 2.1 සමාලෝචනය | 41 |
| 2.2 ආර්ථික වර්ධනය | 42 |
| 2.3 මුදල් අංශයේ වර්ධනයන් | 49 |
| 2.4 කොටස් වෙළෙඳපොළ | 51 |
| 2.5 විදේශ අංශයේ වර්ධනයන් | 51 |
| 2.6 ලෝක ආර්ථික සන්දර්භය | 54 |
| **03. රජය සතු ව්‍යාවසායයන්හි කාර්යසාධනය** | |
| 3.1 සමාලෝචනය | 59 |
| 3.2 රජය සතු ප්‍රධාන ව්‍යාවසායයන් දහය පිළිබඳ සමාලෝචනය | 59 |
| **04. 2023 අයවැය සැකසීම සඳහා පදනම් වූ සාධක** | 67-71 |

## වගු


| | | පිටු අංකය |
|---|---|---|
| **I කොටස** | | |
| වගුව 1.1 | මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව 2022 සිට 2027 දක්වා | 7 |
| **II කොටස** | | |
| වගුව 1.1 | රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සාරාංශය | 16 |
| වගුව 1.2 | ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම සහ වියදම - 2022 | 17 |
| වගුව 1.3 | රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සංක්ෂිප්තය | 18 |
| වගුව 1.4 | එකතු කළ අගය මත බදු කාර්යසාධනය | 19 |
| වගුව 1.5 | නිෂ්පාදන බදු/සුරාබදු කාර්යසාධනය | 20 |
| වගුව 1.6 | මෝටර් රථ වාහන ආනයන සහ නව ලියාපදිංචි කිරීම | 21 |
| වගුව 1.7 | නිදහස් වෙළෙඳ ගිවිසුම් මගින් ආවරණය වන ආනයනය/අපනයනය කරන ලද භාණ්ඩ හා වටිනාකම් | 21 |
| වගුව 1.8 | ජාත්‍යන්තර වෙළඳාමෙන් ලද සෙස් බදු ආදායම | 22 |
| වගුව 1.9 | මුද්දර බදු සහ මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු වල කාර්යසාධනය | 22 |
| වගුව 1.10 | රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය (ජනවාරි - සැප්තැම්බර් 2022) | 23 |
| වගුව 1.11 | රාජ්‍ය වියදම් කාර්යසාධනය | 29 |
| වගුව 1.12 | රජයේ සුරැකුම්පත් මත ගෙවන පොලී අනුපාතයන්හි සහ විනිමය අනුපාතිකයන්හි හැසිරීම (%) 2021 සිට 2022 දක්වා | 30 |
| වගුව 1.13 | සුබසාධන වියදම් | 31 |
| වගුව 1.14 | රජයේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 33 |
| වගුව 1.15 | දළ දේශීය ණය මූලාශ්‍ර අනුව | 33 |
| වගුව 1.16 | 2022 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා ඇතිකර ගත් විදේශ මූල්‍යයන එකඟතා, අදාල මූල්‍ය කොන්දේසි සමග | 35 |
| වගුව 1.17 | විදේශ ණය හා ප්‍රදාන ප්‍රතිලබ්ධි - 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා | 36 |
| වගුව 2.1 | ස්ථාවර (2015) මිල ගණන් අනුව ද.දේ.නි.යේ ආංශික සංයුතිය | 42 |
| වගුව 2.2 | සේවා අංශයේ තෝරාගත් දර්ශකයන් | 47 |
| වගුව 2.3 | සංචාරක අංශයේ කාර්යසාධනය | 48 |
| වගුව 2.4 | ද.දේ.නි වර්ධනයේ ආංශික ව්‍යාප්තිය (%) | 49 |
| වගුව 2.5 | මතුපිට උද්ධමනය, මූලික උද්ධමනය සහ ආහාර උද්ධමනය (පාදක වර්ෂය: 2013 = 100 | 50 |
| වගුව 2.6 | ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙනස්වීම් | 51 |
| වගුව 2.7 | විදේශීය වෙළඳාම | 53 |
| වගුව 2.8 | තෝරාගත් රටවල ප්‍රධාන ආර්ථික දර්ශක - 2022 (පුරෝකථනය) | 56 |
| වගුව 3.1 | විදුලි උත්පාදන සංයුතිය හා ධාරිතාවය | 60 |
| වගුව 3.2 | ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි ලාභදායීත්වය | 64 |
| වගුව 3.3 | රාජ්‍ය ව්‍යවසායයන් වෙතින් ලද අයබදු/ලාභාංශ ආදායම | 65 |

## රූපසටහන්


| | | පිටු අංකය |
|---|---|---|
| **II කොටස** | | |
| රූපසටහන 1.1 | මුළු ආදායම් සංයුතිය - 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා | 18 |
| රූපසටහන 1.2 | මූලාශ්‍ර අනුව මුළු බදු ආදායම - 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා | 18 |
| රූපසටහන 1.3 | නිෂ්පාදන බදු/සුරාබදු කාර්යසාධනය - 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා | 20 |
| රූපසටහන 1.4 | මූලාශ්‍ර අනුව දළ දේශීය ණය - 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා | 34 |
| රූපසටහන 1.5 | එක් එක් අංශය වෙනුවෙන් 2021 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා සිදු වූ ප්‍රතිලබ්ධි | 37 |
| රූපසටහන 1.6 | පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය එක් එක් සංවර්ධන පාර්ශ්වකරු අනුව 2022 සැප්තැම්බර් 30 දිනට | 37 |
| රූපසටහන 1.7 | 2022 සැප්තැම්බර් 30 වන විට අංශ අනුව පළ කරන ලද එකඟතා මත ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය (ඇ.ඩො. මිලියන) | 37 |
| රූපසටහන 1.8 | 2022 ජනවාරි සිට අගෝස්තු දක්වා ණය සේවාකරණ ගෙවීම් සහ 2021 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා වූ පුරෝකථන | |
| රූපසටහන 2.1 | දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය | 41 |
| රූපසටහන 2.2 | දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය - 2022 පළමු භාගය | 42 |
| රූපසටහන 2.3 | කෘෂිකාර්මික අංශයේ සංයුතිය - 2022 පළමු භාගය | 44 |
| රූපසටහන 2.4 | කර්මාන්ත අංශයේ සංයුතිය - 2022 පළමු භාගය | 45 |
| රූපසටහන 2.5 | නිෂ්පාදන අංශයේ සංයුතිය - 2022 පළමු භාගය | 45 |
| රූපසටහන 2.6 | සේවා අංශයේ සංයුතිය - 2022 පළමු භාගය | 46 |
| රූපසටහන 2.7 | ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය සහ සේවා වියුක්තිය | 48 |
| රූපසටහන 2.8 | පොලී අනුපාත, මුදල් සමස්තයන් සහ පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය | 50 |
| රූපසටහන 2.9 | මතුපිට, මූලික සහ ආහාර උද්ධමනයේ විචලතා (පදනම: 2013 = 100) | 50 |
| රූපසටහන 2.10 | වෙළඳ ශේෂය සහ විනිමය අනුපාත වෙනස් වීම් | 52 |
| රූපසටහන 2.11 | අපනයන සංයුතිය | 52 |
| රූපසටහන 2.12 | ආනයන සංයුතිය | 54 |
| **සටහන්** | | |
| සටහන 2.1 | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් - 2022 ජනවාරි සිට සැප්තැම්බර් | 26 |
| **ඇමුණුම්** | | |
| ඇමුණුම I | 2022 සැප්තැම්බර් 30 දිනට භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බැංකු ඇපකර ලැයිස්තුව | 72 |
| ඇමුණුම II | සාර්ව ආර්ථික දර්ශක | 74 |
| ඇමුණුම III | 2023 ආදායම් ඇස්තමේන්තු සඳහා පාදක වූ උපකල්පන | 82 |

## මූලික ආර්ථික දර්ශක

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකක | වටිනාකම 2021 | වටිනාකම 2022 (Provisional) |
|---|---|---|---|---|
| **මූර්ත අංශය** | | | | |
| ආර්ථික වර්ධනය | පළමු භාගය | % | 9.3 | -4.8 |
| කෘෂිකර්මාන්ත | පළමු භාගය | % | 8.8 | -7.6 |
| කර්මාන්ත | පළමු භාගය | % | 12.4 | -7.1 |
| සේවා | පළමු භාගය | % | 5.6 | -0.6 |
| උද්ධමනය (ලක්ෂ්‍යමය) - CCPI | ඔක්. අවසානයට | % | 7.6 | 66.0 |
| උද්ධමනය (සාමාන්‍ය) - CCPI | ඔක්. අවසානයට | % | 4.8 | 38.3 |
| සේවා වියුක්ති අනුපාතය | දෙවන කාර්තුව | % | 5.1 | 4.6 |
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය | දෙවන කාර්තුව | % | 49.8 | 50.1 |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | |
| අයවැය හිඟය | ජන-සැප්. | රු.බිලි. | -1,328 | -1,244 |
| මුළු ආදායම | ජන-සැප්. | රු.බිලි. | 1,051 | 1,448 |
| බදු ආදායම | ජන-සැප්. | රු.බිලි. | 952 | 1,283 |
| බදු නොවන ආදායම | ජන-සැප්. | රු.බිලි. | 99 | 165 |
| මුළු වියදම | ජන-සැප්. | රු.බිලි. | 2,380 | 2,695 |
| වර්තන වියදම් | ජන-සැප්. | රු.බිලි. | 2,087 | 2,300 |
| රාජ්‍ය ආයෝජන | ජන-සැප්. | රු.බිලි. | 305 | 418 |
| රාජ්‍ය ණය | ජුනි අවසානයට | රු.බිලි. | 16,565 | 24,264 |
| **විදේශ අංශය** | | | | |
| අපනයන | ජන-සැප්. | ඇ.ඩො.මිලි. | 8,938 | 9,981 |
| කෘෂි අපනයන | ජන-සැප්. | ඇ.ඩො.මිලි. | 1,987 | 1,940 |
| කාර්මික අපනයන | ජන-සැප්. | ඇ.ඩො.මිලි. | 6,903 | 8,001 |
| රෙදිපිළි හා ඇගළුම් | ජන-සැප්. | ඇ.ඩො.මිලි. | 3,893 | 4,577 |
| අනෙකුත් | ජන-සැප්. | ඇ.ඩො.මිලි. | 3,010 | 3,424 |
| ආනයන | ජන-සැප්. | ඇ.ඩො.මිලි. | 14,938 | 14,085 |
| පාරිභෝගික භාණ්ඩ | ජන-සැප්. | ඇ.ඩො.මිලි. | 2,890 | 2,147 |
| අන්තර් භාණ්ඩ | ජන-සැප්. | ඇ.ඩො.මිලි. | 8,791 | 9,497 |
| එයින් ඛනිජ තෙල් නිෂ්පාදන | ජන-සැප්. | ඇ.ඩො.මිලි. | 2,597 | 3,694 |
| ආයෝජන භාණ්ඩ | ජන-සැප්. | ඇ.ඩො.මිලි. | 3,249 | 2,433 |
| වෙළඳ ශේෂය | ජන-සැප්. | ඇ.ඩො.මිලි. | -5,999 | -4,104 |
| සංචාරක පැමිණීම් | ජන-ඔක්. | සංඛ්‍යාව | 60,695 | 568,258 |
| සංචාරක ඉපයීම් | ජන-ඔක්. | ඇ.ඩො.මිලි. | 158.2 | 1,022 |
| සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | ජන-සැප්. | ඇ.ඩො.මිලි. | 4,895 | 2,929 |
| කොටස් වෙළඳපොළ විවිධ ආයෝජනය (ශුද්ධ) | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | -181.3 | 97.2 |
| සමස්ත ගෙවුම් ශේෂය (BOP) | ජන-සැප්. | ඇ.ඩො.මිලි. | -2,573 | -2,927 |
| දළ නිල සංචිත | සැප්. අවසානයට | ඇ.ඩො.මිලි. | 2,704 | 1,777 |
| විනිමය අනුපාතය (මාසය අග) | සැප්. අවසානයට | ඇ.ඩො./රු. | 201.9 | 363.3 |
| විනිමය අනුපාතය (මාසික සාමාන්‍ය) | ජන-සැප්. | ඇ.ඩො./රු. | 201.1 | 363.1 |
| **මුදල් අංශය** | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | ඔක්. අවසානයට | % | 5.00 | 14.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | ඔක්. අවසානයට | % | 6.00 | 15.50 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සැප්. අවසානයට | % | 4.00 | 4.00 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (සතිපතා) | සැප්. අවසානයට | % | 6.42 | 25.95 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 91) | සැප්. අවසානයට | % | 6.70 | 31.94 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 364) | සැප්. අවසානයට | % | 7.01 | 29.85 |
| මුදල් සැපයුම් වර්ධනය ($M_{2b}$) | 2021 සැප්./2022 සැප්. | % | 18.2 | 14.9 |
| පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි වර්ධනය | 2021 සැප්./2022 සැප්. | % | 13.8 | 11.0 |

**2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ ඉදිරිපත් කළ යුතු වාර්තා**

| වගන්තිය | අවශ්‍යතාව | අවශ්‍ය අන්තර්ගතය | අනුකූලතාවය |
|---|---|---|---|
| 4, 5 සහ 6 වගන්ති | රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කිරීම* | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම සහ රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායේ භාවිතය ඇගයීම සඳහා සම්මතයක් ඇති කර ගැනීම සඳහා වන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය | විසර්ජන පනත් කෙටුම්පත දෙවන වරට කියවන දිනයේ දී මහජනතාවට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 7, 8 සහ 9 වගන්ති | අයවැය ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම* | රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව ඇගයීම සඳහා අවශ්‍ය අයවැය, ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්ව වාර්තාව | විසර්ජන පනත් කෙටුම්පත දෙවන වරට කියවන දිනයේ දී මහජනතාවට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 10, 11 සහ 12 වගන්ති | වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම* | වසරේ පළමු මාස හතරට අදාලව රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ නවතම තොරතුරු මහජනතාවට දැනගැනීමට සැලැස්වීම සහ රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව ඇගයීමක් සිදු කිරීමට හැකියාවක් ලබා දීම සඳහා වන, වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්ව වාර්තාව | අදාල වර්ෂයේ ජූනි මස අවසාන දිනට හෝ විසර්ජන පනත සම්මත වීමෙන් මාස හයක් ඉක්ම යාමට පෙර යන කාල පරිච්ඡේද දෙකෙන් පසුව එළඹෙන දිනට ප්‍රථම, මහජනතාවට නිකුත් කළ යුතුය. එම නිකුත් කිරීමේ දින සිට සති දෙකක කාලයක් තුළ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 13, 14 සහ 15 වගන්ති | අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම (වාර්ෂික වාර්තාව)* | පවත්නා වසරට අදාලව රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ නවතම තොරතුරු මහජනතාවට දැන ගැනීමට සැලැස්වීම සහ රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව ක්‍රියාකාරීත්වය පිළිබඳව ඇගයීමක් සිදු කිරීමට හැකියාවක් ලබා දීම සඳහා වන, අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව (වාර්ෂික වාර්තාව) | මුදල් වර්ෂය අවසාන වී මාස පහක් ඉක්මවා යාමට පෙර මහජනතාවට නිකුත් කර එම නිකුත් කිරීමේ දින සිට සති දෙකක කාලයක් තුළ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 16, 17, 18 සහ 19 වගන්ති | පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම** | රටේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ නවතම තොරතුරු මහජනතාවට දැනගැනීමට සැලැස්වීම සඳහා වන පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව | පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් තෝරාපත් කර ගැනීම සඳහා මහ මැතිවරණයක් පැවැත්වීමට නියම කිරීමේ ප්‍රකාශයෙන් සති තුනක් ඇතුළත රටේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් මැතිවරණ පූර්ව තත්ත්වය පිළිබඳ වාර්තාවක් මහජනතාව වෙත ඉදිරිපත් කළ යුතුය. නව පාර්ලිමේන්තුව රැස් කිරීමේ දින සිට සති දෙකක කාලයක් තුළ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |

* මුදල් ඇමතිවරයා විසින්

** මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින්

## අනුකූලතාවය - 2022

- **අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2021 වාර්ෂික වාර්තාව**

2021 වසරේ රාජ්‍ය මූල්‍ය හා ආර්ථික තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් 2022 මැයි මස අවසන් වන විට මහජනතාවට නිකුත් කර 2022 ජූනි මස 22 දින වන විට එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

- **වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2022**

2022 වසරේ පළමු මාස හතරෙහි රාජ්‍ය මූල්‍ය හා ආර්ථික තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් 2022 ජූනි මස අවසන් වන විට මහජනතාව වෙත ඉදිරිපත් කර 2022 ජූලි මස 21 දින වන විට එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

**රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව - 2023 හි පහත සඳහන් වාර්තා අන්තර්ගත වේ.**

- **රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය - 2023**

මෙම වාර්තාවේ, සමස්ත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී වැදගත් ලෙස සළකනු ලබන පුළුල් රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග යන් දක්වමින් රජයේ ප්‍රධාන ක්‍රමෝපායික ප්‍රමුඛතාවයන් ඇතුලත් වේ. විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවන දිනයේ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

- **අයවැය, ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2023**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන මෙම වාර්තාවේ රජයේ ආදායම, වියදම සහ රජයේ ණය ගැනීම් යනාදියේ ඇස්තමේන්තු ඇතුලත් වන අතර, රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රජයේ මූල්‍ය ක්‍රියාකාරීත්වය ඇගයීමට පදනම් වන කරුණු ඇතුලත් වේ. විසර්ජන පනත් කෙටුම්පත දෙවනවර කියවන දිනයේ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

# I කොටස

**රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය 2023**
**2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 4, 5 සහ 6**
**වගන්ති යටතේ ගරු මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී.**

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 4, 5 සහ 6 වගන්ති අනුව විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දී දෙවන වර කියවන දිනයේදී මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය මහජනතාවට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වන අතර ඒ අනුව මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

අයවැය සඳහා පදනම් වූ පුළුල් ක්‍රමෝපායික ප්‍රමුඛතාවයන් සහ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය හා සමස්ත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී වැදගත් විය හැකි යැයි රජය විසින් සලකනු ලබන ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග මෙම වාර්තාව මගින් පැහැදිලි කරනු ලබයි.

# මධ්‍යකාලීන රාජ්‍ය මූලෝපාය ක්‍රමෝපාය | 01

## 1.1. සමාලෝචනය

ශ්‍රී ලංකාව මේ වනවිට පෙර නොවූ විරූ මට්ටමේ සාර්ව ආර්ථික අර්බුදයෙන් මිදීමේ ප්‍රයත්නයක නිරත වී ඇත. ගෙවුම් ශේෂයෙහි ජංගම ගිණුමේ දිගු කල් පවතින හිඟය සහ රාජ්‍ය මූල්‍ය අංශයෙහි අයවැය හිඟය එකවිට පැවතීම හේතුවෙන් පැන නැඟී ඇති "ද්විත්ව හිඟය" ඇතුළු නොයෙකුත් බාධක හේතුවෙන් ආර්ථිකය අඩපණ වී ඇති අතර, 2019 වසර අවසානයේ දී සිදු කරන ලද අධික බදු අඩු කිරීම් අයවැය හිඟය වඩාත් තීව්‍ර වීම හේතු කොටගෙන මහ බැංකු මූල්‍යනය මත අධික ලෙස රඳා පැවතීමේ අවශ්‍යතාවය මතු විය. දේශීය ප්‍රතිපත්ති මඟින් ඇති වූ අභියෝගවලට අමතරව කොවිඩ්-19 වසංගතය සහ යුක්‍රේන-රුසියානු ගැටුම ආදී වූ බාහිර කම්පන, සංචාරක සහ ශ්‍රමික ප්‍රේෂණ ආදී විදේශ අංශයෙහි ප්‍රධාන ලැබීම් සීඝ්‍රයෙන් අඩු වීම සඳහා හේතු වූ අතර එය මෙම අවදානම් තවදුරටත් උග්‍ර විය. එහි ප්‍රතිඵලයක් ලෙස භාවිතා කළ හැකි සංචිත ශුන්‍ය මට්ටමට ආසන්නව අඩු වීම, වාර්තාගත ලෙස උද්ධමනය ඉහළ යාම, තියුණු ලෙස රුපියල අවප්‍රමාණය වීම සහ ආර්ථික වර්ධනය විශාල ලෙස සංකෝචනය වීම ශ්‍රී ලංකාව මෙම වසර තුළ අත් දකින ලදී. දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.ය) 2021 වසරේ පළමු භාගයේ දී සියයට 9.3 ක තියුණු වර්ධනයක සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 4.8 කින් සංකෝචනය විය. මෙම අහිතකර ආර්ථික ප්‍රවණතාවයන් හේතුවෙන් දිළිඳු සහ අවදානමට ලක් වූ ජනතාව වඩාත් අහිතකර ලෙස පීඩාවට පත්ව ඇත.

ආදායම් වර්ධනයට වඩා වියදම් ඉක්මවා යාම රජයේ මුදල් ප්‍රවාහයට දැඩි ලෙස බලපා ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස දැනටමත් ඉහළ ගොස් ඇති ණය ප්‍රමාණය තව දුරටත් ඉහළ යන ලදී. රාජ්‍ය ණය තිරසාර නොවන අතර ණය නිසි ලෙස කළමනාකරණය කිරීම සඳහා ණය හිමියන් සමඟ එළඹෙන එකඟතා ප්‍රගතියක් කරා ලඟා වන තුරු, විදේශ ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවන බව රජය විසින් ප්‍රකාශයට පත් කිරීමට එය හේතු විය. කෙසේ වුවද, 2022 වසරේ දෙවන භාගයේ දී ආර්ථික ස්ථායිතාවයේ සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේ හැකියාවෙහි මූලික සළකුණු දැකගත හැකි විය. ඒ අනුව, දැනට මහ බැංකුවෙන් ලබා දෙන මූල්‍යනය පාලනය කර ඇති අතර ආනයන පාලනය සඳහා ක්‍රියාවට නංවන ලද දැඩි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් විදේශ අංශය ස්ථාවර වී ඔක්තෝබර් මාසයේ දී උද්ධමන වේගය අඩු විය.

රාජ්‍ය වියදම් තාර්කිකරණය කරන අතරම බදු අනුපාත ඉහළ නැංවීම සහ බදු පදනම පුළුල් කිරීම තුළින් දිගු කලක් තිස්සේ නොසලකා හරින ලද සහ රාජ්‍ය මූල්‍ය අංශයේ අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණ රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. ආර්ථිකයෙහි ප්‍රධාන අංශයන්හි පුළුල් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සමඟ සාර්ව ආර්ථික ස්ථායීතාවය සහ ණය තිරසරභාවය සඳහා මුල පිරීම උදෙසා විස්තීරණ අරමුදල් පහසුකම ඔස්සේ රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සහාය අපේක්ෂා කරන ලදී. සාර්ව ආර්ථික ගැලපුම් වැඩසටහනක් (Macroeconomic Adjustment Programme) සඳහා 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී කාර්යය මණ්ඩල මට්ටමේ එකඟතාවයකට එළඹුණි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ අරමුදල් පහසුකම් (IMF- EFF) වැඩසටහන යටතේ බදු ගැලපීම් ඇතුළු ප්‍රධාන ප්‍රතිසංස්කරණ කිහිපයක් දැනටමත් රජය මඟින් ක්‍රියාවට නංවා හෝ ප්‍රකාශයට පත් කර ඇති අතර ආර්ථිකය ස්ථායිකරණය සඳහා ප්‍රතිසංස්කරණ කිහිපයක් ඉදිරියේදී ද ක්‍රියාත්මක කිරීමට නියමිතය.

2022 වසරේ ඔක්තෝම්බර් මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නිකුත් කරනු ලැබූ ලෝක ආර්ථික ඉදිරි දැක්මට (World Economic Outlook) අනුව, ශ්‍රී ලංකාවේ මූර්ත ද.දේ.නි. ය 2022 වසරේ දී සියයට 8.7 කින් සැළකිය යුතු ලෙසද 2023 වසර වන විට තවදුරටත් සියයට 3.0 කින් ද සංකෝචනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. චීන ආර්ථිකය මන්දගාමී වීම, රුසියාව හා යුක්රේනය අතර ගැටුම් තවදුරටත් පවතින බලපෑම සහ ගෝලීය උද්ධමනය ඉහළයාම හා ගෝලීය වශයෙන් මුදල් ප්‍රතිපත්ති දැඩිකිරීම මඟින් ශ්‍රී ලංකාවේ දේශීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම කෙරෙහි තවදුරටත් බාධා එල්ල වනු ඇත. ගෝලීය ආර්ථික වර්ධනය 2022 වසරේ දී සියයට 3.2 කට ආසන්න වනු ඇතැයි ද, 2023 වසර වන විට 2.7 ක් දක්වා තවදුරටත් මන්දගාමී වනු ඇතැයි ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපේක්ෂා කරයි.

2020 හා 2021 වර්ෂයන්හි සියයට 10 ඉක්ම වූ අයවැය හිඟයන් වාර්තා කිරීමෙන් පසු 2022 වසරේ ජූනි මස සිට ආරම්භ වූ ආදායම් පාදක රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්නයන් සමඟ, අයවැය හිඟය ද.දේ.නි. යෙන් සියයට 8.0 ක පමණ වූ තනි ඉලක්කමක මට්ටමකට සීමා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2021 වසරේ මධ්‍යම රජයේ ණය රු. බිලියන 17,590 ක් එනම් ද.දේ.නි.යෙන් සියයට 99.5 ක ප්‍රතිශතයක් වූ අතර, ඉන් සියයට 36.9 ක් විදේශ මුදලින් නාමනය කර ඇති ණය වේ. මධ්‍යම රජයේ නොපියවූ ණය 2021 වසරේ අග වන විට වූ රු. බිලියන 17,589.4 සිට 2022 වසරේ ජූනි මාසය අග වන විට රු. බිලියන 24,264.4 ක් දක්වා සියයට 37.9 කින් වැඩි වී ඇත. 2022 ජූනි මාසය අග වනවිට, නොපියවූ සමස්ත දේශීය ණය ප්‍රමාණය රු. බිලියන 12,738.5 ක් දක්වා සියයට 14.8 කින් ඉහළ ගිය අතර, නොපියවූ විදේශීය ණය ප්‍රමාණයේ රුපියල් අගය රු. බිලියන 11,525.9 ක් දක්වා සියයට 77.5 කින් වැඩි විය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2022 වසරේ මාර්තු මස 07 වන දින ව්‍යවහාර මුදල් අගය ලිහිල් කිරීම ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, 2022 වසරේ ජනවාරි-මැයි කාල සීමාවේ දී ශ්‍රී ලංකා රුපියල සියයට 70 කට වැඩි ප්‍රමාණයකින් අවප්‍රමාණය විය. අන්තර් දින විනිමය අනුපාතිකයෙහි විචලනය වැළැක්වීමේ අරමුණින් මහ බැංකුව විසින් 2022 වසරේ මැයි මස 13 වන දින සිට බලපැවැත්වෙන පරිදි අන්තර් බැංකු වෙළඳපොළේ බර තැබූ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකයෙහි මධ්‍යය අනුපාතිකයක් සහ විචලන සීමාවක් ප්‍රකාශයට පත්කරන ලද අතර, එය විධිමත් හා අවිධිමත් විදේශ විනිමය වෙළෙඳපොළ අනුපාත අතර පරතරය සැලකියයුතු ලෙස අඩු කිරීම සඳහා උපකාරී විය.

අයවැය හිඟයේ පැහැදිලිව පෙනෙන පීඩනය අඩු කිරීම සඳහා, 2022 වසරේ මැද භාගයේ දී රජය විසින් ආදායම් පාදක රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා පියවර කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. පසුගිය මාස කිහිපය තුළ ආදායම් එකතු කිරීමේ යම් ප්‍රගතියක් දක්නට ලැබුණද, ආදායම් ක්‍රියාමාර්ග කිහිපයක ධනාත්මක ප්‍රතිඵල ළඟා කර ගැනීමට නියමිතය. අධිභාර බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවීම, මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීම, 2022 වසරේ ජූනි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්මත වැට් බදු අනුපාතය සියයට 8 සිට සියයට 12 දක්වා සහ 2022 වසරේ සැප්තැම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 15 දක්වා වැඩි කිරීම සහ විදුලි සංදේශ බද්ද සියයට 11.25 සිට සියයට 15 දක්වා වැඩි කිරීම ඇතුළු ආදායම් ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග රජය විසින් ක්‍රියාත්මක කරන ලදී. රජය විසින් 2022 වසරේ ප්‍රගතිශීලී (progressive) බදු ප්‍රතිසංස්කරණ පැකේජයක් ප්‍රකාශයට පත් කරන ලදි. (i) ආන්තික පුද්ගලික ආදායම් බදු (PIT) අනුපාත වැඩි කිරීම, ඉහළම ආන්තික අනුපාතය සියයට 36 දක්වා ඉහළ නැංවීම සහ තක්සේරු වර්ෂය සඳහා බදු නිදහස් සීමාව රු. මිලියන 1.2 ක් දක්වා අඩු කිරීම සමඟ මෙම සීමාවට වඩා වැඩිවන සෑම රු. 500,000 සඳහා බදු අනුපාතය ප්‍රතිශතාංක 6 කින් වැඩිකිරීම; (ii) ලාභාංශ හැර අනෙකුත් සියලුම ගෙවීම් සඳහා අවසානාත්මක නොවන රඳවා ගැනීමේ බදු නැවත හඳුන්වා දීම සහ ලාභාංශ සඳහා අවසානාත්මක රඳවා ගැනීමේ බද්ද හඳුන්වා දීම; (iii) සංස්ථාපිත ආදායම් බදු (CIT) අනුපාතය සියයට 30 කට ඒකාබද්ධ කරන අතරතුර සියලුම අංශ සඳහා වූ විශේෂිත සංස්ථාපිත ආදායම් බදු නිදහස් කිරීම් ඉවත් කිරීම; හා (iv) එකතු කළ අගය මත බදු ලියාපදිංචි සීමාව වසරකට රු. මිලියන 300 සිට වසරකට රු. මිලියන 80 දක්වා අඩු කිරීම මෙම පැකේජය මඟින් නිවේදනය කරන ලදී.

ඉහළ උද්ධමනය සහ රුපියලේ අගය තියුණු ලෙස අවප්‍රමාණය වීමත් සමඟ රාජ්‍ය ආදායම වූ ධනාත්මක බලපෑම් සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කළ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක් පිළිබිඹු කරමින් 2021 වසරේ පළමු මාස නවයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රජයේ ආදායම ඉහළ යන ලදී. බදු සහ බදු නොවන ආදායම් යන දෙඅංශයේම සැලකිය යුතු ඉහළ යාමේ ප්‍රතිලාභ පිළිඹිබු කරමින්, 2021 වසරේ පළමු මාස නවයේ වූ රු. බිලියන 1,050.8 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සමස්ත රාජ්‍ය ආදායම රු. බිලියන 1,448.5 දක්වා සියයට 37.9 කින් සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. මෙය, 2022 වසර සඳහා ආදායම් ඇස්තමේන්තුව වන රු. බිලියන 2,084 න් සියයට 69.5 ක ලඟා කර ගැනීමකි. 2022 පළමු මාස නවය තුළ, බදු ආදායම රු. බිලියන 1,283.4 ක් දක්වා සියයට 34.8 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, බදු නොවන ආදායම රු. බිලියන 165.1 ක් දක්වා සියයට 66.8 කින් ඉහළ යන ලදී.

ආදායම් ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ගවලට සමගාමීව ගත් අනෙකුත් ක්‍රියාමාර්ග අතර, හදිසි නොවන ප්‍රාග්ධන වියදම් සහ අතිකාල හා නව බඳවා ගැනීම් සඳහා වන පුනරාවර්තන වියදම් සීමා කිරීම සඳහා 2022 වසරේ අප්‍රේල් මස නිකුත් කළ අංක 04/2022 දරන අයවැය චක්‍රලේඛය සමඟ රජයේ වියදම් තාර්කීකරණය කිරීම අඛණ්ඩව සිදු විය. 2021 වසරේ පළමු මාස නවයේ වූ රු. බිලියන 2,380.4 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රජයේ වියදම රු. බිලියන 2,694.8 ක් දක්වා සියයට 13.2 කින් මධ්‍යස්ථව ඉහළ යන ලදී. 2021 වසරේ පළමු මාස නවයේ දී වූ රු. බිලියන 2,087.3 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ පුනරාවර්තන වියදම් රු. බිලියන 2,300.2 ක් දක්වා සියයට 10.2 කින් වැඩි විය. සමාජයේ දිළිඳු සහ අවදානමට ලක්විය හැකි කොටස් සඳහා සහන සැලසීම වෙනුවෙන් අතිරේක සුබසාධන වියදම් ක්‍රියාමාර්ග ඉහළ නැංවීම හේතුවෙන් මෙම කාල සීමාව තුළ පුනරාවර්තන වියදම් සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. මීට අමතරව, ඉහළ ගිය දේශීය පොලී අනුපාත පිළිබිඹු කරමින් පොලී වියදම් ඉහළ ගිය අතර ඉහළ උද්ධමනය සහ රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් භාණ්ඩ හා සේවා සඳහා වන වියදම් ද ඉහළ යන ලදී.

රාජ්‍ය වියදම්වල වර්ධනය අභිබවා රාජ්‍ය ආදායම් වර්ධනය වේගවත් වීම හේතුවෙන් 2021 වසරේ පළමු මාස නවය තුළ අයවැය හිඟය රු. බිලියන 1,328.2 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 1,244.4 ක් දක්වා නාමික වශයෙන් අඩු විය. ඒ අනුව, 2021 වසරේ පළමු මාස නවය තුළ ප්‍රාථමික හිඟය රු. බිලියන 495.2 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 317.0 ක් දක්වා අඩු වූ අතර, රාජ්‍ය ආදායම් වල වර්ධනය හේතුවෙන් 2022 වසරේ දී රු. බිලියන 954.0 ක් වූ ප්‍රාථමික හිඟයේ ඉලක්කය සපුරා ගැනීමට දායක වනු ඇති බවට අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, ආදායම් ප්‍රවාහයේ ලැබීම් ප්‍රමාද වීම හා 2022 වසරේ සැප්තැම්බර් මස අවසන් වන විට රු. බිලියන 219 ක් වූ හිග ගෙවීම් මෙම රාජ්‍ය මූල්‍ය ඉලක්කය සපුරා ගැනීම කෙරෙහි පීඩනයක් ඇති කරනු ඇත.

ගෝලීය මූල්‍ය වෙළෙඳපොළවලට ඇති සීමිත ප්‍රවේශය හේතුවෙන් අයවැය හිඟය පියවීමට රජයට මුලුමනින්ම දේශීය මූලාශ්‍ර මත රඳා පැවතීමට සිදුවිය. 2022 වසරේ පළමු මාස නවය තුළ අයවැය හිඟය පියවීම සඳහා ශුද්ධ දේශීය මූල්‍යනය රු. බිලියන 1,303.5 ක් වූ අතර ශුද්ධ විදේශ මූල්‍යනය රු. බිලියන 59.1 ක ණය ආපසු ගෙවීමකි.

මෙම පසුබිම තුළ, 2022 වසරේ අතුරු අයවැයෙන් ප්‍රකාශයට පත් කරන ලද පරිදි, සමාජයේ වඩාත්ම අවදානමට ලක්විය හැකි කොටස් ආරක්ෂා කරමින් සාධාරණ ලෙස ප්‍රතිලාභ සහතික කරන අතරම රාජ්‍ය මූල්‍ය හා මුදල් විනය පාදක කරගත් අපනයනාභිමුඛ විදේශ ඍජු ආයෝජන මගින් පිටිවහලක් සපයනු ලබන, ඵලදායිතාවය සහ තරඟකාරිත්වය තුළින් වර්ධනය නංවාලන සාර්ව ආර්ථික ප්‍රවේශයක් සකස් කිරීම අවශ්‍ය වේ. මීට අමතරව, තිරසාර ණය මට්ටමක් සමඟ සුදුසු ආදායම් මාර්ගයක් තුළ වියදම් කළමනාකරණය කිරීම අනාගත පරපුර සඳහා ණය බර අඩු කරනු ඇත.

තීරණාත්මක සහ ප්‍රමුඛතා ක්ෂේත්‍රවල රාජ්‍ය ආයෝජන තහවුරු කරන අතරම, වියදම් තාර්කිකරණය සමඟ ඒකාබද්ධව, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සඳහා දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති බදු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම අවශ්‍ය වේ. මීට අමතරව, රාජ්‍ය ව්‍යාපාරවල මූල්‍ය තත්ත්වය ශක්තිමත් කරන අතර එම ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් මහා භාණ්ඩාගාරය මතවන වැයබර තවදුරටත් අඩු කරනු ඇත.

## 1.2 මාධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය

පුළුල් පදනමකින් යුත් සංවර්ධන අභිමතාර්ථවලට සහය දැක්වීමට අයවැය හිඟය සහ ආශ්‍රිත ණය ක්‍රමානුකූලව අඩු කිරීම සඳහා නෛතික රාමුවක් සලසා දෙනු ලබන 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත සහ එම පනතට පසුකාලීනව කරන ලද සංශෝධන මඟින් රජයේ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් පාලනය වනු ලබයි. වඩාත්ම අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් ආරක්ෂා කරමින්, ආදායම් පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සඳහා මූලික වශයෙන් රජයේ ප්‍රධාන මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය අභිමතාර්ථ යොමු වී ඇත. 2022 වසරේ දී හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ සමඟ 2025 වසර වන විට සහ ඉන් අනතුරුව, දළ දේශීය නිෂ්පාදිතයෙන් (ද.දේ.නි.)සියයට 2.0 කට වඩා වැඩි ප්‍රාථමික අතිරික්තයක් ළඟා කර ගැනීම සඳහා ආදායම වැඩි කර ගැනීමට රජය කැපවී සිටී. මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා, 2022 වසරේ ප්‍රාථමික හිඟය ද.දේ.නි. යෙන් සියයට 4.0 ක් ලෙස ඉලක්ක කර ඇති අතර එය 2023 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 0.7 ක හිඟයක් දක්වා ඉහළ නංවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වර්තමානයේ දී පවතින අභියෝගාත්මක තත්ත්වයේ සිට යථා තත්ත්වයට පත් වීම සඳහා මධ්‍ය කාලීනව වියදම් වගකීම් සහගතව තාර්කිකරණය සහ කළමනාකරණය කර ගන්නා අතරතුර රාජ්‍ය මූල්‍ය තත්ත්වය තවදුරටත් ශක්තිමත් කළ යුතුය. ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා වඩාත් අපක්ෂපාතී සහ විනිවිදභාවයෙන් යුත් නිර්ණායක යොදා ගැනීම මඟින් කුටුම්භ වෙත ලබා දෙනු ලබන සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන තවදුරටත් විධිමත් කරනු ඇති අතර, එමඟින් ප්‍රතිලාභ ලැබිය යුතුම පුද්ගලයින්ට සැළකිය යුතු සහයෝගයක් ලබාදීමට හැකියාව ලැබෙනු ඇත. සාධාරණ හා තිරසාර ලෙස ආර්ථික වර්ධනය සිදු කිරීම සඳහා මග සකස් කර ගැනීමට වැඩි වශයෙන් රාජ්‍ය ආයෝජන යෙදවීමට හැකියාව ලබා දෙමින් මධ්‍යකලීනව රාජ්‍ය මූල්‍ය අවකාශය පුළුල් කරනු ඇත.

රාජ්‍ය මූල්‍ය ඉලක්ක අත්පත් කර ගැනීම මෙරට විසින් වසර ගණනාවක් තිස්සේ කල් දමමින් සිට ඇත. මෙය රාජ්‍ය මූල්‍ය වගකීම් පිළිබඳ නෛතික රාමුව ඵලදායී නොවීමට හේතු වී ඇත. 2023 වසරේ දී රාජ්‍ය මුදල් කළමනාකරණ පනත හඳුන්වාදීම මඟින් මෙම රාමුව ශක්තිමත් කිරීම සඳහා අනුගත වන පරිදි රාජ්‍ය මූල්‍ය රීති සැකසීමට සැලසුම් කර ඇත.

### 1.2.1 රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය

විනිවිදභාවය සහ වගවීම සඳහා රාජ්‍ය මූල්‍ය විනය ශක්තිමත් කරන අතර, රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය ළඟා කර ගැනීම සඳහා රජයේ මූල්‍ය ක්‍රමෝපාය යොමු වී ඇත. මෙම කැපවීම සාක්ෂාත් කර ගැනීම සඳහා, ආයතනික සංවර්ධනයන් සහ ඉන්ධන සහ විදුලිය සඳහා පිරිවැය නිරූපිත මිලකරණය මඟින් සහාය දෙන ආදායම් පාදක රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක් කෙරෙහි රජය මූලික වශයෙන් අවධානය යොමු කර ඇත. නිශ්චිත තෝරාගැනීමේ නිර්ණායක මත පදනම්ව අවශ්‍යම පුද්ගලයන් සුබසාධන වැඩසටහන් මඟින් ඉලක්ක කර ගනිමින්, මනාව නිර්වචනය කරන ලද සමාජ ආරක්ෂණ ජාල වැඩසටහනක් මඟින් මෙය සමන්විත වනු ඇත. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන මගින් ණය තිරසාර බව සහතික කිරීමට අපේක්ෂා කෙරේ. විනිමය අනුපාතිකයේ නම්‍යශීලීභාවය යටතේ සංචිත නැවත ගොඩනංවන අතර, මිල ස්ථායිතාව සහතික කිරීමට අපේක්ෂිතය. ආයතනික පාලනය වැඩිදියුණු කිරීම සහ දූෂණ අවදානම් අවම කරන අතරතුර ආර්ථික වර්ධනය ඉහළ නංවන ප්‍රතිසංස්කරණ සහ මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම සමඟින්, ආර්ථික වර්ධන විභවය විවර කර ගත හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2023-2027 සඳහා වන රාජ්‍ය මූල්‍ය ගමන්මග සහ සාර්ව ආර්ථික දිශානතිය පහත විස්තර කෙරේ:

**රාජ්‍ය මූල්‍ය ගමන්මග:**

- බදු පරිපාලනය ශක්තිමත් කිරීම ඇතුළු ප්‍රබල ආදායම් පාදක රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ගැලපීම් සමඟ වියදම් තාර්කිකරණය කිරීම මඟින්, 2025 වසරේ රාජ්‍ය අයවැයෙහි සියයට 2 ඉක්මවන ප්‍රමාණාත්මක ප්‍රාථමික අතිරික්තයක් මධ්‍ය කාලීනව ඇති කිරීම. 2022 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 4.0 ක අපේක්ෂිත ප්‍රාථමික හිඟය 2023 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 0.7 දක්වා වැඩි දියුණු වනු ඇති අතර, 2024 වසරේ දී සහ ඉන් පසුව ප්‍රාථමික අතිරික්තයක් අපේක්ෂා කෙරේ.

- යෝග්‍ය බදු ප්‍රතිපත්ති සහ බදු පරිපාලන ක්‍රියාමාර්ග තුළින් මධ්‍ය කාලීනව රාජ්‍ය ආදායම අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 15 දක්වා ඉහළ නැංවීම.

- සංවර්ධන කටයුතු සඳහා රාජ්‍ය මූල්‍ය අවකාශය පුළුල් කිරීම සඳහා වියදම්වල ගුණාත්මකභාවය ඉහළ නංවන අතරම වියදම් තාර්කිකරණය සහ කළමනාකරණය තුළින් පොලී නොවන පුනරාවර්තන වියදම් සීමා කිරීම.

- සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන යටතේ සමාජයේ වඩාත් අවදානමට ලක්විය හැකි කොටස් සඳහා ඔවුන්ගේ ජීවනෝපාය නඟා සිටුවීම වෙනුවෙන් අරමුදල් වෙන් කිරීම වැඩි කිරීම සහ එවැනි අරමුදල් වල ඉලක්කගත භාවය වැඩි දියුණු කිරීම.

- අනෙකුත් ක්ෂේත්‍ර අතර අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, පොදු ප්‍රවාහනය, ඩිජිටල්කරණය සහ තිරසාර බලශක්තිය වැනි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සිදු කරන ආයෝජනයන් සමග තිරසාර හා සියල්ලන්ට එක ලෙස සලකන ආර්ථික වර්ධනයක් සහතික කිරීම සඳහා රාජ්‍ය ආයෝජන නිසි ලෙස තෝරා ගැනීම හා ප්‍රමුඛතාගතකිරීම තහවුරු කිරීම.

- රජය සතු ව්‍යවසාය පාඩු ලැබීම මඟින් පැන නැගෙන රාජ්‍ය මූල්‍ය අවදානම් අවම කිරීමට මනාව කළමනාකරණය කරන ලද ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් සමග ඉන්ධන සහ විදුලිය සඳහා පිරිවැය නිරූපිත මිල යාන්ත්‍රණය අඛණ්ඩව පවත්වාගෙන යාම තුළින් බලශක්තිය, ජලය, ප්‍රවාහනය සහ ගුවන් සේවා යන අංශ ආශ්‍රිත රජය සතු ව්‍යාවසායයන් ඇතුළුව රජය සතු ව්‍යවසායන්හි මූල්‍ය ශක්‍යතාව, තරගකාරිත්වය සහ ආයතනික පාලනය වැඩිදියුණු කිරීම.

- ණය කළමනාකරණය සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීමට රාජ්‍ය ණය කළමනාකරණ නියෝජිතායතනයක් (PDMA) ස්ථාපිත කරන අතරම, ද.දේ.නි. යට සාපේක්ෂව ණය අනුපාතය අඩු කිරීමට සහ විචක්ෂණ මට්ටමින් පවත්වා ගැනීමට තිරසාර ණය කළමනාකරණ උපාය මාර්ගයක් සකස් කිරීම.

**සාර්ව ආර්ථික ගමන් මග:**

- අවශ්‍ය ව්‍යුහාත්මක ගැලපීම් සමග 2023 වසර වන විට ආර්ථිකය යථා තත්ත්වයට පත්කිරීම, 2024 වසර වන විට සියයට 3.5 ට වැඩි ආර්ථික වර්ධනයක් ළඟා කර ගන්නා අත ඉදිරි කාලය තුළ සියයට 5.0-6.0 ට වැඩි වර්ධනයක් ළඟා කර ගැනීම.
- සාධාරණ, ඉහළ, තිරසාර වර්ධනයකට ඇති බාධක ඉවත් කරමින් වර්ධනය වැඩි දියුණු කරන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.
- ශ්‍රම වෙළෙඳපොළ තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා සුදුසු ප්‍රතිසංස්කරණ මඟින් විරැකියාව සියයට 5.0 ට අඩුවෙන් පවත්වාගෙන යාම.
- මිල ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම සහ මධ්‍ය කාලීනව මධ්‍යස්ථ මූර්ත පොලී අනුපාතයක් සහතික කිරීම සඳහා තනි ඉලක්කම් උද්ධමනයක් වෙත නැවත එළැඹීම.
- වෙළෙඳපොළ පදනම් වූ රාමුවක් තුළ රුපියලේ ස්ථාවර විනිමය අගයක් පවත්වා ගැනීම සහ විදේශ සංචිත යළි ගොඩනැගීම.
- මූල්‍ය අංශයේ අධීක්ෂණය ශක්තිමත් කරමින් මධ්‍ය කාලීනව නිසි ලෙස ප්‍රාග්ධනීකරණය වූ බැංකු පද්ධතියක් සහතික කිරීම.
- ආයතනික පාලනය වැඩිදියුණු කිරීම සහ දූෂණ විරෝධී ප්‍රතිසංස්කරණ සිදු කිරීම.

ශක්තිමත් සහ තිරසර පෞද්ගලික අංශය මූලික කරගත් අපනයනාභිමුක ආයෝජනය මඟින් හසුරුවන, ආර්ථික වර්ධනය සඳහා සහායක් වීමට රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය සකස් කර ඇත. බදු අනුකූලතාවය වැඩි කිරීම, රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය සහ පාලනය වැඩි දියුණු කිරීම, බදු විගණනය සහ තාක්ෂණය මුසුකළ ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කිරීම මඟින් බදු පරිපාලනය ශක්තිමත් කරනු ඇත. මීට අමතරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS), රේගු දෙපාර්තමේන්තුවේ යෝජිත "තනි කවුළු පද්ධතිය" (Single Window), සුරා බදු දෙපාර්තමේන්තුවේ ආදායම් කළමනාකරණ පද්ධතිය සහ ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය (ITMIS) වැනි විවිධ ඩිජිටල්කරණ පද්ධති ශක්තිමත් කරනු ලැබේ.

විශේෂයෙන්ම ලංකා ඛනිජ තෙල් සංස්ථාව සහ ලංකා විදුලි බල මණ්ඩලය ඇතුළු සියළුම රජය සතු ව්‍යවසායන් මූල්‍යමය වශයෙන් ශක්‍යතා ව්‍යාපාර බවට පත් කිරීම සඳහා පුළුල් ක්‍රමෝපායක් සකස් කරනු ඇත. මීට අමතරව, මූල්‍ය විනිවිදභාවය වැඩි කිරීම සඳහා අනිවාර්ය අංගයක් ලෙස ආයතනික අභිප්‍රාය පිළිබඳ ප්‍රකාශය (SCI) හඳුන්වා දෙන අතර, වගවීම සහතික කිරීම සඳහා ප්‍රධාන කාර්යය සාධන දර්ශක (KPIS) එවැනි ආයතනවලට හඳුන්වා දෙනු ඇත.

රාජ්‍ය මූල්‍ය රීති, අයවැය සම්පාදනය, රජයේ ප්‍රසම්පාදනය සහ රාජ්‍ය ණය කළමනාකරණය යනාදී කරුණු ඇතුලත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කරනු ලැබේ. වෙළෙඳ ලිහිල්කරණය, ශ්‍රම වෙළෙඳපොළ, සෞඛ්‍ය සහ අධ්‍යාපනය ඇතුළු මානව ප්‍රාග්ධනය, ඍජු විදේශ ආයෝජන, රාජ්‍ය අංශය, රජය සතු ව්‍යවසායයන්, දේශගුණ විපර්යාස, ඩිජිටල්කරණය සහ නීතිය හා සාමය යන ක්ෂේත්‍රයන්හි වර්ධනය වැඩිකරන ව්‍යුහාත්මක, ආයතනික, නෛතික සහ පරිපාලන ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

**මධ්‍ය කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව:**

වත්මන් ආර්ථික ප්‍රවණතා ද ඇතුළත් කරමින් 2022 අතුරු අයවැය මඟින් ඉදිරිපත් කරන ලද මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව සංශෝධනය කර ඇත. මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව අනුව යමින් 2023 - 2027 සඳහා හඳුනාගත් රජයේ ප්‍රමුඛතාවයන් පහත පරිදි වේ.

- ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස ආදායම 2025 වසර වන විට සියයට 15 දක්වා වර්ධනය කර ගැනීම හා ඉන් අනතුරුව අවම වශයෙන් එම මට්ටමේ හෝ ඊට ඉහළ අගයක පවත්වා ගැනීම.

- ද.දේ.නි. යෙන් සියයට 20 ට අඩු ප්‍රතිශතයකට වියදම් තාර්කිකරණය හා සෞඛ්‍ය, අධ්‍යාපනය, පොදු ප්‍රවාහනය හා සමාජ ආරක්ෂණය වැනි ප්‍රමුඛ ක්ෂේත්‍රයන් සඳහා නිසි පරිදි වියදම් වෙන් කිරීමට තහවුරු කිරීම.

1.1 වගුව | මධ්‍ය කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව : 2022 - 2027

ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස

| දර්ශකය | 2021 තාවකාලික | 2022 සංශෝධිත ඇස්තමේන්තුව | 2023 ඇස්තමේන්තුගත | පුරෝකථන | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2024 | 2025 | 2026 | 2027 |
| **මුළු ආදායම හා ප්‍රදාන** | **8.3** | **8.8** | **11.3** | **13.5** | **15.0** | **15.1** | **15.2** |
| මුළු ආදායම | 8.2 | 8.7 | 11.3 | 13.5 | 15.0 | 15.0 | 15.1 |
| බදු ආදායම | 7.3 | 7.8 | 10.3 | 12.6 | 14.1 | 14.1 | 14.1 |
| බදු නොවන ආදායම් | 0.9 | 1.0 | 0.9 | 0.9 | 0.9 | 0.9 | 1.0 |
| ප්‍රදාන | 0.04 | 0.04 | 0.02 | 0.04 | 0.04 | 0.04 | 0.04 |
| **මුළු වියදම** | **19.9** | **18.6** | **19.2** | **19.9** | **20.0** | **19.9** | **19.9** |
| වර්තන වියදම | 15.5 | 15.2 | 15.2 | 15.3 | 15.6 | 15.4 | 15.3 |
| ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීම් | 4.4 | 3.4 | 4.0 | 4.5 | 4.5 | 4.5 | 4.5 |
| රාජ්‍ය ආයෝජන | 4.5 | 4.5 | 4.0 | 4.5 | 4.5 | 4.5 | 4.5 |
| **ආදායම් හිඟය (-)/අතිරික්තය(+)** | **-7.3** | **-6.4** | **-4.0** | **-1.8** | **-0.6** | **-0.4** | **-0.2** |
| **ප්‍රාථමික හිඟය (-)/අතිරික්තය(+)** | **-5.7** | **-4.0** | **-0.7** | **0.8** | **2.3** | **2.3** | **2.3** |
| **අයවැය හිඟය (-)/අතිරික්තය (+)** | **-11.6** | **-9.8** | **-7.9** | **-6.3** | **-5.0** | **-4.9** | **-4.7** |

මූලාශ්‍ර: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව

- ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය 2025 වසර වන විට සියයට 5 ට අඩු ප්‍රතිශතයක පවත්වා ගැනීම හා 2027 වසර වන විට එය සියයට 4.7 දක්වා තවදුරටත් අවම කිරීම.

- 2025 වසරේ දී හා ඉන් ඔබ්බට ප්‍රාථමික අතිරික්තය සියයට 2 කට වඩා වැඩි ප්‍රතිශතයක් පවත්වා ගැනීම.

- ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයේ ණය අඩුකර ගනිමින් තිරසාර මට්මක පවත්වා ගැනීම.

මධ්‍යකාලීන ඉලක්කයන් සපුරා ගැනීම, ආර්ථිකයේ සෑම ක්ෂේත්‍රයකම මේ දක්වා නොසලකා හැර තිබූ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මත රදා පවතී. රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රධාන ප්‍රතිසංස්කරණයන් දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති අතර ඉතා නුදුරේදීම ක්‍රියාත්මක කිරීමට සූදානමින් සිටියි. දැනටමත් ගෙන ඇති ආර්ථික ස්ථායීකරණ ක්‍රියාමාර්ග මඟින් ද්විපාර්ශවීය හා බහු පාර්ශවීය සංවර්ධන පාර්ශවකරුවන්ගේ විශ්වාසය වර්ධනය කර ගත හැකි අතර මූල්‍ය සහාය ලබාග ැනීමට ද උපකාරී වනු ඇත. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ සාර්ථක ප්‍රගතිය හා ණය තිරසාරභාවය තහවුරු කිරීම මඟින් අනාගත සංවර්ධන වැඩපිළිවෙල සඳහා වඩා වැඩි මුල්‍යයනයක් අපේක්ෂා කෙරේ. රාජ්‍ය මූල්‍ය, මුදල්, විදේශ හා මූල්‍ය අංශයේ සිදු කරනු ලබන ව්‍යුහාත්මක වෙනස්කම්වල ප්‍රගතිය මඟින් කෙටිකාලීනව ආර්ථික ස්ථායීතාවය වර්ධනය කරගත හැකි අතර එමඟින් මධ්‍යකාලීනව හා දිගුකාලීනව ඉහළ වර්ධනයක් අපේක්ෂාවන් ළඟා කර ගැනීමට හැකි වනු ඇත.

# II කොටස

**අයවැය, ආර්ථික හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2023**

**2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 7, 8 සහ 9**
**වගන්ති යටතේ ගරු මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී.**

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 7, 8 සහ 9 වගන්ති අනුව රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයට සාපේක්ෂව රාජ්‍ය මූල්‍ය කටයුතු ඇගයීම සඳහා අයවැය, ආර්ථික හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව නිකුත් කළ යුතු අතර එය විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දී දෙවන වර කියවන දිනයේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. දළ දේශීය නිෂ්පාදිතය, පාරිභෝගික මිල ගණන් සහ ගෙවුම් ශේෂය සඳහා අදාළ වන ඇස්තමේන්තු සහ ආදායම් සහ වියදම් ඇස්තමේන්තු කිරීම සඳහා පදනම් වූ උපකල්පන ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

ඒ අනුව, 2022 වසරේ පළමු මාස නවය තුළ රජයේ ආදායම, වියදම සහ ණය ගැනීම පිළිබඳ තාවකාලික දත්ත මෙම වාර්තාවේ ඇතුළත් වේ. රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම් සිදුකරනු ලැබ ඇති සමස්ත ආර්ථික තත්ත්වය පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීමට හැකිවන පරිදි මෙම කාලපරිච්ඡේදයට අදාළ ප්‍රධාන සාර්ව ආර්ථික උපනතීන් මෙහි වාර්තාවේ ඇතුළත් වේ. 2023 වසර සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේ දී පදනම් කර ගත් ආර්ථික සහ අනෙකුත් උපකල්පන පිළිබඳ තොරතුරු, මෙම උපකල්පනවලට අදාළ විය හැකි අවදානම් සාධක සහ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි අනෙකුත් තොරතුරු ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

# රාජ්‍ය මූල්‍ය උපනතීන්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ විදේශ මූල්‍යයනය

# 01

## 1.1 සමාලෝචනය

පුනරාවර්තන වියදමෙන් අඩක් පමණක් රාජ්‍ය ආදායමෙන් ආවරණය කරමින් ආදායම අභිබවා වියදම ඉහළ යාම, පාලනය කළ නොහැකි පුනරාවර්තන වියදම්, රාජ්‍ය වියදම්වල කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය පිළිබඳව පවතින ගැටළු වැනි ව්‍යුහාත්මක දුර්වලතාවලින් රාජ්‍ය මූල්‍ය අංශය පීඩාවට පත්වීමේ හේතුවෙන් බදු අනුපාත වැඩි කිරීම, බදු පදනම පුළුල් කිරීම, බදු අනුකූලතාවය වැඩි කිරීම සහ බදු පරිපාලනය වැඩිදියුණු කිරීමෙන් ආදායම් බදු සහ එකතු කළ අගය මත බදු ශක්තිමත් කිරීම තුළින් ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක් ඇති කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී.

2022 වසරේ මුල් මාස නවයෙහි ආදායම් කාර්යසාධනයෙන් පිළිඹිබු වන පරිදි, 2022 වසරේ රාජ්‍ය ආදායම ඉහළ නැංවීමට සාර්ථක, නිවැරදි ක්‍රියාමාර්ග රජය විසින් ගෙන ඇත. වියදම් පාලනය කිරීම සඳහා 2022 වසරේ අප්‍රේල් සහ අගෝස්තු මාසවල නිකුත් කළ වියදම් චක්‍රලේඛවල ප්‍රතිලාභ ලබමින් මුළු රාජ්‍ය වියදම 2022 වසරේ පළමු මාස නවය තුළ මධ්‍යස්ථව ඉහළ යාමට පිටිවහල් විය. කෙසේ වෙතත්, විදේශ මූල්‍යායනය සඳහා ඇති සීමිත ප්‍රවේශය හේතුවෙන් අයවැය හිඟය මූල්‍යායනය අභියෝගාත්මක වී ඇති බැවින්, විශේෂයෙන් මහ බැංකුවේ මූල්‍යායනය ද ඇතුළු පිරිවැය අධික දේශීය මූලාශ්‍ර හරහා ශුද්ධ පදනම මත සමස්ත මූල්‍යායනය සපුරාගෙන ඇත. මෙම පසුබිම තුළ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ මූල්‍ය පහසුකම යටතේ මූල්‍යායනය ලබා ගැනීමට රජය විසින් අවශ්‍ය පියවර ගෙන ඇති අතර, ක්ෂණිකව ඇතිවිය හැකි රාජ්‍ය මූල්‍ය පීඩන තත්ත්වයන්ගෙන් මිදීම සඳහා විකල්ප මූල්‍යායන පහසුකම් පිළිබඳව ද අවධානය යොමු කර ඇත. මීට අමතරව, රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් ශක්තිමත් කිරීම සඳහා කෙටි කාලීන සහ මධ්‍යකාලීන වශයෙන් ආදායම වර්ධනය කිරීම, වියදම් තාර්කිකරණය සහ රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීම ද ඇතුළුව ප්‍රධාන ප්‍රතිසංස්කරණ රැසක් රජය විසින් හඳුන්වා දෙනු ඇත.

බදු සහ බදු නොවන ආදායම සැළකිය යුතු ලෙස ඉහළ යාම හේතුවෙන්, සමස්ත රාජ්‍ය ආදායම 2021 වසරේ පළමු මාස නවය තුළ වාර්තා කළ රු. බිලියන 1,050.8 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 1,448.5 ක් දක්වා සියයට 37.9 කින් වර්ධනය වී ඇත. වාර්ෂික ඇස්තමේන්තුව වූ රු. බිලියන 2,084.0 ට සාපේක්ෂව 2022 වසරේ පළමු මාස නවය තුළ සමස්ත රාජ්‍ය ආදායමෙන් සියයට 69.5 ක් ළඟා කර ගෙන ඇත.

ප්‍රධාන වශයෙන්, එක් වරක් පමණක් අය කරනු ලබන අධිභාර බද්දේ ලැබීම් හේතුවෙන් බදු ආදායම රු. බිලියන 1,283.4 ක් දක්වා සියයට 34.8 කින් වර්ධනය විය. ආදායම් බද්ද රු. බිලියන 431.8 ක් දක්වා සියයට 106.1 කින් ද, එකතු කළ අගය මත බද්ද රු. බිලියන 310.5 ක් දක්වා සියයට 38.6 කින් ද, සුරාබද්ද හා දුම්වැටි මත නිෂ්පාදන බද්ද රු. බිලියන 207.2 ක් දක්වා සියයට 32.4 කින් ද, වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද රු. බිලියන 135.4 ක් දක්වා සියයට 18.7 කින් ද, ආදී වශයෙන් බදු ආදායම සැළකිය යුතු ලෙස වර්ධනය වීම, සමස්ත රාජ්‍ය ආදායම ඉහළ නැංවීමට හේතු විය. ඒ අයුරින්ම, විකුණුම් හා ගාස්තු සහ මහ බැංකු ලාභ පැවරුම් වැඩිවීම පිළිබිඹු කරමින් 2022 වසරේ පළමු මාස නවය තුළ බදු නොවන ආදායම ද රු. බිලියන 165.1 ක් දක්වා සියයට 66.8 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය.

දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු වලින් උපයාගත් ආදායම, 2021 වසරේ පළමු මාස නවය තුළ වාර්තා කළ රු. බිලියන 290.5 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 401.0 ක් දක්වා සියයට 38.1 කින් වර්ධනය වී ඇත. දේශීය ක්‍රියාකාරකම් මත එකතු කළ අගය මත බද්ද රු. බිලියන 193.8 ක් දක්වා සියයට 44.7 කින් වර්ධනය වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, 2022 වසරේ අයවැය මගින් හඳුන්වා දුන් සුරාබදු අනුපාත ඉහළ නැංවීම සහ 2022 වසරේ ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි ආරක්ෂිත සළකුණු හා ආරක්ෂිත සළකුණු කළමනාකරණ පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම හේතුවෙන් සුරාබදු ආදායම ද රු. බිලියන 124.6 ක් දක්වා සියයට 32.2 කින් වර්ධනය විය. 2021 නොවැම්බර් මාසයේ දී දුම්වැටි සඳහා වූ නිෂ්පාදන බද්ද සංශෝධනය කිරීම හේතුවෙන් දුම්වැටි මගින් ලද නිෂ්පාදන බදු ආදායම 2022 පළමු මාස නවය තුළ රු. බිලියන 82.6 ක් දක්වා සියයට 32.6 කින් වර්ධනය විය.

රේගු ආනයන බද්දෙන් හා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් එකතු වූ බදු ආදායමේ පසුබැස්ම මධ්‍යයේ වුව ද, ආනයන මත පදනම් වූ එකතු කළ අගය මත බද්ද රු. බිලියන 116.7 ක් දක්වා සියයට 29.5 කින් ද, වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද රු. බිලියන 135.4 ක් දක්වා සියයට 18.7 කින් ද, වර්ධනය වීම හේතුවෙන්, ආනයනය මත පදනම් වූ බදුවලින් ලද ආදායම, 2021 වසරේ පළමු මාස නවය තුළ වාර්තා කළ රු. බිලියන 411.9 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 425.6 ක් දක්වා සියයට 3.3 කින් මද වශයෙන් වර්ධනය විය. විදේශ විනිමය අර්බුදයට ප්‍රතිචාර වශයෙන් රජය විසින් පනවා ඇති ආනයන සීමා හේතුවෙන් රේගු ආනයන බදු ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 36.6 ක් දක්වා සියයට 29.4 කින් සැළකිය යුතු ලෙස පහත වැටුණි. දේශීය මිල ගණන් ස්ථාවර කිරීම තුළින් පහසුකම් සැපයීම පිණිස තෝරාගත් භාණ්ඩවල විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනුපාතයන් අඩු වන ලෙස සංශෝධනය කිරීම හේතුවෙන් 2022 වසරේ පළමු මාස නවය තුළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් එකතු වූ ආදායම ද රු. බිලියන 29.2 ක් දක්වා සියයට 30.5 කින් සැළකිය යුතු ලෙස පහත වැටුණි. 2022 වසරේ පළමු මාස නවය තුළ සෙස් (භාණ්ඩ අපනයන සහනාධාර යෝජනා ක්‍රමය) බද්දෙන් එකතු වූ ආදායම ද රු. බිලියන 52.8 ක් දක්වා සියයට 6.5 කින් ආන්තික වශයෙන් පහත වැටුණි.

2022 පළමු මාස නවය තුළ විකුණුම් සහ ගාස්තු සියයට 214.6 කින් ද, මහ බැංකුවේ ලාභ පැවරුම් සියයට 99.9 කින් ද, කුලී ආදායම සියයට 38.6 කින් ද, රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් ලද ලාභ හා ලාභාංශ සියයට 17.0 කින් ද ඉහළ යාම හේතුවෙන් බදු නොවන ආදායම රු. බිලියන 165.1 ක් දක්වා සියයට 66.8 කින් වර්ධනය විය.

අනෙකුත් බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සමඟම බදු පැහැර හැරීම අවම කර ගනිමින් බදු අනුකූලතාවය ඉහළ නැංවීම සඳහා බදු පරිපාලනය ශක්තිමත් කිරීමට ක්‍රියාමාර්ග කිහිපයක් අනුගමනය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වැඩිදියුණු කරන ලද ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS), ශ්‍රී ලංකා රේගුවේ "තනි කවුළු" පද්ධතිය (Single Window) සහ මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) මඟින් රාජ්‍ය සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම, රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය විනය වැඩිදියුණු කිරීමේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයන් රාජ්‍ය මුදල් කෙරෙහි වන පීඩනය අඩු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. රාජ්‍ය ව්‍යවසායයන් 36 ක් රු. බිලියන 17.8 ක පමණ අයබදු හා ලාභාංශ ගෙවීම මඟින් බදු නොවන ආදායම වර්ධනය කර ගැනීමට දායක වූ අතර, 2022 වසරේ පළමු මාස අට තුළ රාජ්‍ය ව්‍යවසායයන් 31 ක් රු. බිලියන 134.9 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත.

රාජ්‍ය වියදම, 2021 වසරේ පළමු මාස නවය තුළ වාර්තා කළ රු. බිලියන 2,380.4 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 2,694.8 ක් දක්වා සියයට 13.2 කින් මධ්‍යස්ථ ලෙස වර්ධනය වී ඇත. එම කාලපරිච්ඡේදය තුළ පුනරාවර්තන වියදම රු. බිලියන 2,300.2 ක් දක්වා සියයට 10.2 කින් ඉහළ ගොස් ඇත. රු. බිලියන 927.4 ක් දක්වා සියයට 11.3 කින් වර්ධනය වූ පොලී ගෙවීම් හා රු. බිලියන 714.3 ක් දක්වා සියයට 12.5 කින් වර්ධනය වූ වැටුප් හා වේතන මෙම ඉහළ යාමට හේතු වී ඇත. 2022 වසරේ පළමු මාස නවය තුළ ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් රු. බිලියන 394.6 ක් දක්වා සියයට 34.6 කින් වර්ධනය වී ඇත. විශේෂයෙන්ම අධිවේගී මාර්ග, ජල සම්පාදන, වාරිමාර්ග සහ ප්‍රවාහන වැනි ප්‍රමුඛතා ක්ෂේත්‍රවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ වියදම් හේතුවෙන් රාජ්‍ය ආයෝජන රු. බිලියන 417.5 ක් දක්වා සියයට 36.8 කින් එම කාලසීමාව තුළ ඉහළ ගොස් ඇත.

ජංගම ගිණුමේ හිඟය, 2021 වසරේ පළමු මාස නවය තුළ වාර්තා කළ රු. බිලියන 1,036.6 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 851.7 ක් දක්වා වාර්තාගත ලෙස අඩු වී ඇත. සමස්ත අයවැය හිඟය, 2021 වසරේ පළමු මාස නවය තුළ වාර්තා කළ රු. බිලියන 1,328.2 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 1,244.4 ක් දක්වා අඩු වී ඇත. ප්‍රාථමික ශේෂය, 2021 වසරේ දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.) ප්‍රතිශතයක් ලෙස වාර්තා කළ සියයට 5.7 ට සාපේක්ෂව 2022 වසරේ ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 4.0 ක පවත්වා ගැනීමට ඇස්තමේන්තු කර ඇත.

**වගුව 1.1 : රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සාරාංශය**

රු. මිලියන

| අයිතමය | ජන.-සැප්. 2021 | ජන.-සැප්. 2022 (e) |
|---|---|---|
| **ආදායම් හා ප්‍රදාන** | **1,052,175** | **1,450,381** |
| **ආදායම** | **1,050,758** | **1,448,482** |
| බදු | 951,751 | 1,283,368 |
| බදු නොවන | 99,007 | 165,114 |
| ප්‍රදාන | 1,417 | 1,899 |
| **වියදම්** | **2,380,412** | **2,694,788** |
| **පුනරාවර්තන** | **2,087,309** | **2,300,171** |
| වැටුප් | 634,746 | 714,280 |
| පොලී ගෙවීම් | 832,992 | 927,366 |
| අනෙකුත් | 619,572 | 658,525 |
| රාජ්‍ය ආයෝජන | 305,171 | 417,527 |
| අනෙකුත් | -12,069 | -22,910 |
| **ආදායම් හිඟය (-)/අතිරික්තය (+)** | **-1,036,552** | **-851,689** |
| **සමස්ත අයවැය හිඟය (-)/අතිරික්තය (+)** | **-1,328,237** | **-1,244,407** |
| **මූල්‍යයනය** | **1,328,237** | **1,244,407** |
| විදේශ මූල්‍යයනය (ශුද්ධ) | -124,745 | -59,125 |
| දේශීය මූල්‍යයනය (ශුද්ධ) | 1,452,981 | 1,303,531 |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(e) තාවකාලික

## වගුව 1.2 : ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම සහ වියදම - 2022

රු. බිලියන

| අයිතමය | වාර්ෂික ඇස්තමේන්තුව | ජන.-සැප්. තත්‍ය[(අ)] | වෙනස |
|---|---|---|---|
| මුළු ආදායම | **2,084.0** | **1,448.5** | **-635.5** |
| බදු ආදායම | **1,852.0** | **1,283.4** | **-568.6** |
| දේශීය ආදායම් දෙපාර්මේන්තුව | | | |
| ආදායම් සහ ලාභ මත බද්ද | 558.0 | 431.8 | -126.2 |
| එකතු කල අගය මත බද්ද - දේශීය (ශුද්ධ) | 317.0 | 193.8 | -123.2 |
| අනෙකුත් | 40.0 | 7.6 | -32.4 |
| උප එකතුව | **915.0** | **633.2** | **-281.8** |
| ශ්‍රී ලංකා රේගු දෙපාර්මේන්තුව | | | |
| ආනයන බද්ද | 42.0 | 36.6 | -5.4 |
| එකතු කල අගය මත බද්ද - ආනයන (ශුද්ධ) | 216.0 | 116.7 | -99.3 |
| වරාය සහ ගුවන් තොටුපොල සංවර්ධන බද්ද | 177.0 | 135.4 | -41.6 |
| සෙස් බද්ද | 68.0 | 52.8 | -15.3 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 35.1 | 29.4 | -5.7 |
| නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද | 189.0 | 137.5 | -51.5 |
| දුම්වැටි | 110.0 | 82.6 | -27.4 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 55.0 | 36.7 | -18.4 |
| මෝටර් වාහන සහ අනෙකුත් | 24 .0 | 18.2 | -5.8 |
| උප එකතුව | **727.1** | **508.4** | **-218.8** |
| සුරාබදු දෙපාර්තමේන්තුව | | | |
| මත්පැන්/දුම්කොළ | 185.0 | 124.6 | -60.4 |
| උප එකතුව | **185.0** | **124.6** | **-60.4** |
| අනෙකුත් | | | |
| විදුලි සංදේශ බද්ද | 16.0 | 10.7 | -5.3 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 8.8 | 6.5 | -2.3 |
| උප එකතුව | **24.8** | **17.2** | **-7.6** |
| බදු නොවන ආදායම | **232.0** | **165.1** | **-66.9** |
| මුළු වියදම | **4,427.4** | **2,694.8** | **-1,732.6** |
| වර්තන වියදම | **3,620.0** | **2,300.2** | **-1,319.8** |
| වැටුප් හා වේතන | 994.5 | 714.3 | -280.2 |
| පොලී ගෙවීම | 1,379.4 | 927.4 | -452.0 |
| විශ්‍රාම වැටුප් ගෙවීම | 318.0 | 228.6 | -89.4 |
| රාජ්‍ය සංස්ථා සහ ආයතනවලට පැවරුම් | 121.3 | 71.9 | -49.4 |
| අනෙකුත් | 806.9 | 358.0 | -448.9 |
| ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය | **807.4** | **394.6** | **-412.8** |

මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

## 1.2 රජයේ ආදායම

රජයේ සමස්ත ආදායම 2021 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 1,050.8 ට සාපේක්ෂව, 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,448.5 ක් දක්වා සියයට 37.9 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. 2022 වසරේ පළමු මාස නවය තුළ රැස් කරන ලද ආදායම, සංශෝධිත ආදායම ඇස්තමේන්තුවෙන් සියයට 69.5 ක ළඟා කර ගැනීමකි.

මෙලෙස ආදායම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, බදු ආදායම 2021 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 951.8 ට සාපේක්ෂව, 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,283.4 දක්වා සියයට 34.8 කින් වැඩි වීමයි.

**රූපසටහන 1.1 : මුළු ආදායම් සංයුතිය 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා**




මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

බදු ආදායම, සමස්ත ආදායම සඳහා සියයට 88.6 ක දායකත්වයක් දැක්වූ අතර 2022 වසර සඳහා සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 69.3 ක ළඟා කර ගැනීමකි.

බදු ආදායම, 2021 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 209.5 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 431.8 දක්වා සියයට 106.1 කින් වැඩි විය. තාවකාලික පියවරක් ලෙස ආදායම වැඩි කිරීම සඳහා එක් වරක් අය කරනු ලබන බද්දක් ලෙස, 2020/21 තක්සේරු වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම රු. මිලියන 2,000 ඉක්මවන ලද පුද්ගලයන්ගෙන් සහ සමාගම් වලින් අය කරන ලද සියයට 25 ක් වූ අධිභාර බද්දෙන් ලැබූ රු. බිලියන 120.7 මේ සඳහා සැළකිය යුතු ලෙස හේතු විය. මෙයට අමතරව, පුද්ගල හා සංස්ථාපිත බදු වලින් එකතු කරන ලද ආදායම පිළිවෙළින් සියයට 16.4 කින් සහ සියයට 46.1 කින් වර්ධනය විය.

**රූපසටහන 1.2 : මූලාශ්‍ර අනුව මුළු බදු ආදායම 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා**




මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**වගුව 1.3 : රාජ්‍ය ආදායම් කාර්ය සාධනයේ සංක්ෂිප්තය**

රු. මිලියන

| අයිතමය | ජන.-සැප්. | | වෙනස (%) |
|---|---|---|---|
| | 2021 | 2022 [e] | |
| **බදු ආදායම** | **951,751** | **1,283,368** | **34.8** |
| **ආදායම් බදු** | **209,485** | **431,795** | **106.1** |
| **දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු** | **290,476** | **401,018** | **38.1** |
| එකතු කල අගය මත බද්ද (වැට්) | 133,956 | 193,829 | 44.7 |
| නිෂ්පාදන බද්ද | 156,520 | 207,189 | 32.4 |
| **ආනයන මත පදනම් වූ බදු** | **411,934** | **425,604** | **3.3** |
| රේගු ආනයන බද්ද | 51,812 | 36,587 | -29.4 |
| එකතු කල අගය මත බද්ද (වැට්) | 90,102 | 116,686 | 29.5 |
| වරාය සහ ගුවන් තොටුපොල සංවර්ධන බද්ද | 114,135 | 135,434 | 18.7 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 42,084 | 29,232 | -30.5 |
| නිෂ්පාදන බද්ද | 57,405 | 54,914 | -4.3 |
| සෙස් බද්ද | 56,395 | 52,751 | -6.5 |
| **බලපත්‍ර ගාස්තු සහ අනෙකුත්** | **39,856** | **24,952** | **-37.4** |
| **බදුනොවන ආදායම** | **99,007** | **165,114** | **66.8** |
| **මුළු බදු ආදායම** | **1,050,758** | **1,448,482** | **37.9** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
[e] තාවකාලික

තවද, එකතු කළ අගය මත බද්ද, සුරා බද්ද, දුම්වැටි මත නිෂ්පාදන බද්ද සහ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද යන බදුවලින් ලද ආදායම පිළිවෙළින් සියයට 38.6 කින්, සියයට 32.2 කින්, සියයට 32.6 කින් සහ සියයට 18.7 කින් වැඩි විය.

සමස්ත ආදායමට සියයට 11.4 ක දායකත්වයක් ලබා දෙමින්, බදු නොවන ආදායම, 2021 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 99.0 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 165 .1 ක් දක්වා සියයට 66.8 කින් වැඩි විය. මෙය 2022 වසර සඳහා සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 71.2 ක ළඟා කර ගැනීමකි.

විකුණුම් හා ගාස්තු වලින් ලද ආදායම, 2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 56.8 ක් දක්වා සියයට 214.6 කින් සැළකිය යුතු ලෙස වැඩි වුණු අතර, මහ බැංකුවේ ලාභ පැවරුම්වලින් ලද ආදායම රු. බිලියන 30.0 ක් විය. කුලී ආදායම සියයට 38.6 කින් රු. බිලියන 4.7 දක්වා ද, ලාභ හා ලාභාංශ මගින් ලද ආදායම සියයට 17.0 කින් රු. බිලියන 18.9 දක්වා ද, සමාජ ආරක්ෂණ දායකත්වයන් මගින් ලද ආදායම සියයට 9.6 කින් රු. බිලියන 27.7 දක්වා ද, පොලී ආදායම සියයට 7.6 කින් රු. බිලියන 4.6 දක්වා ද, වෙනත් බදු නොවන ආදායම් මාර්ගවලින් ලද ආදායම සියයට 33.0 කින් රු. බිලියන 22.4 දක්වා ද වශයෙන් අනෙකුත් බදු නොවන ආදායම් මාර්ගවලින් ලද ආදායම ද වැඩි විය.

## ආදායම් බද්ද

ප්‍රධාන වශයෙන් අධිහාර බදු සහ සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන බදු ආදායම සමගින් ඉහළ ගිය ආදායම් බදු ආදායම 2021 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 209.5 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 431.8 ක් දක්වා සියයට 106.1 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන බදු ආදායම 2021 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 190.1 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 273.4 ක් දක්වා සියයට 43.8 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ. මේ අතර, එක් වරක් පමණක් අය කරන බද්දක් ලෙස අප්‍රේල් සහ ජූලි මාසවල ලැබුණු වාරික දෙක සමගින් අධිහාර බදු ආදායම 2022 වසරේ මුල් මාස නවය තුළ රු. බිලියන 120.7 ක් ලෙස වාර්තා විය. ප්‍රාග්ධන ලාභ බද්දෙන් ලද ආදායම 2021 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. මිලියන 461 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 1.3 ක් දක්වා සියයට 186.9 කින් වර්ධනය විය. එසේම, 2022 වසරේ පළමු මාස නවය තුළ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දෙන් (APIT)/උපයන විට ගෙවන බද්දෙන් (PAYE) ලද ආදායම රු. බිලියන 17.9 ක් දක්වා සියයට 70.2 කින් සහ පොලී මත රඳවා ගැනීමේ බද්ද රු. බිලියන 14.3 ක් දක්වා සියයට 85.8 කින් වැඩි වී ඇත. මීට අමතරව, ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්දෙන් (VDT) එකතු කරන ලද ආදායම රු. බිලියන 4.0 කි.

## එකතු කළ අගය මත බද්ද

එකතු කළ අගය මත බද්දෙන් ලද රජයේ ආදායම 2021 වසරේ පළමු මාස නවය තුළ දී රු. බිලියන 224.1 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 310.5 ක් දක්වා සියයට 38.6 කින් සැළකිය යුතු ලෙස වැඩි වූ අතර, එය 2022 වසර සඳහා ඇස්තමේන්තු කළ එකතු කළ අගය මත බදු ආදායමෙන් සියයට 58.3 කි. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සහ ආනයන යන දෙඅංශයෙන්ම 2022 වසරේ පළමු මාස නවය තුළ එකතු කළ අගය මත ලද බදු ආදායම ඉහළ යන ලදී. දේශීය ක්‍රියාකාරකම් මගින් ලද එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 134.0 සිට රු. බිලියන 193.8 ක් දක්වා සියයට 44.7 කින් ඉහළ ගිය අතර, ආනයන මගින් ලද එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 90.1 සිට රු. බිලියන 116.7 ක් දක්වා සියයට 29.5 කින් වැඩි විය. එකතු කළ අගය මත බදු ආදායමේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් බදු අනුපාත වැඩිවීම් සහ උද්ධමනයේ තීව්‍ර වැඩිවීම හේතුවෙන් පැන නැගි බහුවිධ බලපෑම්: එකතු කළ අගය මත බදු අනුපාතය 2022 වසරේ ජූනි 01 සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 8 සිට සියයට 12 දක්වා වැඩි වීම, නැවතත්, 2022 සැප්තැම්බර් 01 සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 12 සිට සියයට 15 දක්වා වැඩි වීම සහ 2022 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි වීම.

**වගුව 1.4 : එකතු කළ අගය මත බදු කාර්යසාධනය**

රු. මිලියන

| බදු පදනම | ජන.-සැප්. 2021 | ජන.-සැප්. 2022 (e) | වර්ධනය (%) |
|---|---|---|---|
| දේශීය | 133,697 | 193,893 | 45.0 |
| ආනයන | 90,384 | 116,943 | 29.4 |
| **දළ ආදායම** | **224,082** | **310,836** | **38.7** |
| ආපසු ගෙවුම් | 24 | 320 | 1,233.3 |
| **ශුද්ධ ආදායම** | **224,058** | **310,516** | **38.6** |
| ආපසු ගෙවුම් දළ ආදායමේ % ලෙස | 0.01 | 0.10 | - |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(e) තාවකාලික

## නිෂ්පාදන/සුරා බද්ද

ප්‍රධාන වශයෙන් බදු පරිපාලනයේ වැඩිදියුණු කිරීමත් සමඟ 2021 වසරේ නොවැම්බර් මාසයේ දී බදු අනුපාත සංශෝධනය කිරීම හේතුවෙන්, මත්පැන් සහ දුම්වැටිවලින් ලැබුණු ආදායම වැඩිවීමත් සමඟ නිෂ්පාදන/ සුරා බද්දෙන්

**වගුව 1.5 : නිෂ්පාදන බදු/සුරාබදු කාර්යසාධනය**

රු. මිලියන

| බදු පදනම | ජන.-සැප්. 2021 | ජන.-සැප්. 2022[අ] | වර්ධනය (%) |
|---|---|---|---|
| මත්පැන් | 94,219 | 124,558 | 32.2 |
| දුම්වැටි/දුම්කොළ | 62,301 | 82,630 | 32.6 |
| මෝටර් වාහන | 13,225 | 13,672 | 3.4 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 39,616 | 36,665 | -7.5 |
| අනෙකුත් | 4,564 | 4,577 | 0.3 |
| **එකතුව** | **213,925** | **262,103** | **22.5** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
[අ] තාවකාලික

**රූපසටහන 1.3 : නිෂ්පාදන බදු / සුරාබදු කාර්යසාධනය 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා**




මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

උපයාගත් මුළු ආදායම 2021 පළමු මාස නවයේ දී වූ රු. බිලියන 213.9 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 262.1 ක් දක්වා සියයට 22.5 කින් වර්ධනය විය. නිෂ්පාදන/සුරාබදු ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 70.1 ක් ළඟා කරගනිමින් 2022 වසරේ පළමු මාස නවයේ දී, සමස්ත බදු ආදායමට සියයට 20.4 ක දායකත්වයක් ලබා දී ඇත.

මත්පැන් මත සුරා බද්දෙන් ලද ආදායම 2021 වසරේ පළමු මාස නවයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 94.2 සිට රු. බිලියන 124.6 ක් දක්වා සියයට 32.2 කින් වර්ධනය විය. 2022 වසරේ ජනවාරි 03 දින සිට මත්පැන් සහ මත්පැන් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ආරක්ෂක සළකුණු සහ ආරක්ෂක සළකුණු කළමනාකරණ පද්ධතිය හඳුන්වාදීමත් සමඟ 2021 වසරේ නොවැම්බර් මස 12 දින සිට මත්පැන් මත නිෂ්පාදන බද්ද ඉහළ නැංවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. 2022 වසරේ පළමු මාස නවයේ දී, මත්පැන් මත සුරාබදු ආදායම 2022 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 67.3 ක් ළඟා කර ගෙන ඇත. මෝටර් රථ සඳහා නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2021 වසරේ පළමු මාස නවයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 13.2 සිට රු. බිලියන 13.7 ක් දක්වා සියයට 3.4 කින් ආංශිකව වර්ධනය විය. 2021 වසරේ නොවැම්බර් මස 12 වැනි දින සිට සිගරට් මත නිෂ්පාදන බද්ද ඉහළ නැංවීම හේතුවෙන්, සිගරට් මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2021 වසරේ පළමු මාස නවයේ වූ රු. බිලියන 62.3 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 82.6 ක් දක්වා සියයට 32.6 කින් වර්ධනය විය. අනෙක් අතට, දුම්වැටි අලෙවිය 2021 වසරේ පළමු මාස නවයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දුම්වැටි මිලියන 1,694 සිට දුම්වැටි මිලියන 2,204 ක් දක්වා සියයට 30.1 කින් වර්ධනය විය.

කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් ඉන්ධන ආනයනය පහත වැටීම හේතුවෙන්, ඛනිජ තෙල් නිෂ්පාදනවලින් ලද නිෂ්පාදන බදු ආදායම 2021 වසරේ පළමු මාස නවයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 39.6 සිට රු. බිලියන 36.7 ක් දක්වා සියයට 7.5 කින් ආංශිකව පහත වැටුණි. තවද, පැණි බීම වර්ග, ශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර වැනි අනෙකුත් නිෂ්පාදන මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2022 වසරේ පළමු මාස නමයේ දී රු. බිලියන 4.6 ක් දක්වා සියයට 0.3 කින් සුළු වශයෙන් වර්ධනය විය.

## රේගු ආනයන බද්ද

රේගු ආනයන බද්දෙන් ලද ආදායම 2021 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 51.8 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 36.6 ක් දක්වා සියයට 29.4 කින් අඩු විය. මෙම අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ බදු අනුපාත ඉහළ නැංවීමේ ධනාත්මක බලපෑම් අභිභවමින් තෝරාගත් භාණ්ඩ සඳහා ආනයන සීමාකිරීම සහ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ සඳහා බලපත්‍ර ක්‍රමය හඳුන්වාදීම මෙන්ම සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ විදේශ විනිමය ගලායාම කළමනාකරණය කිරීම සඳහා අධිභාර පැනවීමයි.

## විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද

විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම 2021 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 42.1 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 29.2 ක් දක්වා සියයට 30.5 කින් සැළකියයුතු ලෙස අඩු විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආනයන පහත වැටීම සහ ආනයනය අධෛර්යමත් කිරීම සඳහා ඇපල්, මිදි සහ දොඩම් වැනි ද්‍රව්‍යවල විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනුපාත ඉහළ නැංවීමයි.

**වගුව 1.6 : මෝටර් රථ වාහන ආනයන සහ නව ලියාපදිංචි කිරීම්**

(සංඛ්‍යාව)

| අයිතමය | ආනයන ජන.-අගෝ. 2021 | 2022 | වෙනස | % | නව ලියාපදිංචි කිරීම් (අ) ජන.-අගෝ. 2021 | 2022 | වෙනස | % |
|---|---|---|---|---|---|---|---|---|
| මෝටර් රථ | 1,916 | 123 | -1,793 | -94 | 2,626 | 964 | -1,662 | -63 |
| බස් රථ | 48 | 37 | -11 | -23 | 232 | 253 | 21 | 9 |
| ත්‍රිරෝද රථ | 2,003 | 223 | -1,780 | -89 | 2,076 | 19 | -2,057 | -99 |
| යතුරු පැදි | 1,335 | 10,017 | 8,682 | 650 | 5,662 | 6,209 | 547 | 10 |
| භාණ්ඩ ප්‍රවාහන රථ (ආ) | 1,880 | 288 | -1,592 | -85 | 2,759 | 1,537 | -1,222 | -44 |
| ඉඩම් වාහන (ඇ) | 9,131 | 3,398 | -5,733 | -63 | 8,846 | 5,406 | -3,440 | -39 |
| අනෙකුත් (ඈ) | 7 | - | -7 | -100 | 578 | 621 | 43 | 7 |
| **එකතුව** | **16,320** | **14,086** | **-2,234** | **-14** | **22,779** | **15,009** | **-7,770** | **-34** |

මූලාශ්‍ර : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික
(ආ) ලොරි රථ, වෙනත් භාණ්ඩ ප්‍රවාහන වාහන සහ විශේෂිත වාහන
(ඇ) ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර් සහ ට්‍රේලර් ඇතුළුව
(ඈ) ද්විත්ව කාර්ය වාහන, ක්වාඩ්‍රි සයිකල (Quadricycle) සහ මෝටර් නිවාස ඇතුලත් වේ.

## වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද

වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් ලද ආදායම 2021 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 114.1 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 135.4 ක් දක්වා සියයට 18.7 කින් මධ්‍යස්ථව වැඩි විය. ඛනිජ තෙල් නිෂ්පාදන, සිමෙන්ති ක්ලින්කර්, වානේ, අමුද්‍රව්‍ය සහ අනෙකුත් පරිභෝජන ද්‍රව්‍යවල ජාත්‍යන්තර මිල ගණන් ඉහළ යාමත් සමඟ රුපියල විශාල වශයෙන් අවප්‍රමාණය වීමේ බලපෑම මීට ප්‍රධාන වශයෙන් හේතු විය.

## විදුලි සංදේශ බද්ද

දේශීය වශයෙන් ලැබෙන ඇමතුම් හා පිටතට ලබා දෙන ඇමතුම් කාල ඉහළයාම හේතුවෙන් විදුලි සංදේශ බද්දෙන් උපයාගත් ආදායම 2021 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 9.6 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 10.7 ක් දක්වා සියයට 11.1 කින් සැළකියයුතු ලෙස වර්ධනය විය.

**වගුව 1.7 : නිදහස් වෙළෙඳ ගිවිසුම් මගින් ආවරණය වන තීරු බදු සහන යටතේ ආනයනය/අපනයනය කරන ලද භාණ්ඩ හා වටිනාකම්**

| නිදහස් වෙළෙඳ ගිවිසුම | ජන.-සැප්. 2022 තීරුබදු සහන සඳහා යටත්වන නිෂ්පාදන සංඛ්‍යාව | ආනයන වටිනාකම (ම්.ර.ගැ./ රු. මිලියන) | අපනයන වටිනාකම (නැ.තෙ.මි./ රු. මිලියන) |
|---|---|---|---|
| ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (ISFTA) | 5,152 | 28,358 | 140,451 |
| පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (PSFTA) | 6,008 | 2,943 | 13,181 |
| දකුණු ආසියා නිදහස් වෙළෙඳ ගිවිසුම (SAFTA) | 5,739 | 1,266 | 19,015 |
| ආසියා ශාන්තිකර වෙළෙඳ ගිවිසුම (APTA) | 785 | 2,724 | 56,515 |
| **එකතුව** | **17,684** | **32,291** | **229,162** |

මූලාශ්‍රය : වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## වෙළෙඳ භාණ්ඩ අපනයන සහනාධාර යෝජනා ක්‍රමය යටතේ වන බද්ද (සෙස් බද්ද)

සෙස් බද්දෙන් ලද ආදායම 2021 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 56.4 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 52.8 ක් දක්වා සියයට 6.5 කින් ආන්තිකව පහත වැටුණි. ආනයනය මත සෙස් බද්දෙන් ලද ආදායම 2021 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 54.5 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 51.0 ක් දක්වා සියයට 6.4 කින් පහත වැටුණි. අපනයන මත සෙස් බද්දෙන් ලද ආදායම 2021 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 1.9 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 1.7 ක් දක්වා සියයට 8.3 කින් පහත වැටුණි.

## බදු නොවන ආදායම

බදු නොවන ආදායමෙහි ඇතුළත් සියළුම උප කාණ්ඩයන්ගෙන් ලද ආදායම 2021 වසරේ පළමු මාස නවයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වර්ධනය වී ඇත. ප්‍රධාන වශයෙන් විකුණුම් හා ගාස්තු සහ මහ බැංකු ලාභ පැවරුම් වැඩිවීම හේතුවෙන් නාමික වශයෙන් බදු නොවන ආදායම, 2021 වසරේ පළමු මාස නවයේ දී රු. බිලියන

**වගුව 1.8 : ජාත්‍යන්තර වෙළෙඳාමෙන් ලද සෙස් බදු ආදායම**

රු. මිලියන

| අයිතමය | ජන.-සැප්. 2021 | ජන.-සැප්. 2022(a) |
|---|---|---|
| **අපනයන සෙස් බද්ද** | **1,874** | **1,719** |
| තේ - (බදු සහ අපනයන පාලන) පනත, තේ මණ්ඩල නීති යටතේ | 369 | 352 |
| රබර් - රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ | 7 | 8 |
| පොල් - පොල් සංවර්ධන අධිකාරී පනත යටතේ | 138 | 145 |
| අ.සං.ම. සෙස් බද්ද - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ | 1,360 | 1,213 |
| **ආනයන සෙස් බද්ද - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ** | **54,521** | **51,032** |
| **එකතුව** | **56,395** | **52,751** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(a) තාවකාලික

**වගුව 1.9 : මුද්දර බදු සහ මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තුවල කාර්යසාධනය**

රු. මිලියන

| අයිතමය | 2021 | | | 2022 | | | % වෙනස 2021/2022 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ජන.-අගෝ. | | | ජන.-අගෝ. | | | ජන.-අගෝ. | | |
| | මධ්‍යම රජය | පළාත් සභා | එකතුව | මධ්‍යම රජය | පළාත් සභා | එකතුව | මධ්‍යම රජය | පළාත් සභා | එකතුව |
| මුද්දර බදු* | - | 9,389.9 | 9,389.9 | - | 7,284.5 | 7,284.5 | - | -22.4 | -22.4 |
| මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු** | 371.9 | 867.8 | 1,239.7 | 168.8 | 393.8 | 562.6 | -54.6 | -54.6 | -54.6 |
| **එකතුව** | **371.9** | **10,257.7** | **10,629.6** | **168.8** | **7,678.3** | **7,847.1** | **-54.6** | **-25.1** | **-26.2** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

*2011 වසරේ සිට මුද්දර බදු ආදායම මඟින් ඉපයූ සම්පූර්ණ ආදායම මධ්‍යම රජය විසින් පළාත් සභා වෙත මාරු කරනු ලැබේ.

**මෝටර් රථ ලියාපදිංචි කිරීමේ ගාස්තු වලින් මධ්‍යම රජය විසින් ඉපයූ ආදායමෙන් පළාත් සභාවලට මාරු කරන ලද සියයට 70ට අදාළ සංඛ්‍යා දැක්වේ.

99.0 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 165.1 ක් දක්වා සියයට 66.8 කින් සැළකියයුතු ලෙස වර්ධනය වී ඇත. බදු නොවන ආදායම මුළු බදු ආදායමෙ හි ප්‍රතිශතයක් ලෙස 2021 වසරේ පළමු මාස නවයේ දී වූ සියයට 9.4 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 11.4 ක් දක්වා වර්ධනය විය. ඒ අනුව, ප්‍රධාන වශයෙන් තැපැල් හා දුම්රිය දෙපාර්තමේන්තු වල ගාස්තු සංශෝධනය හේතුවෙන් විකුණුම් හා ගාස්තු ආදායම, සමස්ත බදු නොවන ආදායමෙන් සියයට 34.4 කට දායක වෙන් 2021 වසරේ පළමු මාස නවයේ දී වූ රු. බිලියන 18.1 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 56.8 ක් දක්වා සියයට 214.6 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. වාර්තා වූ බෙදාහැරිය හැකි ලාභය වැඩි වීම නිසා මහ බැංකු ලාභ පැවරුම් ද 2021 වසරේ පළමු මාස නවයේ දී වූ රු. බිලියන 15.0 සිට 2022 වසරේ කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 30.0 දක්වා සැළකිය යුතු ලෙස වර්ධනය විය. රාජ්‍ය වත්කම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම හේතුවෙන් කුලී ආදායම, 2021 වසරේ පළමු මාස නවයේ දී වූ රු. බිලියන 3.4 ක සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 4.7 ක් දක්වා සියයට 38.6 කින් වර්ධනය විය. රජය සතු ව්‍යාපාරයන්හි ලාභය ද 2021 වසරේ පළමු මාස නවයේ දී වූ රු. බිලියන 16.2 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 18.9 දක්වා සියයට 17.0 කින් වර්ධනය විය. සමාජ ආරක්ෂණ දායකත්වය, වෙළෙඳ ආදායම සහ වෙනත් බදු නොවන ආදායම් වලින් ලද වෙනත් බදු නොවන ආදායම් 2021 වසරේ පළමු මාස නවයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී පිළිවෙළින් රු. බිලියන 27.7 ක් දක්වා සියයට 9.6 කින් ද, රු. බිලියන 4.6 ක් දක්වා සියයට 7.6 කින් ද, රු. බිලියන 22.4ක් දක්වා සියයට 33.0 කින් ද, වර්ධනය විය. 2022 වසරේ දී රු. බිලියන 232.0 ක් වූ බදු නොවන ආදායමෙ හි වාර්ෂික ඇස්තමේන්තුවෙන් 2022 වසරේ පළමු මාස නවය තුළ සියයට 71.2 ක ප්‍රතිශතයක් ළඟා කරගෙන ඇත.

## වගුව 1.10 : රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය (ජනවාරි සිට සැප්තැම්බර් 2022)

රු. බිලියන

| අයිතමය | 2021 (ජන.-සැප්.) | 2022 (වාර්ෂික ඇස්තමේන්තුව) | 2022 (සංශෝධිත ඇස්තමේන්තුව) | 2022 (ජන.-සැප්.) (තාවකාලික) | හේතු |
|---|---|---|---|---|---|
| ආදායම් බදු | 209.5 | 496.0 | 558.0 | 431.8 | 2022 මූලික ඇස්තමේන්තුවෙන් සියයට 87.1 ක් ලඟා කර ගනිමින්, ආදායම් බදු මගින් ලද ආදායම 2021 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා කළ රු. බිලියන 209.5 ට සාපේක්ෂව, 2022 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ ආදායම් බදු මඟින් ලද ආදායම රු. බිලියන 431.8 දක්වා සියයට 106.1 කින් වැඩි විය. එක් වරක් පමණක් අය කරනු ලබන බද්දක් ලෙස හඳුන්වාදුන් අධිභාර බද්ද මඟින් ලද රු. බිලියන 120.7 ක ආදායම ඇතුළත්ව, සංස්ථාපිත හා සංස්ථාපිත නොවන රු. බිලියන 190.6 සිට රු. බිලියන 399.4 දක්වා සියයට 109.5 කින් වැඩි වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. එමෙන්ම, 2021 සැප්තැම්බර් මස දී හඳුන්වා දුන් ස්වෙච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද මඟින් ලද රු. බිලියන 4.0 ක ආදායම ද මෙම ආදායම් ඉපයීමට දායක වී ඇත. එමෙන්ම, උපයනවිට ගෙවීම් බද්ද/ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද රු. බිලියන 10.5 සිට රු. බිලියන 17.9 දක්වා සියයට 70.2 කින් වර්ධනය වූ අතර, 2021 පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 7.7 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රඳවා ගැනීමේ බද්ද යටතේ රැස්කල ආදායම රු. බිලියන 14.3 ක් දක්වා සියයට 85.8 කින් වැඩි විය. තවද, සැළකිල්ලට ලක් කරනු ලබන කාලය තුළ ප්‍රාග්ධන ලාභ බද්ද රු. මිලියන 461 සිට රු. බිලියන 1.3 දක්වා සියයට 186.9 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. |
| එකතු කල අගය මත බදු | 224.1 | 424.0 | 533.0 | 310.5 | 2022 මූලික ඇස්තමේන්තුවෙන් සියයට 73.2 ක් ලඟා කර ගනිමින්, 2021 මුල් මාස නවය තුළ වූ රු. බිලියන 224.1 ට සාපේක්ෂව, 2022 සමාන කාලපරිච්ඡේදය තුළ එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 310.5 ක් දක්වා සියයට 38.6 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. එකතු කල අගය මත බදු අනුපාතය, 2022 වසරේ ජුනි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 8 සිට සියයට 12 දක්වා ද, 2022 වසරේ සැප්තැම්බර් මස 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 12 සිට සියයට 15 දක්වා ද ඉහළ දැමීම මෙම ආදායම් කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මූල්‍ය සේවාවන් මත එකතු කළ අගය මත බදු අනුපාතය 2022 වසරේ ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 15 සිට සියයට 18 දක්වා ඉහළ දැමීම ද මෙම කාර්යසාධනය සඳහා දායක විය. දේශීය ආර්ථික ක්‍රියාකරකම්වල මන්දගාමී ක්‍රියාකාරිත්වය හා ආනයන සීමා කිරීම් යටතේ වුවද, ඇ. ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම සහ දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ පාරිභෝගික භාණ්ඩ මිල ගණන් ඉහළ යාම, එකතු කළ අගය මත බදු ආදායම නාමික වශයෙන් ඉහළ යාම සඳහා හේතු වී ඇත. දේශීය ක්‍රියාකාරකම් මත සහ ආනයන ආශ්‍රිත ක්‍රියාකරකම් මත අය කරනු ලබන එකතු කළ අගය මත බද්ද පිළිවෙළින් රු. බිලියන 193.8 ක් දක්වා සියයට 44.7 කින් සහ රු. බිලියන 116.7 ක් දක්වා සියයට 29.5 කින් වැඩි විය. |

රු. බිලියන

| අයිතමය | 2021 (ජන.-සැප්.) | 2022 (වාර්ෂික ඇස්තමේන්තුව) | 2022 (සංශෝධිත ඇස්තමේන්තුව) | 2022 (ජන.-සැප්.) (තාවකාලික) | හේතු |
|---|---|---|---|---|---|
| නිෂ්පාදන බදු | 213.9 | 430.0 | 374.0 | 262.1 | 2022 වසරේ මූලික ඇස්තමේන්තුවෙන් සියයට 61.0 ක් ලඟා කර ගනිමින්, 2021 වසරේ මුල් මාස නවයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී නිෂ්පාදන බදු මඟින් උපයන ලද ආදායම සියයට 22.5 කින් ඉහළ ගොස් ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ මත්පැන් හා සිගරැට් මගින් ලද ආදායම ඉහළයාමයි. මත්පැන් නිෂ්පාදන මත වූ සුරාබදු අනුපාත 2021 වසරේ නොවැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි ඉහළ දැමීම සහ 2022 වසරේ ජනවාරි මස 03 දින සිට බලපැවැත්වෙන පරිදි මත්පැන් හා මත්පැන් ආශ්‍රිත නිෂ්පාදන සඳහා හඳුන්වා දුන් ආරක්ෂිත සළකුණු හා ආරක්ෂිත සළකුණු කළමණාකරණ පද්ධතිය ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන, සුරාබදු ආදායම 2021 මුල් මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 94.2 ක ආදායමට සාපේක්ෂව, 2022 සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 124.6 ක් දක්වා සියයට 32.2 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. එමෙන්ම, 2022 අයවැය මගින් සිගරට් සඳහා වූ නිෂ්පාදන බදු අනුපාත සංශෝධන කිරීම සහ 2022 මුල් මාස නවය තුල දුම්වැටි අලෙවිය සියයට 30 කින් වර්ධනය වීම හේතුවෙන් සලකා බලනු ලබන කාලය තුළ සිගරැට් මත නිෂ්පාදන බද්ද මඟින් ලද ආදායම රු. බිලියන 82.6 දක්වා සියයට 32.6 කින් ඉහළ ගොස් ඇත. 2020 මාර්තු මස සිට මෝටර් රථවාහන ආනයනය සීමා කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබිය දී වුවද, මෝටර් රථවාහන මගින් උපයන ලද නිෂ්පාදන බදු ආදායම 2021 ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා වන කාලය තුළ වාර්තා වූ රු. බිලියන 13.2 ට සාපේක්ෂව, 2022 සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 13.7 දක්වා සියයට 3.4 කින් ඉහළ ගොස් ඇත. තවද, අනෙකුත් නිෂ්පාදන මගින් උපයන ලද ආදායම ද, නිෂ්පාදන බදු ආදායම ශක්තිමත් කිරීම කෙරෙහි ධනාත්මකව දායක වී ඇත. කෙසේ වුවද, ඉන්ධන සදහා වන ඉල්ලුම කළමණාකරණය කිරීමේ අපේක්ෂාවෙන් හඳුන්වා දුන් ඉන්ධන බලපත්‍ර ක්‍රමය හේතුවෙන් ඉන්ධන ආනයනය පහත වැටීමෙහි ප්‍රතිඵලයක් ලෙස 2022 පළමු මාස නවය තුළ ඛණිජ තෙල් නිෂ්පාදන මත අයකරනු ලබන නිෂ්පාදන බදු ආදායම රු. බිලියන 36.7 දක්වා සියයට 7.5 කින් පහළ වැටී ඇත. |
| ආනයන බදු | 51.8 | 115.0 | 42.0 | 36.6 | 2022 වර්ෂය සදහා වූ මූලික ඇස්තමේන්තුවෙන් සියයට 31.8 ක් ලඟා කරගනිමින්, 2021 මුල් මාස නවයට සාපේක්ෂව, 2022 සමාන කාල පරිච්ඡේදය තුළදී, ආනයන බදු මගින් උපයන ලද ආදායම රු. බිලියන 36.6 දක්වා සියයට 29.4 කින් සැළකිය යුතු ලෙස අඩු විය. ආනයන සීමා ක්‍රියාමාර්ග හඳුන්වා දීම, අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ සඳහා බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දීම, තෝරාගත් භාණ්ඩ සඳහා අනයන බදු අනුපාතයන් ඉහළ දැමීම සහ විදේශ විනිමය ගලා යාම් සීමා කිරීම සඳහා අධිභාර පැනවීම, සළකා බලනු ලබන කාලය තුළ ආනයන බදු ආදායමෙහි කාර්යසාධනය සඳහා අහිතකර ලෙස බලපාන ලදී. |
| වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු | 114.1 | 175.0 | 177.0 | 135.4 | 2022 වර්ෂය සදහා වූ මූලික ඇස්තමේන්තුවෙන් සියයට 77.4 ක් ළඟා කර ගනිමින්, 2022 පළමු මාස නවය තුළ වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු ආදායම රු. බිලියන 135.4 දක්වා සියයට 18.7 කින් සැළකිය යුතු ලෙස වැඩි වී ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම සහ ජාතයන්තර වෙළඳපොළෙහි ඛණිජතෙල් නිෂ්පාදන, සිමෙන්ති ක්ලින්කර්, යකඩ, අමුද්‍රව්‍ය සහ අනෙකුත් පාරිභෝගික භාණ්ඩවල මිල ඉහළ යාමයි. |

| අයිතමය | 2021 (ජන.-සැප්.) | 2022 (වාර්ෂික ඇස්තමේන්තුව) | 2022 (සංශෝධිත ඇස්තමේන්තුව) | 2022 (ජන.-සැප්.) (තාවකාලික) | හේතු |
|---|---|---|---|---|---|
| | රු. බිලියන | | | | |
| විශේෂ භාණ්ඩ හා සේවා බදු | 42.1 | 80.0 | 35.0 | 29.2 | 2022 වර්ෂය සඳහා වූ මූලික ඇස්තමේන්තුවෙන් සියයට 36.5 ක් අත්කර ගනිමින්, 2022 ජනවාරි - සැප්තැම්බර් කාලය තුල විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මගින් උපයන ලද ආදායම රු. බිලියන 29.2 දක්වා සියයට 30.5 කින් සැළකිය යුතු ලෙස අඩු විය. අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය අධෛර්යමත් කිරීම සඳහා ඇපල්, මිදි, දොඩම් වැනි තොරා ගත් පාරිභෝගික භාණ්ඩ සඳහා වූ විශේෂ වෙළඳ භාණ්ඩ බදු අනුපාතයන් ඉහළ දැමීම මේ සඳහා හේතු විය. |
| වෙනත් බදු | 96.3 | 267.0 | 133.0 | 77.7 | 2022 මූලික ඇස්තමේන්තුවෙන් සියයට 29.1 ක් රැස්කරමින්, 2021 මුල් මාස නවය තුළ ලබාගත් රු. බිලියන 96.3 ට සාපේක්ෂව 2022 සමාන කාල පරිච්ඡේදය තුළ අනෙකුත් බදු මගින් ලද ආදායම රු. බිලියන 77.7 දක්වා සියයට 19.3 කින් සැළකිය යුතු ලෙස අඩු විය. සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ක්‍රියාත්මක වීම ප්‍රමාද වීම මෙන්ම 2022 අයවැය යටතේ විශේෂ භාණ්ඩ හා සේවා බද්ද සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනා ඉවත් කර ගැනීම, ඇස්තමේන්තුගත ආදායම ළඟා කර නොගැනීමට ප්‍රධාන වශයෙන් හේතු විය. ආනයන හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් පහත වැටීම සහ සෙස් බදු අයකරනු ලබන තෝරාගත් භාණ්ඩ සඳහා ආනයන සීමා පැනවීම පිළිබිඹු කරමින් 2022 පළමු මාස නවය තුළ සෙස් බදු මඟින් ලද ආදායම රු. බිලියන 52.8 දක්වා සියයට 6.5 කින් පහත වැටීම මෙම කාර්යසාධනයට අහිතකර ලෙස බලපා ඇත. කෙසේ වුවද, 2022 ජූනි මස සිට ක්‍රියාත්මක වන පරිදි විදුලි සංදේශ බදු අනුපාතය සියයට 11.25 සිට සියයට 15 දක්වා ඉහළ දැමීම හේතුවෙන්, විදුලි සංදේශ බද්දෙන් ලද ආදායම රු.බිලියන 10.7 දක්වා සියයට 11.1 කින් වැඩි විය. |
| බදු නොවන ආදායම | 99.0 | 226.0 | 232.0 | 165.1 | 2022 මුල් මාස නවය තුළ බදු නොවන ආදායම, පසුගිය සමාන කාලය හා සැසඳීමේදී සියයට 66.8 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. එය 2022 මූලික ඇස්තමේන්තුගත ආදායමින් සියයට 73.1 ක ළඟා කරගැනීමකි. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ගාස්තු හා ගෙවීම් සංශෝධනය කිරීම සහ කුලී, රජය සතු ව්‍යවසායයන්ගෙන් ලැබෙන ලාභ හා ලාභාංශ හා පොළී මඟින් ලැබුණු ආදායම වැඩි වීමයි. තවද, සලකා බලනු ලබන කාලය තුළ මහබැංකු ලාභ පැවරුම් මගින් ලද රු.බිලියන 30 ක මුදල හා සමාජ ආරක්ෂණ දායක මුදල් ලැබීම ද බදු නොවන ආදායම වර්ධනය වීම සඳහා සැළකිය යුතු ලෙස දායක වී ඇත. |
| **එකතුව** | **1,050.8** | **2,213 .0** | **2,084.0** | **1,448.5** | |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**සටහන 2.1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් : 2022 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා**

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය)** | |
| 2022.01.01 | සුරාබදු නිවේදන අංක 01/2022 (2022.01.01 දිනැති අංක 2260/78 දරන ගැසට් නිවේදනය)<br><br>- තරු 03 හා තරු 04 හෝටල් සහ තරු 05 හා ඊට ඉහළ ගණයේ හෝටල්/ බුටික් හෝටල්: බුටික් විලා/පෞරාණික වැදගත්කමක් ඇති හෝටල් සඳහා මද්‍යසාර භාවිතය සම්බන්ධයෙන් අය කරනු ලබන ගාස්තුව 2022 මාර්තු 31 දින දක්වා ගෙවීමෙන් නිදහස් කිරීම. |
| 2022.01.01 | සුරාබදු නිවේදන අංක 02/2022 (2022.01.01 දිනැති අංක 2260/79 දරන ගැසට් නිවේදනය)<br><br>- ර.බී. 7, ර.බී. 8, ර.බී. 11, ර.බී. 12 සහ ර.බී. 22බී බලපත්‍රලාභීන් සඳහා අය කරනු ලබන වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තුව 2022 මාර්තු 31 දින දක්වා ගෙවීමෙන් නිදහස් කිරීම. |
| 2022.01.27 | 2022.01.27 දිනැති අංක 2264/28 දරන ගැසට් නිවේදනය හා 2022.01.27 දිනැති අංක 2264/29 දරන ගැසට් නිවේදනය<br><br>- නීතිමය අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම උදෙසා සුරාබදු ආඥා පනතේ (52 වන අධිකාරය) 32 වන වගන්තිය යටතේ අංක 08/2021 හා අංක 09/2021 දරන සුරාබදු නිවේදන 2021 දෙසැම්බර් මස 10 වන දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව දැනුම් දීම. |
| 2022.05.04 | සුරාබදු නිවේදන අංක 03/2022 (2022.04.29 දිනැති අංක 2277/62 දරන ගැසට් නිවේදනය)<br><br>- ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලාභී යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ, ඉන් නිකුත් කරනු ලබන්නා වූ බෝතල් කරන ලද රා ලීටරයක් වෙනුවෙන් පනවනු ලබන බද්ද රු. 25/- සිට රු. 50/- දක්වා ඉහළ නැංවීම. |
| 2022.06.08 | සුරාබදු නිවේදන අංක 04/2022 ( 2022.06.08 දිනැති අංක 2283/28 දරන ගැසට් නිවේදනය)<br><br>- මධ්‍යසාර නිෂ්පාදනය හැරුණු කොට දේශීයව සපයනු ලබන හා ආනයනය කරනු ලබන ඊතයිල් මධ්‍යසාර සඳහා අයකරනු ලබන සුරා බද්ද ඉහළ නැංවීම. |
| 2022.07.28 | සුරාබදු නිවේදන අංක 05/2022 (2022.07.28 දිනැති අංක 2290/24 දරන ගැසට් නිවේදනය)<br><br>- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි සංචාරක ආයතන සඳහා මෘදු මත්පැන් බලපත්‍ර නිකුත් කිරීම හෝ ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය විසින් හඳුනාගනු ලබන (සංචාරක කලාපයන්හි පිහිටි) සංචාරක ආයතන |
| **එකතු කළ අගය මත බද්ද - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත** | |
| 2022.01.01 | 2022 අංක 13 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත<br><br>- මූල්‍ය ආයතන විසින් සපයනු ලබන මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීම සහ ඇතැම් භාණ්ඩ හා සේවා මත වන එකතු කල අගය මත බද්ද නිදහස් කිරීම. |
| 2022.06.01 | 2022.05.31 දිනැති අංක 2282/26 දරන ගැසට් නිවේදනය<br><br>- එකතු කළ අගය මත බද්ද සියයට 8 සිට සියයට 12 දක්වා ඉහළ නැංවීම |
| 2022.09.01 | 2022.08.31 දිනැති අංක 2295/08 දරන ගැසට් නිවේදනය<br><br>- එකතු කළ අගය මත බද්ද සියයට 12 සිට සියයට 15 දක්වා වැඩි කිරීම |
| 2022.10.07 | 2022.10.06 දිනැති අංක 2300/25 දරන ගැසට් නිවේදනය<br><br>- සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 9619.00.10 යටතේ සනීපාරක්ෂක තුවා (පෑඩ්) සහ ටැම්පොන් ආනයනය /හෝ සැපයීම මත එකතු කළ අගය මත වන බදු අනුපාතය ශුන්‍ය කිරීම |
| **අධිභාර බද්ද - 2022 අංක 14 දරන අධිභාර බදු පනත** | |
| 2022.04.08 | - 2020/2021 තක්සේරු වර්ෂය සඳහා රු. මිලියන 2,000 කට වඩා බදු අය කළ හැකි ආදායමක් ලබන පුද්ගලයන්, හවුල් ව්‍යාපාර හෝ සමාගම් මත සියයට 25 ක අනුපාතය යටතේ එක් වරක් පමණක් අයකළ හැකි අධිභාර බද්දක් පැනවීම |
| **වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද - 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත** | |
| 2022.01.06 | 2022.01.06 දිනැති අංක 2261/58 දරන ගැසට් නිවේදනය<br><br>- යම් වසංගත තත්ත්වයක් හෝ මහජන සෞඛ්‍ය සම්බන්ධයෙන් වන හදිසි තත්ත්වයක් හමුවේ කටයුතු කිරීමට සෞඛ්‍ය සේවා සැපයීම සඳහා රජයේ රෝහල් හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ප්‍රදානය කරනු ලැබූ වෛද්‍ය උපකරණ, යන්ත්‍රෝපකරණ ආදිය මත පනවා ඇති වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු නිදහස් කිරීම මඟින් 2020 ඔක්තෝම්බර් මස 26 දිනැති ගැසට් නිවේදන අංක 2199/2 සංශෝධනය කිරීම |
| 2022.01.12 | 2022.01.11 දිනැති අංක 2262/19 දරන ගැසට් නිවේදනය<br><br>- ජාතික සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල අළුතින් නිර්මාණය කරන ලද උපබෙදුම් සඳහා වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දෙහි සහනදායී බදු අනුපාත සහ නිදහස් කිරීම් නියම කිරීම |
| 2022.08.23 | 20220.8.22 දිනැති අංක 2294/26 දරන ගැසට් නිවේදනය<br><br>- යම් විදේශ ආයතනයක් මඟින් සහනදායී පියවර වශයෙන් හෝ අත්‍යාවශ්‍ය මහජන සේවා අඛණ්ඩව පවත්වා ගැනීමට පහසුකම් සැලසීම සඳහා පරිත්‍යාග කරනු ලබන අත්‍යාවශ්‍ය භාණ්ඩ වරාය හා ගුවන් තොටුපල බද්දෙන් නිදහස් කිරීම |
| 2022.10.05 | 2022.10.05 දිනැති අංක 2300/13 දරන ගැසට් නිවේදනය<br><br>- සනීපාරක්ෂක තුවා නිෂ්පාදනය සඳහා භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය සඳහා අයකරනු ලබන වරාය හා ගුවන් තොටුපල බද්ද නිදහස් කිරීම |

**ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් : 2022 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා**

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **සෙස් බද්ද - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත** | |
| 2022.01.12 | 2022.01.11 දිනැති අංක 2262/20 දරන ගැසට් නිවේදනය<br>- සහල්, මත්ස්‍ය නිෂ්පාදන සහ ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු මාරු කිරීමට අදාළ උපාංග සඳහා නිර්මාණය කරන ලද නව ජාතික සංයෝජිත සංකේතාංක උප බෙදුම් සඳහා දැනට පවතින සෙස් බදු අනුපාත නියම කිරීම |
| 2022.03.11 | 2022.03.10 දිනැති අංක 2270/59 දරන ගැසට් නිවේදනය<br>- රෙදිපිළි සහ ඇඟලුම් සඳහා පවතින සෙස් බදු අනුපාත ඉහළ නැංවීම |
| 2022.05.19 | 2022.05.18 දිනැති අංක 2280/32 දරන ගැසට් නිවේදනය<br>- 2022.01.11 දිනැති අංක 2262/20 දරන ගැසට් නිවේදනය නැවත ගැසට් කිරීම |
| **රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත** | |
| 2022.01.12 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 01/2022 (2022.01.11 දිනැති අංක 2262/14 දරන ගැසට් නිවේදනය)<br>- ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු ආශ්‍රිත උපාංග වල ප්‍රමිතිය තක්සේරු කිරීම සහ අධීක්ෂණය කිරීම<br>- මත්ස්‍ය නිෂ්පාදන සඳහා වන ආනයන සහ වෙළඳපොල තොරතුරු අධීක්ෂණය කිරීම<br>- පටක රෝපණ පැළ වල අපනයන වර්ධනය සහ වෙළඳ පොළ තොරතුරු අධීක්ෂණය කිරීම<br>- දේශීය දුඹුරු සීනි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා ICUMSA අගය මත පදනම්ව දුඹුරු සීනි හා සුදු සීනි වෙන්කර හඳුනා ගැනීම<br>- බාස්මතී සහ වෙනත් සහල් වර්ග පහසුවෙන් හඳුනාගැනීම සඳහා වර්ගීකරණ ගැටළු නැතිකිරීම යනාදිය සඳහා නව ජාතික උපබෙදුම් සංයෝජිත සංකේතාංක ඇති කිරීම |
| 2022.03.10 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 02/2022 (2022.03.09 දිනැති අංක 2270/20 දරන ගැසට් නිවේදනය)<br>- ආනයන අධෛර්යමත් කිරීම සහ විදේශ මුදල් පිටතට ගලා යාම අවම කිරීම සඳහා අත්‍යවශ්‍ය නොවන තෝරාගත් භාණ්ඩ කිහිපයක රේගු ආනයන බද්ද ඉහළ නැංවීම |
| **විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත** | |
| 2022.01.01 | 2021.12.31 දිනැති අංක 2260/72 දරන ගැසට් නිවේදනය<br>- අර්තාපල් සහ බී ලූණු ආනයනය කිරීම මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පිළවෙලින් කි.ග්‍රෑමයකට රු.20/-කින් හා රු.10/- කින් මාස හයක කාලයක් සඳහා අඩු කිරීම |
| 2022.01.12 | 2022.01.11 දිනැති අංක 2262/15 දරන ගැසට් නිවේදනය<br>- සහල් සහ සීනි සඳහා නව සංයෝජිත සංකේතාංක නිර්මාණය කිරීම අනුව දැනට පවතින තීරුබදු අනුපාත මාස හයක කාලයක් සඳහා දීර්ඝ කිරීම |
| 2022.03.04 | 2022.03.03 දිනැති අංක 2269/48 දරන ගැසට් නිවේදනය<br>- සුළු පරිමාණ සත්ත්ව ආහාර නිෂ්පාදකයන්ගේ අමුද්‍රව්‍ය අවශ්‍යතා සහ කුකුළු නිෂ්පාදන මිල ගණන් සැලකිල්ලට ගනිමින් බඩඉරිඟු සහ ඉදල් ඉරිඟු සඳහා කි. ග්‍රෑමයකට රු.10 ක සහනදායී තීරු බදු අනුපාතයක් මාස හයක කාලයක් සඳහා හඳුන්වා දීම |
| 2022.03.04 | 2022.03.03 දිනැති අංක 2269/56 දරන ගැසට් නිවේදනය<br>- දේශීය ටින් මාළු කර්මාන්තය ආරක්ෂා කර ගැනීම, ගොවීන්ට හොඳ මිලක් සහතික කිරීම සහ මිල ස්ථායිතාව පවත්වා ගැනීම සඳහා මැකරල් මාළු, උඳු, කව්පි, කුරක්කන් සහ මෙනේරි ආනයනය කිරීම මත පවතින තීරුබදු අනුපාත වලංගු කාලය වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීම |
| 2022.03.10 | 2022.03.09 දිනැති අංක 2270/19 දරන ගැසට් නිවේදනය<br>- ආනයනය අඩු කිරීම සඳහා යෝගට්, බටර් සහ කිරි ආහාර ආනයනය මත කි. ග්‍රෑමයට රු. 1,000 ක්, චීස් මත කි. ග්‍රෑමයකට රු. 400 ක්, රටඉඳි සහ නැවුම් දොඩම් මත කි. ග්‍රෑමයකට රු. 200 ක්, නැවුම් මිදි, ඇපල් සහ අනෙකුත් පළතුරු සඳහා කි. ග්‍රෑමයට රු. 300 වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙහි වලංගු කාලය මාස හයක කාලයක් සඳහා දීර්ඝ කිරීම |
| 2022.03.28 | 2022.03.28 දිනැති අංක 2273/1 දරන ගැසට් නිවේදනය<br>- රාමසාන් උත්සව සමය පිළිබඳ සලකා රට ඉඳි ආනයනය මත කි. ග්‍රෑමයට රු. 199/-ක තීරුබදු සහනයක් මාස පහක කාලයක් සඳහා ලබාදීම |
| 2022.04.14 | 2022.04.13 දිනැති අංක 2275/2 දරන ගැසට් නිවේදනය<br>- පරිප්පු, මාළු, උම්බලකඩ, මුංඇට, මැංගුස් සහ කිවි ෆෲට් ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ බද්දෙහි වලංගු කාලය මාස හයක කාලයක් සඳහා දීර්ඝ කිරීම |
| 2022.06.15 | 2022.06.15 දිනැති අංක 2284/3 දරන ගැසට් නිවේදනය<br>- පලතුරු ආනයනය අධෛර්යමත් කිරීම සහ ගෘහස්ථ ආහාරයට ගත හැකි පිරිපහදු කළ තෙල් කර්මාන්තය, පොල් ආශ්‍රිත කර්මාන්ත සහ ආහාර, බිස්කට් සහ සබන් වැනි කර්මාන්ත ස්ථාවර කිරීම සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙහි වලංගු කාලය වසරකින් දීර්ඝ කිරීම |

**ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් : 2022 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා**

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2022.08.10 | 2022.08.09 දිනැති අංක 2292/29 දරන ගැසට් නිවේදනය<br><br>- විදේශ රටවලින් ආධාර/පරිත්‍යාග විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ගෙවීමට බැඳී සිටින අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය පිළිබඳ පනතේ 5 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වසරක කාලසීමාවක් සඳහා නිදහස් කිරීම |
| 2022.08.12 | 2022.08.10 දිනැති අංක 2292/41 දරන ගැසට් නිවේදනය<br><br>- පාරිභෝගිකයින්ගේ යහපත සඳහා සහ දේශීය නිෂ්පාදකයින් ආරක්ෂා කිරීම සඳහා වෙළඳපොළ මිල ස්ථාවර කිරීම සඳහා හාල්මැස්සන්, උම්බලකඩ, උළුහාල්, කුරක්කන් සහ අබ සඳහා වන වෙළඳ භාණ්ඩ බද්ද වසරකින් දීර්ඝ කිරීම |
| 2022.09.04 | 2022.09.03 දිනැති අංක 2295/44 දරන ගැසට් නිවේදනය<br><br>- සුළු පරිමාණ සත්ත්ව ආහාර නිෂ්පාදකයින්ගේ අමුද්‍රව්‍ය අවශ්‍යතාවය සහ කුකුළු නිෂ්පාදන මිල ස්ථාවර කිරීම සඳහා බඩඉරිඟු සහ ඉදල් ඉරිඟු ආනයනය සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පවතින මිල ගණන් යටතේ 2022.12.31 දක්වා දීර්ඝ කිරීම |
| 2022.09.23 | 2022.09.22 දිනැති අංක 2298/51 දරන ගැසට් නිවේදනය<br><br>- කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිර්දේශය මත, දේශීය අස්වනු කාලය සැලකිල්ලට ගෙන, බී ළූනු ආනයනය මත පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කි. ග්‍රෑමයට රු. 10/- සිට රු. 50/- දක්වා වැඩිකර 2023 අගෝස්තු 11 තෙක් පවත්වා ගැනීම |
| **ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසි** | |
| 2022.01.12 | 2022 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2022.01.11 දිනැති අංක 2262/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br><br>- දිගු ඇට සහිත සහල් ආනයන මත පනවා තිබූ තාවකාලික අත්හිටුවීම ඉවත් කිරීම<br>- නව සංයෝජිත සංකේතාංක අනුව කටු ගැලවූ මසුන් ආනයන මත පනවා තිබූ ආනයන සීමා අඛණ්ඩව පවත්වාගෙන යෑම |
| 2022.03.10 | 2022 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2022.03.09 දිනැති අංක 2270/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br><br>- තෝරාගත් භාණ්ඩ ආනයනය සඳහා ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවය පැනවීම |
| 2022.04.10 | 2022 අංක 06 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2022.04.09 දිනැති අංක 2274/42 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br><br>- තෝරාගත් භාණ්ඩ ආනයනය සඳහා ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවය පැනවීම |
| **අපගමන බද්ද - 2003 අංක 25 දරන මුදල් පනත** | |
| 2022.03.27 | 2022.03.27 දිනැති අංක 2272/53 දරන ගැසට් නිවේදනය<br><br>- කලාපීය ගමනාන්තයක් ලෙස සේවා සපයනු ලබන ජාත්‍යන්තර ගුවන් තොටුපළක් ලෙස ප්‍රචලිත කිරීමේ අරමුණු ඇතිව රත්මලාන කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළෙන් (CIAR) ශ්‍රී ලංකාවෙන් පිටවන ගුවන් මගීන් සඳහා අපගමන බද්ද සියයට 50 කින් ඇ.ඩො. 30 දක්වා අඩු කිරීම |
| **2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත** | |
| 2022.01.18 | 2022.01.18 දිනැති අංක 2263/3 දරන ගැසට් නිවේදනය<br><br>- HCL ටෙක්නොලොජිස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෘදුකාංග නිෂ්පාදනය සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා ව්‍යාපෘතියට අදාළ තොරතුරු සහ ලබා දීමට නියමිත නිදහස් කිරීම් ප්‍රකාශයට පත් කිරීම |
| 2022.04.25 | 2022.04.25 දිනැති අංක 2277/2 දරන ගැසට් නිවේදනය<br><br>- මංතීරු හතරක උස් කරන ලද අධිවේගී මාර්ගයක් නව කැළණි පාලමේ සිට රාජගිරිය හරහා අතුරුගිරිය තෙක් ඉදිකිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති අදාළ තොරතුරු සහ නිදහස් කිරීම් ප්‍රකාශයට පත් කිරීම |
| 2022.08.03 | 2022.08.03 දිනැති අංක 2291/25 දරන ගැසට් නිවේදනය<br><br>- HCL ටෙක්නොලොජිස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෘදුකාංග නිෂ්පාදනය සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා ව්‍යාපෘතියට අදාළ තොරතුරු සහ ලබාදෙන ලද නිදහස් කිරීම් ප්‍රකාශයට පත් කිරීම |
| **2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත** | |
| 2022.08.31 | 2022.08.31 දිනැති අංක 2295/10 දරන ගැසට් නිවේදනය<br><br>- 2022 අංක 01 දරන කැසිනෝ ව්‍යාපාර බලපත්‍ර රෙගුලාසි ප්‍රකාශයට පත්කිරීම |
| 2022.09.01 | 31.08.2022 දිනැති අංක 2295/9 දරන ගැසට් නිවේදනය<br><br>- 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර පනතේ 2 වැනි වගන්තිය යටතේ නිකුත්කර ඇති බලපත්‍රයේ දක්වා ඇති කැසිනෝ ව්‍යාපාරය කරගෙන යනු ලබන ස්ථානය හෝ පරිශ්‍රය කැසිනෝ ව්‍යාපාරයේ නිරතවීම සඳහා නිශ්චිත ප්‍රදේශය ලෙස නියම කිරීම |
| **නිෂ්පාදන බද්ද - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත** | |
| 2022.07.27 | 2022.07.27 දින අංක 2290/19 දරන ගැසට් නිවේදනය<br><br>- දේශීයව එකලස් කරන ලද/ නිෂ්පාදිත වාහන සඳහා අදාළ සහනදායී නිෂ්පාදන බදු අනුපාතිකයේ බදු පදනම "ගෙවිය යුතු තීරු බදු ප්‍රතිශතය" වෙනුවට මී.ර.ගැ. අගයෙන් සියයට" ලෙස සංශෝධනය කිරීම |

## 1.3 රජයේ වියදම

රජයේ වියදම් සඳහා වාර්ෂිකව පාර්ලිමේන්තුව විසින් බලය දීම සිදු කළ යුතුය. ඒ අනුව 2022 වසරේ දී රජයට වියදම් දැරීමට හැකිවන පරිදි 2021 අංක 30 දරන විසර්ජන පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී. කෙසේ වෙතත්, රටේ සමාජ-ආර්ථික ව්‍යුහයේ මෑත කාලීන වර්ධනයන් හේතුවෙන් රජයේ වියදම් පිළිබඳ ඇස්තමේන්තුව ප්‍රායෝගික නොවන තත්ත්වයකට පත් විය.

පොහොර සහනාධාරය ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදනවල හිඟය පියවා ගැනීම, ඉන්ධන, ලිපි ද්‍රව්‍ය, වෛද්‍ය සැපයුම්, ආරක්ෂක හමුදා/පොලිසිය/රෝහල් ආදිය සඳහා ආහාර සහ නිල ඇඳුම් ලබා දීම සඳහා වැය වන ඉහළ පිරිවැය පියවා ගැනීම සඳහා මෙන්ම දිළිඳු හා පහසුවෙන් අවදානමට ලක් විය හැකි කණ්ඩායම්වලට හදිසි සහන සැලසීම සඳහා රජයේ වියදම් ඉහළ නැංවීමේ දැඩි අවශ්‍යතාවක් පැන නැඟුණි. මේ අතර, 2022 වසරේ දී ප්‍රමුඛතාවයෙන් අඩු සහ ප්‍රායෝගික හේතූන් මත ක්‍රියාත්මක කිරීමට අපහසු ප්‍රාග්ධන ව්‍යාපෘතිවලින් රු. බිලියන 300 ක ප්‍රතිපාදන ඉතිරි විය හැකි බවට හඳුනාගන්නා ලදී. 2022 වසරේ මැද භාගයේ දී, රජය විසින් රටේ නව අවශ්‍යතා සපුරාලීම සඳහා 2021 අංක 30 දරන විසර්ජන පනත සංශෝධනය කරමින් 2022 වසර සඳහා නව අයවැයක් ඉදිරිපත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 අංක 30 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී. ඒ අනුව, 2022 වසරේ රජයේ වියදම් කළමනාකරණය කිරීම, 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනතේ දක්වා ඇති සීමාවන් තුළ කළ යුතු ය. කෙසේ වෙතත්, 2022 වසරේ පළමු මාස නවය තුළ රජයේ වියදම රු. බිලියන 2,694.8 ක් වූ අතර ඉන් රු. බිලියන 2,300.2ක් පුනරාවර්තන වියදම් ද, රු. බිලියන 394.6ක් ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීමේ වියදම් ද විය.

**වගුව 1.11: රාජ්‍ය වියදම් කාර්යසාධනය**

රු. මිලියන

| අයිතමය | ජන.-සැප්. 2021 | ජන.-සැප්. 2022[ආ] |
|---|---|---|
| **පුනරාවර්තන** | **2,087,309** | **2,300,171** |
| වැටුප් | 634,746 | 714,280 |
| විශ්‍රාම වැටුප් | 197,833 | 228,609 |
| පොලී ගෙවීම | 832,992 | 927,366 |
| වෙනත් | 421,739 | 429,916 |
| **මූලධන වියදම සහ ශුද්ධ ණය ගෙවීම** | **293,102** | **394,617** |
| **මුළු වියදම** | **2,380,412** | **2,694,788** |

මූලාශ්‍ර : ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
[ආ] තාවකාලික

### පුද්ගල පඩිනඩි සහ විශ්‍රාම වැටුප්

2022 වසරේ පළමු මාස නවය තුළ පළාත් රාජ්‍ය සේවකයින්ද ඇතුළුව රාජ්‍ය සේවකයින්ගේ පුද්ගල පඩිනඩි සඳහා වන සමස්ත වියදම රු. බිලියන 714.3 ක් වූ අතර එය 2021 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දරන ලද වියදම වූ රු.බිලියන 634.7 ට සාපේක්ෂව සියයට 12.5 ක වැඩිවීමකි. මේ අතර, විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වන වියදම 2021 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 197.8 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 228.6 ක් දක්වා සියයට 15.6 කින් වැඩි විය. 2022 ජනවාරි මස සිට රාජ්‍ය සේවකයින් සහ විශ්‍රාමිකයින් සඳහා රුපියල් 5,000/-ක මාසික විශේෂ දීමනාවක් ගෙවීම මෙම වැඩි වීමට හේතු වී ඇත.

### පොලී ගෙවීම

2021 පළමු මාස නවය තුල රු. බිලියන 833.0 ක් වූ දේශීය සහ විදේශීය ණය මත පොලී ගෙවීම්, 2022 වසරේ එම කාල සීමාව තුල රු. බිලියන 927.4 ක් දක්වා සියයට 11.3 කින් වැඩි විය. මෙයට හේතුව වූයේ දේශීය ණය මත වූ පොලී ගෙවීම සියයට 29.2 කින් වැඩිවීම මෙයට හේතු විය. කෙසේ වෙතත්, 2022 වසරේ පළමු මාස නවය තුල විදේශීය ණය මත වූ පොලී ගෙවීම, සියයට 45.7 කින් සැලකිය යුතු ලෙස අඩු විය. රු. බිලියන 927.4 ක් වූ සමස්ත පොලී ගෙවීමෙන් රු. බිලියන 819.4 ක් දේශීය ණය මත වූ පොලී ගෙවීම් සඳහා වූ අතර රු. බිලියන 108.0 ක් විදේශීය ණය මත පොලී ගෙවීම් සඳහා විය.

**වගුව 1.12:** රජයේ සුරැකුම්පත් මත ගෙවන පොලී අනුපාතයන්හි සහ විනිමය අනුපාතිකයන්හි හැසිරීම (%) 2021 සිට 2022 දක්වා

රු. මිලියන

| කාලපරිච්ඡේදය | | භාණ්ඩාගාර බිල්පත් (%) | | | භාණ්ඩාගාර බැඳුම්කර (%) | | | | සාමාන්‍ය විනිමය අනුපාතය රු./ඇ.ඩො. |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | දින 91 | දින 182 | දින 364 | වසර 2 | වසර 3 | වසර 4 | වසර 5 | |
| 2021 | ජනවාරි | 4.69 | 4.75 | 4.98 | - | - | 6.34 | 6.72 | 190.5 |
| | පෙබරවාරි | 4.90 | 4.99 | 5.09 | - | 6.25 | 6.70 | 7.07 | 194.1 |
| | මාර්තු | 5.05 | 5.10 | 5.11 | 6.19 | 6.30 | - | 7.05 | 197.0 |
| | අප්‍රේල් | 5.11 | 5.14 | 5.18 | 6.50 | - | - | 7.25 | 197.4 |
| | මැයි | 5.13 | 5.14 | 5.18 | - | - | 7.04 | - | 199.6 |
| | ජූනි | 5.18 | 5.19 | 5.23 | 6.35 | - | 7.30 | 7.31 | 199.8 |
| | ජූලි | 5.22 | 5.23 | 5.25 | 6.36 | 6.87 | 7.47 | - | 200.0 |
| | අගෝස්තු | 5.87 | 5.90 | 5.93 | 6.75 | - | 8.55 | - | 200.5 |
| | සැප්තැම්බර් | 6.70 | 6.99 | 7.01 | 8.12 | 8.10 | - | - | 202.0 |
| | ඔක්තෝබර් | 8.43 | 8.16 | 8.18 | 9.36 | 9.94 | - | 11.14 | 201.1 |
| | නොවැම්බර් | 7.53 | 8.02 | 8.16 | 9.16 | 9.67 | - | - | 201.9 |
| | දෙසැම්බර් | 8.16 | 8.33 | 8.24 | - | 9.70 | - | - | 201.4 |
| 2022 | ජනවාරි | 8.63 | 8.55 | 8.55 | - | 11.49 | - | - | 201.5 |
| | පෙබරවාරි | 8.61 | 8.53 | 8.53 | - | 12.25 | - | 11.92 | 201.7 |
| | මාර්තු | 12.92 | 12.25 | 12.28 | 14.41 | - | - | 14.70 | 255.8 |
| | අප්‍රේල් | 23.53 | 23.96 | 24.09 | - | 22.01 | - | 22.16 | 319.4 |
| | මැයි | 23.65 | 24.22 | 24.30 | - | 22.38 | - | 22.69 | 358.9 |
| | ජූනි | 23.85 | 24.40 | 23.84 | - | 23.77 | - | 21.18 | 360.2 |
| | ජූලි | 28.86 | 29.24 | 29.53 | - | 28.45 | - | - | 360.9 |
| | අගෝස්තු | 32.89 | 31.28 | 30.50 | - | 29.16 | - | - | 361.0 |
| | සැප්තැම්බර් | 31.94 | 30.59 | 29.85 | - | 30.95 | - | 31.50 | 362.4 |

මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## සුබසාධන වියදම

සුබසාධන වැඩසටහන් සඳහා වන රජයේ වියදම් මගින් සෞඛ්‍යය හා පෝෂණය, අධ්‍යාපනය, ජීවනෝපාය සහායයන්, සමාජ සුබසාධන සහ සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් සඳහා වන වියදම් ආවරණය කරනු ලබයි. 2021 වසරේ මුල් මාස නවය තුළ රු. බිලියන 193.99 ක් වූ සුබසාධන වැඩසටහන් සඳහා වන වියදමට සාපේක්ෂව 2022 වසරේ මුල් මාස නවය තුළ එම වියදම රු. බිලියන 196.44 ක් දක්වා වැඩි වූ අතර ඊට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පහසුවෙන් අවදානමට ලක්වන්නන් සඳහා ලෝක බැංකුව විසින් අරමුදල් සපයන ලද ජීවනෝපාය සහාය වැඩසටහනයි.

රු. බිලියන 51.83 ක් වූ සෞඛ්‍ය වියදම ප්‍රධාන වශයෙන් "සැමට නොමිලේ ඖෂධ", "ත්‍රිපෝෂ" සහ "පෝෂණ මල්ල" යන වැඩසටහන්වලින් සමන්විත විය. "සැමට නොමිලේ ඖෂධ" වැඩසටහන සෞඛ්‍යය සහ පෝෂණය වෙනුවෙන් දරන ලද විශාලතම වියදම විය. කෙසේ වෙතත්, කොවිඩ්-19 රෝගයේ පැතිරීම පාලනය කිරීම හේතුවෙන් 2021 වසරේ එම කාලයට සාපේක්ෂව නොමිලේ ඖෂධ සඳහා වන වියදම සියයට 50 කින් පමණ අඩු වී ඇත.

2021 වසරේ පළමු මාස නවයක කාල සීමාව තුළ අධ්‍යාපනයට අදාළ සුබසාධන වියදම් සඳහා රජය විසින් දරන ලද රු. බිලියන 12.39 ට සාපේක්ෂව 2022 වසරේ පළමු මාස නවය තුළ එම වියදම් සඳහා රජය විසින් රු. බිලියන 10.14 ක් වැය කර ඇත. මෙම වියදම් අඩු වීම සිදු වූයේ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීම සඳහා වසර තුළ පාසල් වසා දැමීම හේතුවෙන් පාසල් වාර ප්‍රවේශපත්‍ර සඳහා ලබා දී තිබූ සහනාධාර අඩු කිරීමයි.

2021 වසරේ පළමු මාස නවය තුළ ජීවනෝපාය සහාය වැඩසටහන් සඳහා රජය විසින් දරන ලද රු. බිලියන 67.22 වියදමට සාපේක්ෂව 2022 වසරේ අදාළ කාලසීමාව

## වගුව 1.13: සුබසාධන වියදම්

රු. මිලියන

| අයිතමය | ජන.-සැප්. | |
|---|---|---|
| | 2021 | 2022 [අ] |
| **සෞඛ්‍ය හා පෝෂණ** | **96,148** | **51,827** |
| සැමට නොමිලේ ඖෂධ | 91,827 | 48,425 |
| ත්‍රිපෝෂ වැඩසටහන | 473 | 226 |
| පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාරය | 67 | 73 |
| පෝෂණ මල්ල | 3,781 | 3,103 |
| **අධ්‍යාපන** | **12,393** | **10,137** |
| නොමිලේ පෙළපොත් | 842 | 836 |
| නොමිලේ පාසැල් නිල ඇඳුම් | 1,834 | 1,993 |
| නොමිලේ වාර ප්‍රවේශපත්‍ර | 5,300 | 3,407 |
| පාසල් පෝෂ්‍යදායී ආහාර | 1,258 [b] | 709 [ආ] |
| දුෂ්කර හා අතිදුෂ්කර ප්‍රදේශවල පාසල් සිසුන්ට පාවහන් | 898 | 900 |
| 5 වසර ශිෂ්‍යත්ව | 370 | 321 |
| මහපොළ ශිෂ්‍යත්ව | 814 | 650 |
| ශිෂ්‍යාධාර | 563 | 710 |
| දහම් පාසල් ගුරුවරුන් සඳහා ආධාර | 514 | 611 |
| **ජීවනෝපාය සහායයන්** | **67,224** | **112,461** |
| පොහොර සහනාධාරය | 11,008 | 33,038 |
| සමෘද්ධි සහනාධාරය | 42,566 | 78,755 |
| නැවත වගා කිරීම සඳහා සහනාධාරය (තේ/රබර්) | 730 | 557 |
| අපනයන බෝග සංවර්ධනය සඳහා ගොවීන්ට ආධාර කිරීම | 141 | 71 |
| කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ පුද්ගලයන්ට ජීවනෝපාය සහායයන් | 12,779 | 40 |
| **සමාජ සුභසාධනය සහ ආරක්ෂණ ජාලය** | **18,232** | **22,017** |
| විශේෂ හැකියා ඇති පුද්ගලයින් හා වකුගඩු රෝගීන් සඳහා ආධාර | 4,958 | 5,795 |
| වැඩිහිටි පුද්ගලයින් සඳහා ආධාර | 7,412 | 12,056 |
| රණවිරු මාපිය සමාජ සත්කාර | 1,653 | 1,726 |
| ආහාර ආධාර, ගංවතුර හා නියං සහනාධාර | 209 | 40 |
| ආර්ථික වශයෙන් වාසිදායක නොවන මාර්ගවල බස් සේවා | 4,000 | 2,400 |
| **එකතුව** | **193,997** | **196,442** |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව
[අ] තාවකාලික
[ආ] එක් සිසුවකු සඳහා ආහාර සැපයීම සඳහා යන වියදමට උද්ධමනය සහ මිල ඉහළයාම් ඇතුළත් නොවීම හේතුවෙන් ආහාර සපයන්නන් විසින් ආහාර සැපයීමට පැකිලීමක් දක්වන අතර ඔවුන් විසින් මිල වැඩි වීමක් ඉල්ලා ඇත

තුළ එම වියදම රු. බිලියන 112.46 ක් විය. ජීවනෝපාය සහාය වියදම් දැඩි ලෙස ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කෘෂිකාර්මික පුනර්ජීවනය සහ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම උදෙසා අත්‍යවශ්‍ය රසායනික පොහොර සැපයීමට තුඩු දුන් පොහොර සහනාධාරයට අදාළ වියදම් රු. බිලියන 11.00 සිට රු. බිලියන 33.03 ක් දක්වා කැපී පෙනෙන ලෙස වර්ධනය වීමත්, ජීවනෝපාය සහාය හා බැඳුණු සමෘද්ධි, වැඩිහිටි, ආබාධිත හා වකුගඩු රෝගීන් ඇතුළු අවදානමට ලක්වූවන්ට ලබා දුන් සහයත් වේ. ඒ අනුව, ලෝක බැංකුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ සහයෝගය මත, දැනට සිටින ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය සහායයන් සඳහා දීමනා ඉහළ නැංවීම සහ 2022 වසරේ මැයි මස සිට ජූලි මස දක්වා සහ 2022 වසරේ සැප්තැම්බර් මාසය සඳහා පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් හට දීමනා ගෙවීම සඳහා රු. බිලියන 78.76 ක් වැය කර ඇත.

### රාජ්‍ය ආයෝජන

පහතින් දක්වා ඇති අංශද ඇතුළත්ව, මහාමාර්ග, ජල සම්පාදන, වාරිමාර්ග, ප්‍රවාහන, කෘෂිකර්ම සහ අධ්‍යාපන යන ප්‍රමුඛ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2022 වසරේ පළමු මාස නවය තුළ ආසන්න වශයෙන් රු. බිලියන 210 ක් වැය කර ඇත:

- මාර්ග, මහාමාර්ග, පාලම් සහ අධිවේගී මාර්ග සංවර්ධනය සඳහා රු. බිලියන 114
- සැමට ප්‍රමාණවත් සහ සුරක්ෂිත පානීය ජලය සහතික කිරීම සඳහා රු. බිලියන 15
- ප්‍රවාහන ජාලයේ කාර්යක්ෂමතාව, ධාරිතාව සහ සම්බන්ධතාව වැඩිදියුණු කිරීම සඳහා රු. බිලියන 31
- නවීන තාක්ෂණය හඳුන්වාදීම සහ නව බීජ වර්ග හඳුන්වා දීම මගින් කෘෂිකාර්මික අගය දාමයේ (Value Chain) ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා රු. බිලියන 11
- බහුකාර්ය වාරිමාර්ග යෝජනා ක්‍රම සහ ඇළ මාර්ග ඉදිකිරීම මගින් කෘෂිකර්මාන්තයට ජලය ලබා ගැනීම සහතික කිරීම වෙනුවෙන් රු. බිලියන 28
- යටිතල පහසුකම් සංවර්ධනය සහ අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා රු. බිලියන 11

## 1.4 භාණ්ඩාගාර මෙහෙයුම්

### භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය

2022 වසරේ මුල් මාස නමය තුළ භාණ්ඩාගාරයට ආදායම් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් මුදල් ගලා ඒම් රු. බිලියන 1,361.9 ක් වූ අතර එය රු. බිලියන 1,557.3 ක් වූ ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 87.5 කි. මෙය 2021 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ රු. බිලියන 1,020.6 හා සැසඳීමේ දී සියයට 33.4 ක වැඩි වීමකි. මේ අතර 2022 වසරේ මුල් මාස නමය තුළ පුනරාවර්තන හා රාජ්‍ය ආයෝජන සඳහා මුදල් ගලායාම් රු. බිලියන 2,743.0 ක් වූ අතර, එය 2021 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ රු. බිලියන 2,350.9 සමඟ සැසඳීමේ දී සියයට 16.7 වැඩිවීමක් පෙන්නුම් කරයි.

2022 වසරේ සැප්තැම්බර් මස 30 දිනට ශුද්ධ මුදල් හිඟය රු. බිලියන 1,381.1 ක් වූ අතර 2021 වසරේ සැප්තැම්බර් මස 30 දිනට පැවති රු. බිලියන 1,330.3 ට සාපේක්ෂව එය සියයට 3.8 ක වැඩිවීමකි. මෙහෙයුම් වියදම් සහ රාජ්‍ය ආයෝජන පිළිවෙලින් සියයට 10.4 කින් සහ සියයට 54.9 කින් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, අදාළ කාලය තුළ ශුද්ධ ණය ගැනීම් ඇතුළුව මුදල් ගලාඒම් වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස 2021 වසරේ සැප්තැම්බර් මස 30 දිනට රු. බිලියන 856.8 ක් වූ සමස්ත මුදල් ශේෂ හිඟය 2022 වසරේ සැප්තැම්බර් මස 30 දිනට රු. බිලියන 48.2 ක් දක්වා අඩු වී ඇත.

### රාජ්‍ය ණය කළමනාකරණය

2022 වසර සඳහා පාර්ලිමේන්තුව මගින් අනුමත කරන ලද මුළු ණය ගැනීමේ සීමාව රු. බිලියන 3,200.0 ක් වූ අතර, පසුව එය සංශෝධිත අයවැය මගින් රු. බිලියන 3,844 ක් දක්වා වැඩිකරන ලදී. 2022 වසරේ ජනවාරි මස 01 වනදා සිට සැප්තැම්බර් මස 30 වනදා දක්වා කාලය තුළ රජයේ ණය භාවිතය රු. බිලියන 3,017.4 (පොත් අගය මත) කි. එම අගය, වසර ආරම්භයේදී පැවති බැංකු අයිරාව හරහා මුල්‍යකරණය කර තිබූ රු. බිලියන 831.6 ක් වූ සමස්ත මුදල් ශේෂ හිඟය, 2022 සැප්තැම්බර් මස 30 දිනට රු. බිලියන 48.2 ක් දක්වා අඩුවීම සැළකිල්ලට ගැනීමෙන් පසුව රු. බිලියන 2,234 ක් ලෙස සැළකිය හැකිය. 2022 සැප්තැම්බර් මස 30 දිනට පිළිවෙලින් රු. බිලියන 2,720.1 ක් සහ රු. බිලියන 297.3 ක් වූ දේශීය හා විදේශීය ණය වලින් සමන්විත මුළු ණය ගැනීම් මෙම කාලපරිච්ඡේදය තුළ මුදල් ප්‍රවාහ මෙහෙයුම් හා සංවර්ධන ව්‍යාපෘති මුල්‍යණයට භාවිතා කර ඇත.

2022 වසරේ පළමු මාස නවය තුළ සියයට 90 ක්ම දේශීය ණය ගැනීම් වලින් සමන්විත විය. භාණ්ඩාගාර බැඳුම්කරල භාණ්ඩාගාර බිල්පත් සහ ශ්‍රී ලංකා මහ බැංකු අත්තිකාරම් දේශීය ණය ගැනීමේ ප්‍රධාන ප්‍රභවයන් විය. ඒ අනුවල 2022 මුල් මාස නවය තුළ සමස්ත දේශීය ණය වලින් සියයට 55 ක් පමණ භාණ්ඩාගාර බැඳුම්කර මගින් ලබාගෙන ඇති අතර සියයට 39 ක් භාණ්ඩාගාර බිල්පත් නියෝජනය කරන අතර තවත් සියයට 5 ක් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ ශ්‍රී ලංකා මහ බැංකු අත්තිකාරම් මගින් ලබාගෙන ඇත. 2022 වසරේ සැප්තැම්බර් මස අවසානයේ දී ශුද්ධ ණය ගැනීම රු. බිලියන 2,022.1 කි.

### වගුව 1.14: රජයේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු. බිලියන

| අයිතමය | ජන.-සැප්. 2021 සත්‍ය | ජන.-සැප්. 2022 ඇස්තමේන්තුව | ජන.-සැප්. 2022 සත්‍ය |
|---|---|---|---|
| ආරම්භක මුදල් ශේෂය | -488.2 | -831.6 | -831.6 |
| ආදායම් හා වෙනත් ලැබීම් මගින් සමස්ථ මුදල් ගලා ඒම | 1,020.6 | 1,557.3 | 1,361.9 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වල සමස්ථ මුදල් ගලා යෑම් | -2,021.1 | -2,192.3 | -2,232.2 |
| ආයෝජන කටයුතු සඳහා සමස්ථ මුදල් ගලායාම්* | -329.8 | -658.8 | -510.8 |
| ශුද්ධ මුදල් අතිරික්තය /(හිඟය) | -1,330.3 | -1,293.8 | -1,381.1 |
| දළ ණය ගැනීම්* | 1,972.0 | 2,960.8 | 3,017.4 |
| ණය ආපසු ගෙවීම් | -1,036.6 | -1,085.2 | -995.3 |
| ශුද්ධ ණය ගැනීම් | 935.4 | 1,875.6 | 2,022.1 |
| පෙර වසරේ ස්වෛරීත්ව බැඳුම්කර ශේෂය | - | - | 4.5 |
| ගැලපීම් ගිණුමේ ශේෂය (TEB/ශුද්ධ තැන්පතු යනාදිය) | 26.3 | - | 137.9 |
| **අවසාන මුදල් ශේෂය** | **-856.8** | **-249.8** | **-48.2** |

මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

* 2022.09.30 දක්වා රජයට ලැබුණු වැඩසටහන් හා ව්‍යාපෘති ණය ඇතුලත්වේ.

### වගුව 1.15: දළ දේශීය ණය මූලාශ්‍ර අනුව

රු. බිලියන

| මූලාශ්‍ර | ජන.-සැප්. 2022 |
|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 1,567.7 |
| භාණ්ඩාගාර බිල්පත් (ශුද්ධ) | 1,077.8 |
| මහ බැංකුවේ තාවකාලික අත්තිකාරම් | 74.7 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 65.6 |
| **එකතුව** | **2,785.8** |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණය ආපසු ගෙවීම් | -65.7 |
| **දේශීය ණය භාවිතය** | **2,720.1** |

මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

**රූපසටහන 1.4 : මූලාශ්‍ර අනුව දළ දේශීය ණය 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා**




මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 1.5 විදේශ මූල්‍යයනය

2021 වර්ෂයේ දී විදේශ මූල්‍යයනය සම්පාදනය කිරීම සඳහා හඳුන්වා දෙන ලද ප්‍රතිපත්තිවලට අනුකූලව, ඉහළ ප්‍රමුඛතාවය සහිත ව්‍යාපෘති සහ මූල්‍යයන අවශ්‍යතා මූල්‍යනය කිරීමට රජය විසින් එකඟතා ඇතිකරගෙන ඇත. ඒ අනුව, රජය විසින් අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා 2022 වර්ෂයේ දී විදේශ ණය ලබා ගන්නා ලදි.

### විදේශ මූල්‍යයන එකඟතා

2022 වර්ෂයේ පළමු මාස 9 තුළ දී රජය විසින් විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය ලබා දෙන ආයතන සමග විදේශ මූල්‍යයන එකඟතා ගිවිසුම් 8 කට එළඹීමෙන්, ඇ.ඩො. මිලියන 1,873.5 ක විදේශ මූල්‍යයනයක් ලබාගෙන ඇත. අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීම සඳහා එක්සිම් බැංකුවෙන් සහ ඉන්දියානු රාජ්‍ය බැංකුව මඟින් ලබා දෙන ලද ඇ.ඩො. මිලියන 1,555.0 ද, ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රකෘතිමත් කිරීමේ හදිසි ආධාර ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගත් ඇ.ඩො. මිලියන 200.0 ද, මොරටුව විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකිරීම සහ එයට භාණ්ඩ ලබා දීම සඳහා කුවේට් රාජ්‍යයෙන් ලබා දෙන ලද ඇ.ඩො. මිලියන 32.9 ද, මාතර වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ජර්මානු ෆෙඩරල් ජනරජයෙන් ලබා දෙන ලද ඇ.ඩො. මිලියන 17.6 ද, ප්‍රජාතන්ත්‍රවාදී, සමෘද්ධිමත් සහ ශක්තිමත් ශ්‍රී ලංකා වැඩ සටහන සඳහා ඇමරිකා එක්සත් ජනපදය විසින් ලබා දෙන ලද ඇ.ඩො. මිලියන 65.0 ක ප්‍රදානය ද හා ආසියානු සංවර්ධන බැංකුවෙන් ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රකෘතිමත් කිරීම සඳහා හදිසි ආධාර ව්‍යාපෘතිය සඳහා ලබාදුන් ඇ.ඩො. මිලියන 3.0 ක ප්‍රදානය ද, මෙයට ඇතුළත් වේ. 2022 වර්ෂයේ මුල් මාස නවය තුළ විදේශ අරමුදල් ඒකරාශී කිරීමෙහි කාර්යසාධනයට ශ්‍රී ලංකාවේ පැවති දුෂ්කර ආර්ථික තත්ත්වය බෙහෙවින් බලපාන ලදි.

## වගුව 1.16: 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා ඇතිකර ගත් විදේශ මූල්‍යයන එකඟතා, අදාළ මූල්‍ය කොන්දේසි සමඟ

| සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය | ව්‍යාපෘතිය හෝ වැඩසටහන | එකඟතා ප්‍රමාණය (මිලියන) | | | | මූල්‍ය කොන්දේසි | | | | වෙනත් කොන්දේසි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විනිමය | අත්සන් කරන ලද විනිමයන් | රුපියල් | ඇ.ඩො. | පොලිය | | | වෙනත් ගාස්තු | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය /උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) (වර්ෂ) |
| | | | | | | | | වර්ගය | වාර්ෂික අනුපාතය (සියයට) | සීමාන්තිකය (පදනම් අංක සියයට) | | | |
| **ද්විපාර්ශ්වීය** | | | | | | | | | | | | | |
| කුවේට් | ණය | 2022.02.03 | මොරටුව විශ්වවිද්‍යාලය සඳහා වෛද්‍ය පීඨයක් ඉදිකිරීම හා උපකරණ සැපයීමේ ව්‍යාපෘතිය | කුවේට් ඩිනාර් | 10.0 | 6,638.9 | 32.9 | ස්ථාවර | අදාළ නොවේ | 1 | බැදීම් ගාස්තු 0.5% | 6 | 26 |
| ජර්මනිය | ණය | 2022.01.27 | මාතර වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා මූල්‍යාධාර ලබාගැනීම | යුරෝ | 15.7 | 3,561.6 | 17.6 | ස්ථාවර | අදාළ නොවේ | 2 | - | 10 | 30 |
| ඉන්දියාව | ණය | 2022.02.02 | කෙටි කාලීන ණය මාලාව (ඇ.ඩො. මිලියන 50.0) | ඇ.ඩො. | 500.0 | 100,710.3 | 500.0 | විචල්‍ය | SOFR 6M | 1.5 | කළමනාකරණ ගාස්තු 0.5% | 1 | 1 |
| | ණය | 2022.03.17 | 2022 වසර සඳහා අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීම | ඇ.ඩො. | 1,000.0 | 267,862.1 | 1,000.0 | විචල්‍ය | SOFR 3M | 1.6 | මූලික ගෙවීම් ගාස්තු 0.2% | 3 | 3 |
| | ණය | 2022.06.10 | යූරියා පොහොර මිලදී ගැනීම | ඇ.ඩො. | 55.0 | 19,789.0 | 55.0 | විචල්‍ය | SOFR 6M | 1.6 | බැදීම් ගාස්තු 0.5% කළමනාකරණ ගාස්තු 0.5%<br>කළමනාකරණ ගාස්තු 0.5% | 3 | 12 |
| ඇමරිකා එක්සත් ජනපදය | ප්‍රදාන | 2022.08.31 | ප්‍රජාතන්ත්‍රවාදී, සමෘද්ධිමත් සහ ශක්තිමත් ශ්‍රී ලංකා වැඩසටහන | ඇ.ඩො. | 65.0 | 23,474.6 | 65.0 | | | අදාළ නොවේ | | | 5 |
| **බහුපාර්ශ්වීය** | | | | | | | | | | | | | |
| ආසියානු සංවර්ධන බැංකුව | ණය | 2022.09.09 | ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රකෘතිමත් කිරීමේ හදිසි ආධාර ව්‍යාපෘතිය | ඇ.ඩො. | 200.0 | 72,400.0 | 200.0 | විචල්‍ය | SOFR | 0.7 | බැදීම් ගාස්තු 0. 15% | 8 | 31 |
| | ප්‍රදාන | 2022.09.09 | ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රකෘතිමත් කිරීමේ හදිසි ආධාර ව්‍යාපෘතිය | ඇ.ඩො. | 3.0 | 1,086.0 | 3.0 | | | අදාළ නොවේ | | | 2 |
| එකතුව | | | | | | 495,522.5 | 1,873.5 | | | | | | |

මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
සටහන : විවිධ විදේශ විනිමයෙන් සටහන් වන එකඟතා අගයයන් ඇ.ඩො. හා රුපියල් බවට හැරවීමේ දී අදාළ ගිවිසුම් අත්සන් කරන ලද දිනයේ පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.

### විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි හා උපයෝජනය

2022 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා, මුළු විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි ප්‍රමාණය වන ඇ.ඩො. මිලියන 1,910.1 ක් වූ අතර, ඉන් ඇ.ඩො. මිලියන 1,902.9 ක් ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි ද ඇ.ඩො. මිලියන 7.2 ක් ප්‍රදාන ලෙස ලද ප්‍රතිලබ්ධි ද වේ.

2022 වර්ෂයේ පළමු මාස නවය තුළ වාර්තා වූ මෙම ප්‍රතිලබ්ධිවලින් ඉහළම ප්‍රමාණය, ඉන්දියාව සමග අත්සන් කරන ලද ණය ගිවිසුම් මගින් ලබා ගත් අතර, එය සමස්තයෙන් ආසන්න වශයෙන් සියයට 45 ක් වේ. ඉන් අනතුරුව ඉහළම ප්‍රමාණයක් ආසියානු සංවර්ධන බැංකුව (සියයට 25) සහ ලෝක බැංකුව (සියයට 18) සමඟ අත්සන් කරන ලද ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වේ.

**වගුව 1.17: එක් එක් සංවර්ධන පාර්ශ්වකරු විසින් 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා සිදු කරන ලද ප්‍රතිලබ්ධි**

| සංවර්ධන පාර්ශ්වකරු | ප්‍රතිලබ්ධි ප්‍රමාණය (ඇ.ඩො. මිලියන)* | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| **ද්විපාර්ශ්වික** | **1,073.4** | **0.8** | **1,074.2** |
| ඉන්දියාව | 855.5 | 0.0 | 855.5 |
| චීනය | 67.8 | 0.0 | 67.8 |
| ජපානය | 73.0 | 0.0 | 73.0 |
| ප්‍රංශය | 35.7 | 0.0 | 35.7 |
| නෙදර්ලන්තය | 17.5 | 0.0 | 17.5 |
| සෞදි අරාබිය | 7.4 | 0.0 | 7.4 |
| කුවේටය | 5.6 | 0.0 | 5.6 |
| හංගේරියාව | 2.9 | 0.0 | 2.9 |
| කොරියාව | 3.1 | 0.0 | 3.1 |
| එක්සත් රාජධානිය | 2.0 | 0.0 | 2.0 |
| ඔස්ට්‍රියාව | 1.4 | 0.0 | 1.4 |
| ස්පාඤ්ඤය | 1.2 | 0.0 | 1.2 |
| ඩෙන්මාර්කය | 0.3 | 0.0 | 0.3 |
| ජර්මනිය | 0.0 | 0.8 | 0.8 |
| **බහුපාර්ශ්වික** | **829.5** | **6.4** | **835.9** |
| ආසියානු සංවර්ධන බැංකුව | 479.3 | 0.5 | 479.8 |
| ලෝක බැංකුව | 328.5 | 5.9 | 334.4 |
| ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 14.8 | 0.0 | 14.8 |
| ඔපෙක් අරමුදල | 4.2 | 0.0 | 4.2 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 2.7 | 0.0 | 2.7 |
| **එකතුව** | **1,902.9** | **7.2** | **1,910.1** |

මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

සටහන : එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයයන් එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීමේදී 2022 සැප්තැම්බර් 30 දින පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.

* තාවකාලික අගයයන්

ප්‍රතිලබ්ධි වලින් සියයට 29 ට ආසන්න ඉහළ ප්‍රමාණයක් විදුලිබල හා බලශක්ති අංශයේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සම්බන්ධව උපලබ්ධි වන අතර, ඉන් අනතුරුව සියයට 22 ක් මාර්ග හා පාලම් අංශයේ ද, සියයට 16 ක් වෙළඳ අංශයේ ද, සියයට 7 ක් සෞඛ්‍යය හා සමාජ සුබසාධනය අංශයේ ද, සියයට 6 ක් ජලසම්පාදනය හා සනීපාරක්ෂාව අංශයේ ද, සියයට 4 මානුෂීය ආධාර අංශයේ ද, සියයට 4 ක් ප්‍රවාහන අංශයේ ද, සියයට 3 ක් වාරිමාර්ග අංශයේ ද, සියයට 3 ක් කෘෂිකර්ම අංශයේ ද සහ සියයට 2 ක් අධ්‍යාපනය අංශයේද ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල උපයෝජනය පිණිස යොදවා ඇත.

**රූප සටහන 1.5: එක් එක් අංශය වෙනුවෙන් 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා සිදුවූ ප්‍රතිලබ්ධි (ඇ.ඩො. මිලියන)**




මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

**රූප සටහන 1.7: 2022 සැප්තැම්බර් 30 වන විට අංශ අනුව පළ කරන ලද එකඟතා මත ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය (ඇ.ඩො. මිලියන)**




මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

## එකඟතා පළකරන ලදුව ඉදිරියේ දී උපයෝජනය වීමට නියමිත ශේෂය

2022 සැප්තැම්බර් 30 දින වන විට දැනට පළ කර ඇති එකඟතා අනුව ඉදිරි වර්ෂ 3-5 කාලය තුළ උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයනවල ශේෂය ඇ.ඩො. බිලියන 7.2 ක් විය. උපයෝජනය වීමට නියමිත ශේෂයෙන් ඉහළම ප්‍රමාණය ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දීමට නියමිත අතර, අනතුරුව ඉහළ ප්‍රමාණයන් පිළිවෙලින් චීනය, ඉන්දියාව, ලෝක බැංකුව සහ ජපානය ලබා දීමට නියමිතය.

එකඟතා පළකරන ලදුව ඉදිරියේ දී උපයෝජනය වීමට නියමිත ශේෂයෙන් සියයට 21 ක් මාර්ග හා පාළම් අංශයේ ද, සියයට 16 ක් ජලසම්පාදනය හා සනීපාරක්ෂාව අංශයේ ද, සියයට 12 ක් ප්‍රවාහන අංශයේ ද එකඟතා පළ කරන ලද ව්‍යාපෘතිවල ද උපයෝජනය වීමට නියමිතය.

**රූප සටහන 1.6: 2022 සැප්තැම්බර් 30 වන විට පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය එක් එක් සංවර්ධන පාර්ශ්වකරු අනුව (ඇ.ඩො. මිලියන)**




මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

## විදේශ ණය ප්‍රමාණය හා විදේශ ණය සේවාකරණය

ආර්ථිකය යථා තත්ත්වයට පත් කර ගැනීමේ වැඩසටහනක් සැලසුම් කිරීම සහ හදිසි මූල්‍යාධාර ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ලබා ගැනීමේ හැකියාව කෙරෙහි රජයේ අවධානය යොමුකර ඇත. ශ්‍රී ලංකාවේ විදේශ රාජ්‍ය ණය පූර්ණ තිරසාර තත්ත්වයකට නැවත පත්කර ගැනීම සඳහා පුළුල් සැළැස්මක් සම්පාදනය කර ණය හිමියන්/ සංවර්ධන පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කිරීමේ අරමුණින් හැකි ඉක්මනින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා කිරීම ආරම්භ කරන ලදි. ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනට අනුකූල වන පරිදි, එම ණය නිසියාකාරව සහ ණය හිමියාගේ එකඟතාව සහිතව ප්‍රතිව්‍යුහගත කරන තෙක් 2022 වසරේ අප්‍රේල් 12 වන දින සිට ආරම්භ වන අන්තර් කාල සීමාවක් සඳහා ද්විපාර්ශ්වික සහ වාණිජ ණය හිමියන්ගේ ණය සේවාකරණය තාවකාලිකව අත්හිටුවීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. ඒ අනුව, එම තීරණය ද්විපාර්ශ්වික ණය හිමියන් වෙතින් ලබාගත් ණය කළඹ සඳහා බලපා ඇත.

2022 වසරේ සැප්තැම්බර් මස අවසාන වන විට මධ්‍යම රජය විසින් ලබාගත් නොපියවූ විදේශ ණය ඇ.ඩො. බිලියන 35 කි.[i] 2022 වසරේ ජනවාරි මස 1 සිට සැප්තැම්බර් 30 දක්වා සිදු කරන ලද සමස්ත ණය සේවාකරණ ගෙවීම්[ii] ඇ.ඩො. මිලියන 1,758.0 කි. මෙයින්, ඇ.ඩො. මිලියන 1,323.1 ක් ණය ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන ඇ.ඩො. මිලියන 434.9 පොළී ගෙවීම සඳහා යොදවා ඇත.

[i] තාවකාලික අගයයන්

[ii] ණය සේවාකරණය, ණය ආපසු ගෙවීම, පොළී ගෙවීම

# ආර්ථික උපනතීන්

# 02

## 2.1 සමාලෝචනය

ශ්‍රී ලංකා ආර්ථිකය පෙර නොවූ විරූ සාර්ව ආර්ථික අභියෝගයන්ට මුහුණ දෙමින් සිටී. වසර ගණනාවක් මුළුල්ලේ පැවති දුර්වල රාජ්‍ය මූල්‍ය තත්ත්වය සමඟම ඉහළ අවදානම් වාණිජ ණය ගැනීම් තුළින් පැන නැඟුන තිරසාර නොවන ණය, ශුන්‍යයට ආසන්න සංචිත තත්ත්වය, වාර්තාගත ලෙස ඉහළ ගිය උද්ධමනය, පොළී අනුපාත සහ ගෝලීය ආර්ථික කැළඹීම තුළින් ගෙවුම් ශේෂයට එල්ල වූ පීඩනය යනා දී අභියෝගයන් ඇතුළත් වේ. රුසියා යුක්රේන ගැටුම සහ ඒ හා බැඳුණු කරුණු උද්ධමනය, සැපයුම් දාමය සහ මූල්‍ය වෙළෙඳපොළ කෙරෙහි වූ බලපෑම තුළින් ගෝලීය ආර්ථිකයේ මන්දගාමීත්වය තීව්‍ර විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 2022 ඔක්තෝබර් "ලෝක ආර්ථික ඉදිරි දැක්ම" (World Economic Outlook) මඟින් ගෝලීය ආර්ථික වර්ධනය 2021 වසරේ දී සියයට 6.0 සිට සියයට 3.2 දක්වා ද 2023 වසරේ දී සියයට 2.7 ක් දක්වා ද පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇත.

කෘෂිකර්මය සියයට 7.6 කින් සහ කර්මාන්ත සියයට 7.1 කින් තියුණු ලෙස සංකෝචනය වීම සහ සේවා අංශය සියයට 0.6 කින් මධ්‍යස්ථ ලෙස සංකෝචනය වීම හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකය 2021 වසරේ පළමු භාගයේ දී පැවති සියයට 9.3 ක වර්ධනයේ සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 4.8 කින් සංකෝචනය විය. රසායනික පොහොර වැනි යෙදවුම් හි හිඟකම හේතුවෙන් කෘෂිකර්ම අංශයේ නිෂ්පාදනය අඩාල වූ අතර විශේෂයෙන් සැපයුම් දාමයේ බාධා හේතුවෙන් කර්මාන්ත අංශයට බලපෑම් ඇති විය. මේ අතර, සංචාරක අංශය මධ්‍යස්ථ ලෙස යළි යථාතත්ත්වයට පත් වීම සේවා අංශයේ සුළු සංකෝචනයක් වාර්තා කිරීමට සහාය විය.

2021 වසරේ සිව්වන කාර්තුවේ සිට අඩු වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ විරැකියා අනුපාතය, ආර්ථික ක්‍රියාකාරකම් හි පසුබැස්ම පෙන්නුම් කරමින් 2022 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 4.6 ක් දක්වා ඉහළ ගියේය.

ප්‍රධාන වශයෙන් ඉහළ ආහාර සහ ප්‍රවාහන අංශයේ උද්ධමනය හේතුවෙන් 2022 වසරේ දී උද්ධමනය එහි වාර්තාගත ඉහළම මට්ටමට ළඟා විය. රසායනික පොහොර තහනම හේතුවෙන් සැපයුම් අංශයට බාධා ඇති වීම, ඉන්ධන සහ ආහාර ද්‍රව්‍ය වැනි ගෝලීය භාණ්ඩ මිල ඉහළ යාම හේතුවෙන් ආනයනික උද්ධමනය ඉහළ යාම, සැපයුම් දාම අවහිර වීම, බලශක්ති මිල සංශෝධනය සහ දේශීය මුදල් තියුණු ලෙස අවප්‍රමාණය වීම යනාදිය උද්ධමනය තියුණු ලෙස ඉහළ යාමට හේතු වූ කරුණු ලෙස හඳුනාගත හැක. කොළඹ පාරිභෝගික මිල දර්ශකය මඟින් වාර්ෂික පදනම මත මනිනු ලබන මතුපිට උද්ධමනය, 2022 වසරේ ජනවාරි මාසයේ සියයට 14.2 සිට 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 69.8 ක් දක්වා වර්ධනය විය. අඛණ්ඩව ඉහළ යාමේ ප්‍රවණතාවය වෙනස් කරමින් කොළඹ පාරිභෝගික මිල දර්ශකය මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2022 වසරේ ඔක්තෝබර් මාසයේදී සියයට 66 දක්වා පහත වැටුණි. වාර්ෂික පදනම මත මනිනු

**රූපසටහන 2.1 : දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය**




මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ලබන මූලික උද්ධමනය, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 50.2 ක් දක්වා වර්ධනය විය. ජාතික පාරිභෝගික මිල දර්ශකය මඟින් වාර්ෂික පදනම මත මනිනු ලබන මතුපිට උද්ධමනය 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 73.7 ක් දක්වා වර්ධනය විය.

ඉල්ලුමෙන් ඇති වූ පීඩනය ඉහළ යාම හේතුවෙන් ප්‍රතිපත්ති පොලී අනුපාතික මාර්තු මාසයේ දී පදනම් අංක 100 කින් ද, අප්‍රේල් මාසයේ දී පදනම් අංක 700 කින් ද, ජූලි මාසයේ දී පදනම් අංක 100 කින් ද ඉහළ යන ලෙස සංශෝධනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදු විය. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙලින් සියයට 14.5 ක් සහ සියයට 15.5 ක් දක්වා 2022 වසරේ ඔක්තෝබර් අග වන විට ඉහළ දමන ලදී. දැඩි මුදල් ප්‍රතිපත්තියේ සැලකිය යුතු බලපෑම සහ දේශීය මුදල් වෙළෙඳපොළේ පවතින අඩු ද්‍රවශීලතා තත්ත්වය පිළිඹිබු කරමින් පුද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2022 වසරේ සැප්තැම්බර් අග වන විට රු. බිලියන 7,576.9 ක් දක්වා පහත වැටුණි. පුළුල් මුදල් සැපයුමේ වර්ධනය ද 2022 වසරේ දී පහත වැටුණි.

2022 වසරේ පළමු මාස නවය තුළ කොටස් වෙළෙඳපොළ මිශ්‍ර කාර්යසාධනයක් පෙන්නුම් කළේය. සමස්ත කොටස් මිල දර්ශකය (ASPI) වසර ආරම්භයේ දී පැවති 12,226 සිට 2022 ජූනි මස අවසානය වන විට 7,342 ක් දක්වා සියයට 39.9 කින් පහත වැටුණු අතර, S & PSL 20 දර්ශකය සමාන කාලපරිච්ඡේදය තුළ දී 4,233 සිට 2,334 දක්වා පහත වැටුණි. කෙසේ වුවද, 2022 වසරේ ජූලි මස සිට සමස්ත කොටස් මිල දර්ශකය සහ S&PSL 20 යන දර්ශක දෙකම ඉහළ යෑමේ තත්ත්වයක් ආරම්භ කළ බැවින් වෙළෙඳපොළ යළි යථාතත්ත්වයට පත් වීමේ ලකුණු පෙන්නුම් කළේය. 2022 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට සමස්ත කොටස් මිල දර්ශකය සහ S&PSL 20 දර්ශකය පිළිවෙලින් 9,931 සහ 3,165 දක්වා ළඟා විය. මේ අතර, වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2021 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට පැවති රු. බිලියන 4,216 ට සාපේක්ෂව 2022 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට රු. බිලියන 4,341 ක් දක්වා ආන්තික වර්ධනයක් වාර්තා කළේය. 2022 වසරේ පළමු කාර්තුව තුළ දී කොටස් වෙළෙඳපොළේ ශුද්ධ විදේශ ප්‍රාග්ධන ගලා යාමක් වාර්තා කළ අතර, 2022 වසරේ දෙවන කාර්තුව තුළ දී ඇ.ඩො. මිලියන 529.5 ක ශුද්ධ විදේශ ප්‍රාග්ධන ගලා ඒමක් වාර්තා විය.

ආනයනයට වඩා වැඩි වේගයකින් අපනයනය වර්ධනය වීම හේතුවෙන් 2021 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 5,999 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වෙළෙඳ හිඟය ඇ.ඩො. මිලියන 4,104.1 ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. කාර්මික අපනයනයන්හි වර්ධනය හේතුවෙන්, 2021 වසරේ පළමු මාස නවය තුළ වාර්තා කළ ඇ.ඩො. මිලියන 8,938.5ට සාපේක්ෂව අපනයන ඉපැයීම් 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ.ඩො. මිලියන 9,981.1 ක් දක්වා සියයට 11.7 කින් වැඩි විය.

විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ හදිසි නොවන ආනයන සඳහා දැඩි ආනයන සීමා පැනවීම හේතුවෙන් ආනයන වියදම් 2021 වසරේ පළමු මාස නවය තුළ වාර්තා කළ ඇ.ඩො. මිලියන 14,937.5 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ.ඩො. මිලියන 14,085.2 ක් දක්වා පහත වැටුණි. සංචාරක ඉපැයීම් ඇ.ඩො. මිලියන 946.4 ක් දක්වා ඉහළ ගිය නමුත්, 2022 වසරේ පළමු මාස නවය තුළ සේවක ප්‍රේෂණ ඇ.ඩො. මිලියන 2,574.1 ක් දක්වා සියයට 43.8 කින් අඩු වී ඇත. චීන මහජන බැංකුවේ ඇ.ඩො. බිලියන 1.4 ක විනිමය හුවමාරු (SWAP) පහසුකම ද ඇතුළුව 2022 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට දළ නිල සංචිතය ඇ.ඩො. බිලියන 1.8 ක් විය.

## 2.2 ආර්ථික වර්ධනය

2021 වසරේ පළමු භාගය තුළ වාර්තා කළ සියයට 9.3 ක ආර්ථික වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ආර්ථිකය සියයට 4.8 කින් තියුණු ලෙස සංකෝචනය විය. 2022 වසරේ පළමු භාගය තුළ දී කෘෂිකර්ම, කර්මාන්ත සහ සේවා යන ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් තුනම සෘණ වර්ධන වේගයෙන් වාර්තා කර ඇත. 2021 වසරේ පළමු භාගයේ දී වූ සියයට 8.8 ක වර්ධනයේ සිට කෘෂිකාර්මික අංශය 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 7.6 කින් සංකෝචනය වූ අතර, වී, එළවළු, තේ වගාවන්, කරදිය ධීවර කර්මාන්තය සහ සත්ත්ව නිෂ්පාදනයේ සිදු වූ සැලකිය යුතු පසුබෑම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. 2021 වසරේ පළමු භාගයේ කර්මාන්ත අංශයේ පැවති සියයට 12.4 ක ධනාත්මක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 7.1 ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇත. රෙදිපිළි, නිමි ඇඳුම් හා සම් භාණ්ඩ නිෂ්පාදනය, විදුලිය, ගෑස්, වායු සමීකරණ සැපයීම සහ ජලය එක් රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදා හැරීම හැර කර්මාන්ත අංශයේ අනෙකුත් සියළුම උප අංශයන්හි පසුබෑම මෙම සංකෝචනය සඳහා හේතු විය. ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා ක්‍රියාකාරකම්, රක්ෂණය, ප්‍රතිරක්ෂණය හා විශ්‍රාම අරමුදල් සහ වෘත්තීයමය සේවාවන්හි සිදු වූ පහත වැටීම හේතුවෙන් 2021 වසරේ පළමු භාගයේ දී පැවති සියයට 5.6 ක වර්ධනයට සාපේක්ෂව සේවා අංශය 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 0.6 කින් සුළු වශයෙන් පහත වැටුණි.

**රූපසටහන 2.2 : දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය 2022 පළමු භාගය**




මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**වගුව 2.1 : ස්ථාවර (2015) මිල ගණන් අනුව ද.දේ.නි.යේ ආංශික සංයුතිය**

රු. මිලියන

| | අංශය | 2019 | 2020 | 2021[ආ] | පළමු භාගය | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2021[ආ] | 2022[අ] | 2021 | 2022 |
| | **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **949,582** | **936,020** | **959,434** | **473,867** | **437,937** | **8.8** | **-7.6** |
| 1 | ධාන්‍ය වගාව (වී හැර) | 13,355 | 21,342 | 23,138 | 12,053 | 9,681 | 31.1 | -19.7 |
| 2 | වී වගාව | 112,919 | 121,663 | 115,242 | 58,580 | 44,539 | 6.6 | -24 |
| 3 | එළවළු වගාව | 102,037 | 111,088 | 109,180 | 53,761 | 47,809 | -3.6 | -11.1 |
| 4 | උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග | 3,275 | 4,021 | 3,728 | 1,874 | 1,844 | -8.5 | -1.6 |
| 5 | පළතුරු වගාව | 77,200 | 81,823 | 75,485 | 36,375 | 34,140 | 15.3 | -6.1 |
| 6 | තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 102,800 | 92,066 | 102,202 | 48,989 | 55,586 | 9.8 | 13.5 |
| 7 | තේ වගාව | 72,733 | 67,971 | 73,743 | 39,772 | 32,793 | 25.5 | -17.5 |
| 8 | වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී) | 1,302 | 1,613 | 1,457 | 719 | 765 | -10.0 | 6.5 |
| 9 | කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැලෑටි වගාව | 90,880 | 93,776 | 97,956 | 45,734 | 46,938 | 5.2 | 2.6 |
| 10 | රබර් වගාව | 24,029 | 24,081 | 25,570 | 13,925 | 12,065 | 21.7 | -13.4 |
| 11 | වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 28,751 | 29,900 | 26,809 | 13,462 | 13,497 | -9.0 | 0.3 |

රු. මිලියන

| | අංශය | 2019 | 2020 | 2021[ආ] | පළමු භාගය | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2021[ආ] | 2022[අ] | 2021 | 2022 |
| 13 | පැල බෝ කිරීම | 772 | 625 | 792 | 305 | 362 | -4.5 | 18.8 |
| 14 | කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 22,969 | 21,313 | 26,303 | 13,261 | 10,674 | 43.2 | -19.5 |
| 15 | වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 43,133 | 42,361 | 41,924 | 20,216 | 19,515 | 6.0 | -3.5 |
| 16 | කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව | 141,700 | 111,307 | 112,825 | 55,919 | 51,752 | 0.2 | -7.5 |
| 17 | මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීවී වගාව | 21,444 | 24,166 | 24,742 | 11,247 | 11,406 | 16.1 | 1.4 |
| | **කර්මාන්ත** | **3,933,728** | **3,724,314** | **3,933,782** | **1,975,268** | **1,835,491** | **12.4** | **-7.1** |
| 18 | පතල් හා කැණීම් කර්මාන්තය | 318,658 | 284,079 | 288,061 | 143,973 | 125,075 | 9.0 | -13.1 |
| 19 | ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය | 929,371 | 980,863 | 1,015,085 | 503,523 | 453,628 | 6.0 | -9.9 |
| 20 | රෙදිපිළි, නිමි ඇඳුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදනය | 469,028 | 416,312 | 475,377 | 244,469 | 266,632 | 23.7 | 9.1 |
| 21 | ගෘහභාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 36,321 | 32,831 | 35,580 | 16,741 | 14,726 | 17.3 | -12 |
| 22 | කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන,මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය | 54,064 | 51,896 | 56,812 | 31,322 | 30,003 | 19.7 | -4.2 |
| 23 | අඟුරු සහ ඛනිජතෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන | 24,630 | 22,108 | 15,492 | 7,946 | 3,450 | -16.6 | -56.6 |
| 24 | රසායනික ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 90,144 | 92,157 | 95,794 | 48,929 | 43,488 | 16.6 | -11.1 |
| 25 | රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 98,429 | 81,182 | 97,439 | 43,444 | 37,307 | 44.8 | -14.1 |
| 26 | ලෝහමය නොවන වෙනත් ඛණිජ නිෂ්පාදන | 107,062 | 102,685 | 119,988 | 59,602 | 50,690 | 25.3 | -15 |
| 27 | ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 80,312 | 77,859 | 81,174 | 39,074 | 32,482 | 20.6 | -16.9 |
| 28 | යන්ත්‍රෝපකරණ නිෂ්පාදන | 66,114 | 65,187 | 73,090 | 28,450 | 27,640 | 18.4 | -2.8 |
| 29 | ගෘහ භාණ්ඩ නිෂ්පාදන | 95,470 | 81,651 | 82,696 | 47,970 | 44,751 | 18.0 | -6.7 |
| 30 | වෙනත් නිෂ්පාදන කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවි කිරීම | 96,432 | 87,586 | 101,050 | 51,298 | 48,028 | 26.5 | -6.4 |
| 31 | විදුලිය, ගෑස්, වායු හා වායු සමීකරණ සැපයීම | 184,041 | 180,176 | 187,763 | 90,613 | 92,870 | 0.1 | 2.5 |
| 32 | ජලය එක් රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදා හැරීම | 14,701 | 15,431 | 11,332 | 5,810 | 6,368 | -27.5 | 9.6 |
| 33 | මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය | 29,253 | 28,960 | 27,992 | 12,935 | 12,794 | -7.1 | -1.1 |
| | ඉදිකිරීම් කර්මාන්තය | 1,239,700 | 1,123,351 | 1,169,059 | 599,169 | 545,559 | 12.4 | -8.9 |
| 34 | **සේවාවන්** | **7,307,036** | **7,165,986** | **7,405,262** | **3,580,336** | **3,559,173** | **5.6** | **-0.6** |
| 35 | තොග හා සිල්ලර වෙළඳාම | 1,636,752 | 1,650,889 | 1,678,813 | 836,018 | 847,013 | 2.5 | 1.3 |
| 36 | මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම | 1,398,230 | 1,313,312 | 1,324,646 | 662,196 | 656,318 | 8.9 | -0.9 |
| 37 | තැපැල් හා කුරියර් සේවාවන් | 17,099 | 17,620 | 18,714 | 8,950 | 9,614 | 8.6 | 7.4 |
| 38 | නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 216,976 | 128,556 | 130,474 | 66,185 | 84,955 | -7.1 | 28.4 |
| 39 | ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු | 42,752 | 43,841 | 42,161 | 23,601 | 21,579 | 0.0 | -8.6 |
| 40 | විදුලි සංදේශ සේවාවන් | 103,325 | 118,845 | 138,238 | 68,291 | 73,952 | 19.3 | 8.3 |
| 41 | පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් | 175,634 | 194,893 | 243,971 | 120,298 | 124,751 | 22.6 | 3.7 |
| 42 | මූල්‍ය සේවා ක්‍රියාකාරකම් හා අතිරේක මූල්‍ය සේවා | 510,367 | 557,357 | 597,267 | 293,758 | 258,452 | 8.1 | -12 |
| 43 | රක්ෂණය, ප්‍රති රක්ෂණය හා විශ්‍රාම අරමුදල් | 120,550 | 117,075 | 125,326 | 57,833 | 51,739 | 10.0 | -10.5 |
| 44 | නිවාස අයිතිය හා දේපල වෙළඳාම | 610,231 | 604,259 | 630,619 | 302,470 | 300,914 | 5.5 | -0.5 |
| 45 | වෘත්තීයමය සේවාවන් | 297,462 | 287,781 | 301,890 | 128,181 | 118,616 | 8.0 | -7.5 |
| 46 | රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව, අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂාව | 605,938 | 616,176 | 626,013 | 291,075 | 299,444 | 1.2 | 2.9 |
| 47 | අධ්‍යාපනය | 283,605 | 284,751 | 290,487 | 149,433 | 153,772 | 6.5 | 2.9 |
| 48 | සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් | 235,136 | 246,735 | 260,499 | 114,101 | 109,246 | 3.3 | -4.3 |
| 49 | වෙනත් පෞද්ගලික සේවාවන් | 1,052,980 | 983,900 | 996,144 | 457,945 | 448,808 | 3.9 | -2 |
| | **සමස්ත එකතු කළ අගය (GVA), මූලික මිළ ගණන් අනුව** | **12,190,346** | **11,826,320** | **12,298,479** | **6,029,470** | **5,832,601** | **8.0** | **-3.3** |
| | **(+) භාණ්ඩ හා සේවා මත අය කරන බදු (-) සහනාධාර** | **1,015,930** | **921,395** | **873,323** | **529,305** | **412,614** | **27.7** | **-22** |
| | **දළ දේශීය නිෂ්පාදිතය (GDP), වෙළෙඳපොළ මිල** | **13,206,276** | **12,747,715** | **13,171,802** | **6,558,775** | **6,245,215** | **9.3** | **-4.8** |

මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
[අ] තාවකාලික
[ආ] සංශෝධිත

2021 වසරේ පළමු භාගයේ දී පැවති සියයට 27.7 ක වැඩිවීමට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී බදු සහ සහනාධාර අතර වෙනසේ එකතු කළ අගය සියයට 22.0 කින් සැලකිය යුතු ලෙස පහත වැටී ඇත.

### කෘෂිකර්මය

ද.දේ.නි. යට සියයට 7.0 ක දායකත්වයක් දක්වන කෘෂිකාර්මික අංශය, 2021 වසරේ පළමු භාගයේ දී පැවති සියයට 8.8 ක ධනාත්මක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 7.6 ක ඍණ වර්ධනයක් වාර්තා කර ඇත. වී, එළවළු, තේ වගාවන්, කරදිය ධීවර කර්මාන්තය සහ සත්ත්ව නිෂ්පාදනය ආදී උප අංශයන්හි පසුබැස්ම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, පොල්, කුළු බඩු වගාවන්, මිරිදිය ධීවර කර්මාන්තය, පැල බෝ කිරීම, වෙනත් බහුවාර්ෂික භෝග සහ වෙනත් පානීය භෝග වගාවන්හි ධනාත්මක වර්ධනයක් සිදු වී ඇත.

### වී නිෂ්පාදනය

වී වගාවේ එකතු කළ අගය 2021 වසරේ පළමු භාගය තුළ වාර්තා වූ සියයට 6.6 ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 24.0 කින් සංකෝචනය වී ඇත. සමස්ත වී නිෂ්පාදනය 2021 වසරේ පැවති මෙට්‍රික් ටොන් මිලියන 5.1 ට සාපේක්ෂව 2022 වසරේ දී මෙට්‍රික් ටොන් මිලියන 2.9 ක් දක්වා තියුණු ලෙස

**රූපසටහන 2.3 : කෘෂිකාර්මික අංශයේ සංයුතිය 2022 පළමු භාගය**




මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පහත බසිනු ඇත. 2021/22 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 1.9 ක් වූ අතර, 2022 වසරේ යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 1.0 ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2020/21 මහ කන්නයේ අස්වද්දන ලද හෙක්ටයාර් 770,240 ක භූමි ප්‍රමාණයට සාපේක්ෂව 2021/22 මහ කන්නයේ අස්වද්දන ලද භූමි ප්‍රමාණය හෙක්ටයාර් 775,846 ක් දක්වා වැඩි වී ඇත.

### තේ, රබර් සහ පොල්

2021 වසරේ පළමු භාගයට සාපේක්ෂව තේ සහ රබර් උප අංශයන්හි එකතු කළ අගය 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී පිළිවෙලින් සියයට 17.5 කින් සහ සියයට 13.4 කින් අඩු වූ අතර, තෙල් සහිත පළතුරු බෝග උප අංශය සියයට 13.5 කින් වර්ධනය විය. 2021 වසරේ පළමු මාස නවය තුළදී වාර්තා වූ කිලෝග්‍රෑම් මිලියන 234.7 ක තේ නිෂ්පාදනයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 192.4 ක් දක්වා සියයට 18.0 කින් පහත වැටුණි. රසායනික පොහොර ආනයනය තහනම් කිරීම සහ ඉන්පසුව රුසියා - යුක්රේන් ගැටුම නිසා කෘෂිකාර්මික පොහොරවල මිල ඉහළ යෑම සහ රුපියල විශාල ලෙස අවප්‍රමානය වීම මෙම පහත බැසීමට ප්‍රධාන වශයෙන් හේතු විය. එසේ වුවද, රුපියල අවප්‍රමානය වීම සහ ගෝලීය භාණ්ඩ මිළ ඉහළ යාම හේතුවෙන් 2022 වසරේ පළමු මාස නවය තුළ දී කොළඹ තේ වෙන්දේසියේ දී තේ කිලෝග්‍රෑමයක මාසික සාමාන්‍ය මිල රු. 1,617.70 ක් දක්වා සියයට 153.5 කින් ඉහළ ගියේය. එසේම පත්‍ර වැටීමේ දිලීර රෝගය පැතිරීම හේතුවෙන් 2022 වසරේ පළමු මාස අට තුළදී රබර් නිෂ්පාදනය. 2021 සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව කිලෝග්‍රෑම් මිලියන 48.5 ක් දක්වා සියයට 13.8 කින් පහත වැටුණි. එසේ වුවද, රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් කොළඹ රබර් වෙන්දේසියේ 2021 වසර අවසානය වන විට රු. 700.25 ක් ව පැවති ක්‍රේප් රබර් (1X) කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය මිල රු. 814.00 ක් දක්වා සියයට 16.2 කින් වර්ධනය වී ඇත. 2022 වසරේ පැවති හිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් පොල් නිෂ්පාදනය, 2021 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා කළ ගෙඩි මිලියන 2,035.2 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ගෙඩි මිලියන 2,284.6 ක් දක්වා සියයට 12.3 කින් වැඩි වී ඇත.

### ධාන්‍ය වර්ග, එළවළු, පළතුරු, කුළුබඩු සහ ඖෂධ බෝග

ප්‍රධාන වශයෙන් පොහොර හිඟකම ඇතුළු අනෙකුත් කරුණු හේතුවෙන් 2022 වසරේ පළමු භාගය තුළ දී අගය එකතු කළ වටිනාකම මත ධාන්‍ය වගා කිරීමේ උප අංශය සියයට 19.7 කින් පහත බැස ඇත. එසේම, 2022 වසරේ පළමු භාගය තුළ දී අගය එකතු කළ වටිනාකම මත එළවළු සහ පළතුරු වගා කිරීමේ උප අංශ පිළිවෙලින් සියයට 11.1 කින් සහ සියයට 6.1 කින් පහත බැස ඇත. 2021 වසරේ පළමු භාගය තුළ දී වාර්තා වූ සියයට 5.2 ක වර්ධනයට සාපේක්ෂව එකතු කළ වටිනාකම මත කුළුබඩු, සුවඳ දෙන භෝග, ඖෂධ සහ ඖෂධ නිෂ්පාදන 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 2.6 කින් වර්ධනය විය.

### ධීවර හා පශු සම්පත්

කරදිය ධීවර කර්මාන්තය හා කරදිය ජලජීවී වගා උප අංශය අගය එකතු කළ වටිනාකම මත 2021 වසරේ පළමු භාගය

තුළ දී වාර්තා කළ සියයට 0.2 ක ආන්තික වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 7.5 කින් සංකෝචනය වී ඇත. එසේ වුවද, මිරිදිය ධීවර කර්මාන්තය හා මිරිදිය ජලජීවී වගා උප අංශය 2021 වසරේ පළමු භාගය තුළ වාර්තා කළ සියයට 16.1 ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 1.4 කින් වර්ධනය විය. මත්ස්‍ය නිෂ්පාදනය, 2021 වසරේ පළමු මාස අටක කාලපරිච්ඡේදය තුළ දී වාර්තා කළ මෙට්‍රික් ටොන් 284.2 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී මෙට්‍රික් ටොන් 256.6 ක් දක්වා සියයට 9.7 කින් අඩු වී ඇත. 2021 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 15.6 ක වර්ධනයට සාපේක්ෂව සත්ත්ව නිෂ්පාදන උප අංශය 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී අගය එකතු කළ වටිනාකම මත සියයට 6.5 කින් පහත බැස ඇත.

## කර්මාන්ත හා නිෂ්පාදන

කර්මාන්ත අංශය, 2021 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ සියයට 12.4 ක ධනාත්මක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 7.1 ක ඍණ වර්ධනයක් වාර්තා කර ඇත. මෙම පසුබැස්ම සඳහා ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් (සියයට 8.9), ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය (සියයට 9.9) සහ පතල් හා කැණීම් (සියයට 13.1) යන අංශවල පහත වැටීම හේතු විය. අනෙකුත් ලෝහමය නොවන නිෂ්පාදනය (සියයට 15.0), රසායනික නිෂ්පාදනය සහ මූලික ඖෂධමය නිෂ්පාදන (සියයට 11.1), රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනය (සියයට 14.1), වෙනත් නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීම හා සවි කිරීම (සියයට 6.4) වැනි උප අංශයන් 2022 වසරේ පළමු භාගය තුළ දී සංකෝචනය විය. එසේම, 2022 වසරේ පළමු භාගය තුළ දී මූලික ලෝහ වර්ග නිෂ්පාදනය සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදනය (සියයට 16.9) අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදනය (සියයට 56.6), ගෘහ භාණ්ඩ නිෂ්පාදනය (සියයට 6.7), ගෘහ භාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන (සියයට 12.0), කඩදාසි ද්‍රව්‍ය නිෂ්පාදනය, මුද්‍රණ කටයුතු සහ ශ්‍රව්‍ය දෘශ්‍ය තැටි නැවත නිෂ්පාදනය (සියයට 4.2), යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය (සියයට 2.8) සහ මලාපවහන කටයුතු, කසල කළමණාකරණය සහ ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාකාරකම් (සියයට 1.1) යන උප අංශයන් ඍණ වර්ධනයක් වාර්තා කර ඇත. එසේ වුවද, රෙදිපිළි, නිමි ඇඳුම් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය (සියයට 9.1), ජලය ඒකරැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදාහැරීම (සියයට 9.6) යන අංශ 2022 වසරේ පළමු භාගය තුළ දී ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත.

2022 වසරේ පළමු භාගය තුළ දී විදුලිය, ගෑස්, වාෂ්ප හා වායුසමීකරණ සැපයුමේ අගය එකතු කළ වටිනාකම සියයට 2.5 ක ආන්තික වර්ධනයක් වාර්තා කර ඇත. සමස්ත බලශක්ති උත්පාදනය 2021 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා කළ ගිගාවොට් පැය 11,107 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ගිගාවොට් පැය 10,744 ක් දක්වා සියයට 3.3 කින් පහත වැටී ඇත. ඉන්ධන සහ අමුද්‍රව්‍ය හිඟකම සමඟ කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම් හි පසු බැස්ම හේතුවෙන් 2021 වසරේ පළමු මාස අටට සාපේක්ෂව කර්මාන්ත අංශය සඳහා 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී අලෙවි කළ විදුලි ඒකක ප්‍රමාණය ගිගාවොට් පැය 2,957 ක් දක්වා සියයට 6.9 කින් පහත බැස ඇත. ජල, තාප (ඉන්ධන), තාප (ගල් අඟුරු) හා සුළං ඇතුළු සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති වශයෙන් වන උත්පාදන අනුපාතය 2021 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා කළ 28:18:38:16 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී 28:19:37:16 දක්වා ආන්තික වශයෙන් අවාසිදායක ලෙස වෙනස් විය.

**රූපසටහන 2.4 : කර්මාන්ත අංශයේ සංයුතිය 2022 පළමු භාගය**




මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**රූපසටහන 2.5 : නිෂ්පාදන අංශයේ සංයුතිය 2022 පළමු භාගය**




මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## සේවා අංශය

සේවා අංශය, 2021 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ සියයට 5.6 ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 0.6 කින් සංකෝචනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා හා අතිරේක මූල්‍ය සේවා (සියයට 12.0), රක්ෂණ, ප්‍රතිරක්ෂණ හා විශ්‍රාම අරමුදල් (සියයට 10.5) සහ වෘත්තීයමය සේවාවන් (සියයට 7.5) යන අංශවල පසුබැස්ම හේතු වී ඇත. ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම (සියයට 0.9), නිවාස අයිතිය හා දේපල වෙළඳාම් කටයුතු (සියයට 0.5), අනෙකුත් පෞද්ගලික සේවාවන් (සියයට 2.0) සෞඛ්‍ය හා නේවාසික රැකවරණ (සියයට 4.3), ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය හා විකාශනය (සියයට 8.6) යන උප අංශයන් ද 2022 වසරේ පළමු භාගය තුළ

දී පසුබෑමට ලක් විය. එසේ වුවද, තොග සහ සිල්ලර වෙළෙඳාම (සියයට 1.3), නවාතැන් හා ආහාර පාන සැපයීමේ සේවාවන් (සියයට 28.4), රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂක (සියයට 2.9), පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය හා ඒ සම්බන්ධ කාර්යයන් (සියයට 3.7), අධ්‍යාපනය (සියයට 2.9 ), විදුලි සංදේශ (සියයට 8.3) සහ තැපැල් හා කුරියර් සේවා (සියයට 7.4) යන උප අංශ 2022 වසරේ පළමු භාගය තුළ දී වර්ධනය විය.

### තොග සහ සිල්ලර වෙළෙඳාම, භාණ්ඩ ප්‍රවාහනය, ගබඩා පහසුකම් හා මගී සේවා

තොග සහ සිල්ලර වෙළෙඳාම් කටයුතු අගය එකතු කළ වටිනාකම මත 2021 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ සියයට 2.5 ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 1.3 කින් ප්‍රසාරණය විය. ප්‍රවාහන අංශය, 2021 වසරේ පළමු භාගයේ පැවති සියයට 8.9 ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 0.9 ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇත. 2021 වසරේ පළමු මාස නවය තුළ දී ලියාපදිංචි කළ නව වාහන සංඛ්‍යාව 25,505 ක් වූ අතර එය 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී 16,690 ක් දක්වා සියයට 34.6 කින් විශාල වශයෙන් පහත වැටී ඇත. විදේශ විනිමය ද්‍රවශීලතාවය පාලනය කිරීම සඳහා රජය විසින් වාහන මත පනවන ලද ආනයන සීමාවන් මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

2022 වසරේ පළමු මාස නවය තුළ දී මෝටර් කාර් ලියාපදිංචි කිරීම සියයට 60.7 කින් පහළ ගිය අතර, මෙම කාලපරිච්ඡේදය තුළ දී ත්‍රීරෝද රථ, භාණ්ඩ ප්‍රවාහනය රථ සහ ගොඩබිම් වාහන ලියාපදිංචි කිරීම පිළිවෙළින් සියයට 98.5 කින්, සියයට 48.7 කින් සහ සියයට 43.9 කින් අඩු විය. එසේ වුවද, 2022 වසරේ පළමු මාස නවය තුළ දී යතුරුපැදි, බස් රථ, ද්විත්ව කාර්ය රථ ලියාපදිංචිය පිළිවෙලින් සියයට 17.2 කින්, සියයට 13.9 කින් සහ සියයට 13.8 කින් වැඩි වී ඇත.

2021 වසරේ පළමු මාස නවය තුළ දී මෙහෙයවන ලද මුළු බහාලුම් සංඛ්‍යාව වන අඩි 20 බහාලුම් ඒකක (TEUs) මිලියන 5.4 ට සාපේක්ෂව, 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී එම සංඛ්‍යාව මිලියන 5.2 ක් දක්වා සියයට 2.5 කින් අඩු විය. දේශීය, ප්‍රතිනැව්ගත කිරීම් සහ නැවත ගබඩා කිරීම් සඳහා 2022 වසරේ පළමු මාස නවය තුළ දී මෙහෙයවන ලද බහාලුම් සංඛ්‍යාව පිළිවෙළින් සියයට 11.0 කින්, සියයට 0.8 කින් සහ සියයට 0.4 කින් අඩු වී ඇත. සමස්ත භාණ්ඩ මෙහෙයුම් සංඛ්‍යාව 2021 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා කළ මෙට්‍රික් ටොන් මිලියන 82.2 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී මෙට්‍රික් ටොන් මිලියන 78.4 ක් දක්වා සියයට 4.7 කින් අඩු විය. 2022 වසරේ දී සැපයුම් අංශයෙන් ගෝලීය ආර්ථිකයට ඇති වූ කම්පන මෙම පහත වැටීමට හේතු විය හැක.

### නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා

නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා උප අංශය 2021 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ සියයට 7.1 ක සංකෝචනයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 28.4 කින් වර්ධනය විය. සංචාරකයින්ගේ පැමිණීම, 2021 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා කළ 37,924 ක සංචාරකයින්ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී 526,232 ක් දක්වා වැඩි වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2021 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා කළ ඇ.ඩො. මිලියන 98.8 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සංචාරක ඉපැයීම් ඇ.ඩො. මිලියන 946.4 ක් දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය.

### විදුලි සංදේශ, පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය, තැපැල් සේවා

විදුලි සංදේශ කර්මාන්තයේ පවතින විදේශ විනිමය ආශ්‍රිත පිරිවැය සංරචකයන් ඉහළයාම මධ්‍යයේ, විදුලි සංදේශ උප අංශයේ අගය එකතු කළ වටිනාකම 2022 වසරේ පළමු භාගය තුළ දී සියයට 8.3 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කර ඇත. විදුලි බිඳවැටීම්, ඉන්ධන හිඟයන් සහ විදේශ විනිමය රෙගුලාසි ඇතුළු විවිධාකාර අභියෝග මධ්‍යයේ වුවද 2022 වසරේ පළමු භාගය තුළ දී පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සියයට 3.7 කින් පුළුල් විය. එසේම, තැපැල් හා කුරියර් සේවාවන් 2021 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 7.4 කින් වර්ධනය විය.

**රූපසටහන 2.6 : සේවා අංශයේ සංයුතිය 2022 පළමු භාගය**




මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 2.2 වගුව : සේවා අංශයේ තෝරාගත් දර්ශකයන්

| දර්ශකය | 2018 | 2019 | 2020 | 2021 [අ] | 2021 [අ] | 2022 [අ] |
|---|---|---|---|---|---|---|
| **වරාය සේවා** | | | | | ජන.-සැප්. | ජන.-සැප්. |
| පැමිණි නැව් සංඛ්‍යාව | 4,874 | 4,707 | 4,337 | 4,180 | 3,143 | 2,964 |
| මෙහෙයවන ලද මුළු භාණ්ඩ (මෙ.ටො. '000) | 104,934 | 106,979 | 102,908 | 109,369 | 82,235 | 78,411 |
| මෙහෙයවන ලද මුළු බහාළුම් (TEU '000) | 7,047 | 7,228 | 6,855 | 7,249 | 5,370 | 5,235 |
| ප්‍රතිනැව්ගත කිරීම (TEU '000) [ආ] | 5,704 | 5,955 | 5,765 | 6,050 | 4,327 | 4,291 |
| **විදුලි සංදේශ අංශය** | | | | | ජුනි අවසානයට | ජුනි අවසානයට |
| ස්ථාවර දුරකථන (සංඛ්‍යාව '000) | 2,485 | 2,300 | 2,613 | 1,264 | 1,252 | 1,266 |
| ජංගම දුරකථන (සංඛ්‍යාව '000) | 32,528 | 32,884 | 28,739 | 29,959 | 29,049 | 29,561 |
| රැහැන් රහිත දුරකථන (සංඛ්‍යාව '000) | 1,269 | 1,055 | 1,367 | 1,587 | 1,618 | 1,765 |
| අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් ග්‍රාහකයන් (සංඛ්‍යාව '000) | 10,563 | 13,408 | 17,524 | 22,236 | 20,629 | 22,516 |
| **සෞඛ්‍ය අංශය** | | | | | ජුනි අවසානයට | ජුනි අවසානයට |
| පෞද්ගලික රෝහල් | 191 | 207 | 217 | 233 | 227 | 243 |
| රජයේ රෝහල් | 612 | 603 | 609 | 618 | 609 | 617 |
| ඇඳන් සංඛ්‍යාව (රජයේ) | 76,824 | 77,964 | 77,121 | 78,228 | 77,121 | 78,228 |
| වෛද්‍යවරුන් සංඛ්‍යාව (රජයේ) | 19,692 | 18,130 | 19,615 | 18,992 | 18,992 | 20,209 |
| හෙදියන් සංඛ්‍යාව (රජයේ) | 34,714 | 38,276 | 37,634 | 38,743 | 38,743 | 39,091 |
| **මූල්‍ය අංශය** | | | | | සැප්. අවසානයට | සැප්. අවසානයට |
| බැංකු ශාඛා හා අනෙකුත් සේවා මධ්‍යස්ථාන | 6,882 | 7,387 | 3,619 | 7,414 | 7,412 | 7,417 |
| ලියාපදිංචි මූල්‍ය සමාගම් | 43 | 42 | 40 | 39 | 39 | 37 |
| ලියාපදිංචි කල්බදු සමාගම් | 5 | 4 | 3 | 3 | 3 | 2 |
| | | | | | ජුනි අවසානයට | ජුනි අවසානයට |
| ණය කාඩ්පත් (ක්‍රියාකාරී) | 1,710,671 | 1,854,103 | 1,984,525 | 2,054,985 | 2,045,716 | 2,082,685 |
| **සංචාරක අංශය** | | | | | ජන.-සැප්. | ජන.-සැප්. |
| පැමිණි සංචාරක සංඛ්‍යාව | 2,333,796 | 1,913,702 | 507,704 | 194,495 | 37,924 | 526,232 |
| සංචාරක ඉපයීම් (ඇ.ඩො. මිලියන) | 4,381 | 3,607 | 682 | 507 | 99 | 946 |
| හෝටල් කාමර නැවතුම් අනුපාතය | 72.8 | ලැ.නො. | 15.0 | 19 | ලැ.නො. | ලැ.නො. |
| **ප්‍රවාහන සේවා (අලුතින් ලියාපදිංචි කිරීම)** | | | | | ජන.-සැප්. | ජන.-සැප්. |
| බස් රථ | 2,957 | 1,613 | 578 | 281 | 237 | 270 |
| මෝටර් කාර් | 80,776 | 38,232 | 21,021 | 3,495 | 2,905 | 1,141 |
| ලොරි [ඇ] | 16,931 | 3,738 | 3,941 | 4,432 | 3,241 | 1,663 |
| යතුරු පැදි | 339,763 | 284,301 | 151,634 | 8,011 | 6,031 | 7,067 |
| ත්‍රිරෝද රථ | 20,063 | 15,490 | 7,150 | 2,093 | 2,080 | 32 |
| ට්‍රැක්ටර් සහ ට්‍රේලර්ස් [ඈ] | 10,282 | 7,666 | 8,302 | 14,764 | 10,415 | 5,841 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

[අ] තාවකාලික
[ආ] නැවත (ඇසිරීම්) ඇතුළත් වේ.
[ඇ] විශේෂ කාර්ය වාහන, මෝටර් ලොරි සහ ලොරි අනෙකුත්
[ඈ] රෝද හතරේ ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර් සහ ට්‍රේලර්ස් මෙහි ඇතුළත් වේ.
ලැ.නො.- ලැබී නොමැත

**වගුව 2.3 : සංචාරක අංශයේ කාර්යසාධනය**

| මාසය | සංචාරකයින්ගේ පැමිණීම | | | | | සංචාරක ඉපැයීම (ඇ.ඩො. මිලියන) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2018** | **2019** | **2020** | **2021** | **2022** (අ) | **2018** | **2019** | **2020** | **2021** (ආ) | **2022** (අ) |
| ජනවාරි | 238,924 | 244,239 | 228,434 | 1,682 | 82,327 | 448.5 | 460.3 | 307.0 | 4.4 | 148.0 |
| පෙබරවාරි | 235,618 | 252,033 | 207,507 | 3,366 | 96,507 | 442.3 | 475.0 | 278.9 | 8.8 | 173.6 |
| මාර්තු | 233,382 | 244,328 | 71,370 | 4,581 | 106,500 | 438.1 | 460.5 | 95.9 | 11.9 | 191.5 |
| අප්‍රේල් | 180,429 | 166,975 | - | 4,168 | 62,980 | 338.7 | 314.7 | - | 10.9 | 113.3 |
| මැයි | 129,466 | 37,802 | - | 1,497 | 30,207 | 243.0 | 71.2 | - | 3.9 | 54.3 |
| ජූනි | 146,828 | 63,072 | - | 1,614 | 32,856 | 275.6 | 118.9 | - | 4.2 | 59.1 |
| ජූලි | 217,829 | 115,701 | - | 2,429 | 47,293 | 408.9 | 218.1 | - | 6.3 | 85.1 |
| අගෝස්තු | 200,359 | 143,587 | - | 5,040 | 37,760 | 376.1 | 270.6 | - | 13.1 | 67.9 |
| සැප්තැම්බර් | 149,087 | 108,575 | - | 13,547 | 29,802 | 279.8 | 204.6 | - | 35.3 | 53.6 |
| ඔක්තෝබර් | 153,123 | 118,743 | - | 22,771 | 42,026 | 287.4 | 223.8 | - | 59.3 | 75.6 |
| නොවැම්බර් | 195,582 | 176,984 | - | 44,294 | - | 367.1 | 333.6 | - | 115.4 | - |
| දෙසැම්බර් | 253,169 | 241,663 | 393 | 89,506 | - | 475.2 | 455.5 | 0.5 | 233.3 | - |
| එකතුව | **2,333,796** | **1,913,702** | **507,704** | **194,495** | **568,258** | **4,380.7** | **3,606.8** | **682.4** | **506.9** | **1,022.0** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

## මූල්‍ය සේවා, රක්ෂණ හා දේපල වෙළෙඳාම් සහ වෙනත් සේවා

මූල්‍ය හා සහායක මූල්‍ය සේවා අංශයේ අගය එකතු කළ වටිනාකම 2021 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 8.1 ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 12.0 කින් අඩු විය. 2022 වසරේ පළමු භාගයේ දී රක්ෂණ උප අංශයද සියයට 10.5 ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇත. රක්ෂණ ක්ෂේත්‍රයේ මුළු වත්කම් වටිනාකම 2021 ජූනි මස අවසානයට පැවති රු. බිලියන 836.9 ට සාපේක්ෂව 2022 වසරේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 902.7 ක් දක්වා සියයට 7.9 කින් වර්ධනය විය.

2021 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 5.5 ක ප්‍රසාරණයට සාපේක්ෂව නිවාස අයිතිය සහ දේපල වෙළඳාම් කටයුතු 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 0.5 කින් සංකෝචනය විය. වෘත්තීයමය සේවාවන්, සහ සෞඛ්‍ය සහ නේවාසික රැකවරණ සේවාවන් යන උප අංශයන් 2022 වසරේ පළමු භාගයේ දී පිළිවෙළින් සියයට 7.5 කින් සහ සියයට 4.3 කින් සංකෝචනය වූ අතර රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂක සහ අධ්‍යාපනය යන උප අංශයන් දෙකම සියයට 2.9 කින් වර්ධනය විය.

## සේවා වියුක්තිය

ආර්ථික ක්‍රියාකාරකම්වල සිදුවූ මන්දගාමීත්වය පිළිඹිබු කරමින්, 2022 වසරේ පළමු කාර්තුවේ සියයට 4.3 ක්ව පැවති සේවා වියුක්ති අනුපාතය 2022 වසරේ දෙවන කාර්තුව තුළ සියයට 4.6 ක් දක්වා ඉහළ ගොස් ඇත. 2022 වසරේ පළමු කාර්තුවේ දී සියයට 51.2 ක්ව පැවති ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 2022 වසරේ දෙවන කාර්තුව තුළ දී සියයට 50.1 ක් දක්වා පහත වැටී ඇත.

**රූපසටහන 2.7 : ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය සහ සේවා වියුක්තිය**




මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**වගුව 2.4 : ද.දේ.නි. වර්ධනයේ ආංශික ව්‍යාප්තිය (%)**

| අංශය | 2017 | 2018 | 2019 | 2020 | 2021(සං) | පළමු භාගය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2021(සං) | 2022(අ) |
| **කෘෂිකර්මාන්තය** | **-1.8** | **6.3** | **0.5** | **-1.4** | **2.5** | **8.8** | **-7.6** |
| තේ වගාව | 4.4 | 2.0 | -3.3 | -6.5 | 8.5 | 25.5 | -17.5 |
| වී වගාව | -9.7 | 45.2 | 6.2 | 7.7 | -5.3 | 6.6 | -24.0 |
| රබර් වගාව | 4.3 | 1.8 | -7.8 | 0.2 | 6.2 | 21.7 | -13.4 |
| ධාන්‍ය වගාව | -10.0 | 2.1 | -9.0 | 59.8 | 8.4 | 31.1 | -19.7 |
| එළවළු වගාව | -5.5 | 0.5 | -2.9 | 8.9 | -1.7 | -3.6 | -11.1 |
| සත්ත්ව නිෂ්පාදන | 11.2 | 4.1 | -4.5 | -3.7 | 13.2 | 15.6 | -6.5 |
| වන වගාව, දව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 12.0 | -13.6 | -3.3 | -1.8 | -1.0 | 6.0 | -3.5 |
| ධීවර කර්මාන්තය | 0.5 | 0.2 | -4.4 | -17.0 | 1.5 | 2.5 | -6.0 |
| **කර්මාන්ත** | **13.0** | **-1.1** | **-4.1** | **-5.3** | **5.6** | **12.4** | **-7.1** |
| පතල් හා කැණීම් | 11.7 | -2.7 | -1.2 | -10.9 | 1.4 | 9.0 | -13.1 |
| නිෂ්පාදන ක්‍රියාකාරකම් | 4.8 | 3.8 | 2.0 | -2.6 | 1.2 | 14.6 | -6.2 |
| අනෙකුත් කර්මාන්ත | 4.6 | 7.1 | 4.3 | -1.5 | 0.02 | -2.7 | 2.4 |
| ඉදිකිරීම් | 27.3 | -8.0 | -14.8 | -9.4 | 4.1 | 12.4 | -8.9 |
| **සේවා** | **3.6** | **4.3** | **2.9** | **-1.9** | **3.3** | **5.6** | **-0.6** |
| තොග හා සිල්ලර වෙළඳාම | 3.8 | 4.7 | 3.6 | 0.9 | 1.7 | 2.5 | 1.3 |
| ප්‍රවාහනය හා ගබඩා කිරීම | 3.3 | 2.1 | 2.0 | -6.1 | 0.9 | 8.9 | -0.9 |
| නවාතැන් හා ආහාර සැපයීමේ ක්‍රියාකාරකම් | 3.1 | 5.1 | -6.0 | -40.8 | 1.5 | -7.1 | 28.4 |
| තොරතුරු හා සන්නිවේදනය | 11.1 | 7.2 | 12.0 | 11.2 | 18.7 | 18.6 | 3.8 |
| මූල්‍ය හා රක්ෂණ ක්‍රියාකාරකම් | 7.5 | 16.6 | 1.2 | 6.9 | 7.1 | 8.4 | -11.8 |
| නිශ්චල දේපල ක්‍රියාකාරකම් | 7.3 | 5.6 | 5.1 | -1.0 | 4.4 | 5.5 | -0.5 |
| වෘත්තීයමය සේවා | 1.9 | 3.8 | 5.4 | -3.3 | 4.9 | 8.0 | -7.5 |
| අධ්‍යාපන, සෞඛ්‍ය හා සමාජයීය ක්‍රියාකාරකම් | 5.4 | 1.4 | 4.6 | 2.5 | 3.7 | 5.1 | -0.2 |
| රාජ්‍ය පරිපාලන හා ආරක්ෂාව | -4.3 | 1.9 | 0.8 | 1.7 | 1.6 | 1.2 | 2.9 |
| අනෙකුත් සේවා (ස්වයං සේවා හැර) | 2.9 | 1.5 | 2.0 | -6.6 | 1.2 | 3.9 | -2.0 |
| ද.දේ.නි. | **6.5** | **2.3** | **-0.2** | **-3.5** | **3.3** | **9.3** | **-4.8** |

මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික
(සං) සංශෝධිත

## 2.3 මුදල් අංශයේ වර්ධනයන්

2021 වසරේ අගෝස්තු මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාත වැඩි කිරීමෙන් පසු 2022 වසරේ මාර්තු මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාත යලි පදනම් අංක 100 කින් වැඩි කරමින් මහ බැංකුව මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් දැඩි කළේය. ආර්ථිකය ස්ථාවර කිරීමේ අරමුණින් ප්‍රතිපත්ති පොලී අනුපාත සැලකිය යුතු ලෙස වැඩි කිරීම මඟින් 2022 වසරේ අප්‍රේල් මාසයේ දී මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් දැඩි කරන ලදී. මහ බැංකුව විසින් 2022 වසරේ අප්‍රේල් මාසයේ දී නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පෙර නොවූ විරූ ලෙස පදනම් අංක 700 කින් පිළිවෙළින් සියයට 13.5 සහ 14.5 දක්වා වැඩි කරන ලද අතර ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) සියයට 4.00 ක පවත්වා ගන්නා ලදී. වැඩිවන උද්ධමන අපේක්ෂාවන් සැලකිල්ලට ගනිමින් ප්‍රතිපත්ති පොලී අනුපාත පදනම් අංක 100 කින් වැඩි කරමින් 2022 වසරේ ජූලි මාසයේ දී මහ බැංකුව නැවතත් සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කළේය.

බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) 2021 වසරේ දෙසැම්බර් මස අවසානයේ සියයට 9.87 සිට 2022 වසරේ අගෝස්තු මස අවසානයේ සියයට 16.86 ක් දක්වා වැඩි වූ අතර, එම කාලය තුළම බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතය (AWDR) සියයට 4.94 සිට සියයට 10.49 ක් දක්වා වැඩි විය. පුළුල් මුදල් ($M_2b$), 2021 වසර අවසානයේ දී රු. බිලියන 10,647 සිට 2022 වසරේ අගෝස්තු මස අවසානයේ දී රු. බිලියන 11,987 ක් දක්වා සියයට 12.6 කින් වැඩි වූ අතර, පුද්ගලික අංශයට ලබා දුන් ණය 2021 වසරේ සැප්තැම්බර් මස අවසානයේ දී රු. බිලියන 6,824.6 සිට 2022 වසරේ සැප්තැම්බර් මස අවසානයේ දී රු. බිලියන 7,576.9 ක් දක්වා සියයට 11.0 කින් වැඩි විය. 2022 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට රාජ්‍ය අංශයට ලබා දෙන ලද ශුද්ධ ණය ද රු. බිලියන 7,043.4 ක් දක්වා සියයට 20.8 කින් වැඩි විය.

**රූපසටහන 2.8 : පොලී අනුපාත, මුදල් සමස්තයන් සහ පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය**




අඅ



මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

## උද්ධමනය

කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද, 2013=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2021 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 5.7 සිට 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 69.8 ක් දක්වා වර්ධනය විය. රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම සහ ආනයන සඳහා ඇති උග්‍ර විදේශ විනිමය හිඟය හේතුවෙන් ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම මාසික වැඩිවීම වාර්ෂික ලක්ෂ්‍යමය පදනමෙන් මනිනු ලබන උද්ධමනය ඉහල යාමට ප්‍රධාන වශයෙන් බලපාන ලදී. ඒ අනුව, ආහාර උද්ධමනය 2021 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 10.0 සිට 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 94.9 ක් දක්වා ඉහළ ගිය අතර, ආහාර නොවන උද්ධමනය 2021 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 3.8 සිට 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 57.6 ක් දක්වා ඉහළ යන ලදී. කෙසේ වෙතත්, 2022 වසරේ ඔක්තෝබර් මස වන විට කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන උද්ධමනය පදනම් අංක 380 කින් සියයට 66.0 ක් දක්වා අඩු වී තිබුණි.

**රූපසටහන 2.9 : මතුපිට, මූලික සහ ආහාර උද්ධමන විචලතා (පදනම : 2013 = 100)**




මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**වගුව 2.5 : මතුපිට උද්ධමනය, මූලික උද්ධමනය සහ ආහාර උද්ධමනය (පාදක වර්ෂය 2013 = 100)**

| මාසය | මතුපිට උද්ධමනය (%) | | | | මූලික උද්ධමනය* (%) | | | | ආහාර උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ලක්ෂ්‍යමය | | වාර්ෂික සාමාන්‍ය | | ලක්ෂ්‍යමය | | වාර්ෂික සාමාන්‍ය | | ලක්ෂ්‍යමය | | වාර්ෂික සාමාන්‍ය | |
| | 2021 | 2022 | 2021 | 2022 | 2021 | 2022 | 2021 | 2022 | 2021 | 2022 | 2021 | 2022 |
| ජනවාරි | 3.0 | 14.2 | 4.3 | 6.9 | 2.7 | 9.9 | 3.1 | 5.0 | 6.8 | 25.0 | 10.9 | 13.3 |
| පෙබරවාරි | 3.3 | 15.1 | 4.1 | 7.9 | 2.6 | 10.9 | 3.0 | 5.7 | 7.9 | 25.7 | 10.3 | 14.8 |
| මාර්තු | 4.1 | 18.7 | 4.0 | 9.1 | 3.1 | 13.0 | 3.0 | 6.5 | 9.6 | 30.2 | 10.1 | 16.5 |
| අප්‍රේල් | 3.9 | 29.8 | 3.9 | 11.3 | 3.0 | 22.0 | 3.0 | 8.1 | 9.0 | 46.6 | 9.7 | 19.7 |
| මැයි | 4.5 | 39.1 | 3.9 | 14.2 | 3.2 | 28.4 | 3.0 | 12.2 | 9.9 | 57.4 | 9.7 | 23.7 |
| ජූනි | 5.2 | 54.6 | 4.1 | 18.4 | 3.2 | 39.9 | 3.0 | 13.3 | 11.3 | 80.1 | 9.9 | 29.7 |
| ජූලි | 5.7 | 60.8 | 4.2 | 23.1 | 3.7 | 44.3 | 3.1 | 16.7 | 11.0 | 90.9 | 9.9 | 36.5 |
| අගෝස්තු | 6.0 | 64.3 | 4.3 | 28.0 | 4.1 | 46.6 | 3.2 | 20.3 | 11.5 | 93.7 | 9.8 | 43.5 |
| සැප්තැම්බර් | 5.7 | 69.8 | 4.5 | 33.4 | 5.0 | 50.2 | 3.3 | 24.1 | 10.0 | 94.9 | 9.7 | 50.6 |
| ඔක්තෝබර් | 7.6 | 66.0 | 4.8 | 38.3 | 6.3 | 49.7 | 3.6 | 27.8 | 12.8 | 85.6 | 10.0 | 56.7 |
| නොවැම්බර් | 9.9 | - | 5.3 | - | 7.0 | - | 4.0 | - | 17.5 | - | 10.6 | - |
| දෙසැම්බර් | 12.1 | - | 6.0 | - | 8.3 | - | 4.4 | - | 22.1 | - | 11.7 | - |

මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 2.4 කොටස් වෙළෙඳපොළ

වෙළෙඳපොළ දර්ශකයන්හි විචලනයන් මඟින් මනිනු ලබන කොටස් වෙළෙඳපොළ කාර්ය සාධනය 2022 වසරේ ජූලි මස දක්වා පහත වැටීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලදී. සියලු කොටස් මිල දර්ශකය වසර ආරම්භයේ 12,226 සිට 2022 වසරේ ජුනි මස අවසානයේ 7,342 දක්වා සියයට 38.7 කින් පහත වැටුණු අතර එම කාලපරිච්ඡේදය තුළ S&PSL20 දර්ශකය 4,233 ක අගයක සිට 2,334 ක අගයක් දක්වා පහත වැටුණි. 2022 වසරේ පළමු මාස නවය තුළ, සියලු කොටස් මිල දර්ශකය ජනවාරි 19 වන දින 13,462 ක ඉහළම අගයක් වාර්තා කළ අතර, අප්‍රේල් 26 දින 6,884 ක අවම අගයක් වාර්තා කළේය. මෙම කාලය තුළම S&PSL20 ශ්‍රී ලංකා 20 දර්ශකය ජනවාරි 24 වන දින 4,627 ක ඉහළම අගයක් සහ අප්‍රේල් 26 වන දින 2,125 ක අවම අගයක් වාර්තා කළේය.

කෙසේ වෙතත්, 2022 වසරේ ජූලි මස ආරම්භයේ සිට වෙළෙඳපොළ යථා තත්ත්වයට පත්වීමේ සලකුණු පෙන්නුම් කරමින් සියලු කොටස් මිල දර්ශකය සහ S&PSL20 දර්ශකය නැවත ඉහළ යාමේ ප්‍රවණතාවයකට මුල පුරන ලදී. සියලු කොටස් මිල දර්ශකය 2022 වසරේ ජූලි මස 7,457 ක අගයක සිට තෙවන කාර්තුව අවසානයේ 9,931 ක අගයක් දක්වා වැඩි වූ අතර S&PSL20 දර්ශකය 2022 වසරේ ජූලි මස ආරම්භයේදී 2,380 ක අගයක සිට තෙවන කාර්තුව අවසානයේ දී 3,165 ක අගයක් වාර්තා කළේය.

වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2021 වසරේ සැප්තැම්බර් මස අවසානයේ රු. බිලියන 4,216 සිට 2022 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට රු. බිලියන 4,341 දක්වා වැඩි වූ අතර එය, සියයට 2.96 ක ආන්තික වර්ධනයකි. විදේශීය මිලදී ගැනීම්, 2021 වසරේ පළමු කාර්තු තුන තුළ රු. බිලියන 28.6 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 48.3 ක් දක්වා සියයට 68.9 කින් ඉහළ ගිය අතර, විදේශීය විකුණුම් 2021 වසරේ වාර්තා කළ රු. බිලියන 74 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 33 ක් දක්වා අඩු විය.

**වගුව 2.6 : ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙනස්වීම්**

| දර්ශකය | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | සැප්. අවසානයට | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | 2021 | 2022(අ) |
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) | 6,228 | 6,369 | 6,052 | 6,129 | 6,774 | 12,226 | 9,460 | 9,931 |
| එස් ඇන්ඩ් පී එස් එල් 20 දර්ශකය | 3,496 | 3,672 | 3,135 | 2,937 | 2,638 | 4,233 | 3,535 | 3,165 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලි.) | 2,745 | 2,899 | 2,840 | 3,599 | 2,961 | 5,489 | 4,216 | 4,341 |
| ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව | 295 | 296 | 297 | 289 | 283 | 296 | 287 | 294 |
| වාර්ෂික පිරිවැටුම (රු. බිලි.) | 176 | 221 | 200 | 171 | 397 | 1173 | 793 | 567 |
| විදේශ විකුණුම් (රු. මිලි.) | 74,200 | 94,627 | 100,315 | 68,173 | 104,186 | 86,689 | 73,554 | 33,034 |
| විදේශ ගැනුම් (රු. මිලි.) | 74,583 | 112,285 | 77,067 | 56,395 | 53,144 | 34,087 | 28,648 | 48,305 |
| ශුද්ධ ගැනුම් (රු. මිලි.) | 384 | 17,658 | -23,248 | -11,778 | -51,041 | -52,602 | -44,906 | 15,271 |

මූලාශ්‍ර : කොළඹ කොටස් වෙළඳපොළ හා ශ්‍රී ලංකා මහ බැංකුව
(අ) තාවකාලික

## 2.5 විදේශ අංශයේ වර්ධනයන්

ශ්‍රී ලංකාවේ විදේශ අංශය 2022 වසරේ පළමු මාස නවය තුළ වෙළඳ හිඟය අඩු වීම මධ්‍යයේ සේවක ප්‍රේෂණ ඇතුළු ගලා ඒම් පහත වැටීමත් සමඟ දේශීය හා ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාවයන් මඟින් විදේශ විනිමය වෙළෙඳපොළේ ඇති වූ බාධා වීම් හේතුවෙන් මිශ්‍ර කාර්ය සාධනයක් පෙන්නුම් කළේය. 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී අඛණ්ඩව හත්වන මාසයටත් මාසික ආනයන වියදම වාර්ෂික පදනම මත අඩු වූ අතර අපනයන ආදායම 2022 වසරේ අප්‍රේල් මාසයේ සිට වැඩි විය. ඒ අනුව, 2021 වසරේ පළමු මාස නවය තුළ වෙළඳ හිඟය ඇ.ඩො. මිලියන 5,999 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 4,104 ක් දක්වා සංකෝචනය විය. ප්‍රධාන වශයෙන් කාර්මික අංශයේ ඉපැයීම් ඉහළ යාම හේතුවෙන් 2021 වසරේ පළමු මාස නවය තුළ අපනයන ඉපැයීම් ඇ.ඩො. මිලියන 8,938.5 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 9,981.1 දක්වා සියයට 11.7 කින් ඉහළ ගොස් ඇති කාර්මික අපනයන ඉපැයීම් ඇ.ඩො. මිලියන 8,000.6 දක්වා සියයට 15.9 කින් වර්ධනය වී ඇති අතර කෘෂිකාර්මික අපනයන ඉපැයීම් සහ ඛනිජ අපනයන ඉපැයීම් පිළිවෙලින් ඇ.ඩො. මිලියන 1,939.8 දක්වා සියයට 2.4 කින් සහ ඇ.ඩො. මිලියන 24.1 දක්වා සියයට 28.6 කින් අඩු වී ඇත. 2022 වසරේ පළමු මාස නවය තුළ සමස්ත කාර්මික අපනයන ආදායමෙන් සියයට 57.2 ක දායකත්වයක් ලබා දෙමින් රෙදිපිළි සහ ඇඟලුම් අපනයන ආදායම ඇ.ඩො. බිලියන 4.6 ක් වාර්තා කළේය. මේ අතර, 2022 වසරේ අගෝස්තු මස හදිසි නොවන ආනයන සඳහා පැන වූ ආනයන සීමා කිරීමත් සමග 2021 වසරේ පළමු මාස නවය තුළ මුළු ආනයන වියදම වූ ඇ.ඩො. මිලියන 14,937.5 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 14,085.2 ක් දක්වා සියයට 5.7 කින් අඩු විය. කෙසේ වෙතත් ඇතැම් සීමා කිරීම් 2022 වසරේ සැප්තැම්බර් මස දී ලිහිල් කරන ලදී. අතරමැදි භාණ්ඩ ආනයන වියදම ඇ.ඩො. මිලියන 9,497.4 ක් දක්වා සියයට 8.0 කින් වර්ධනය වූ අතර, පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ පිළිවෙලින්

ඇ.ඩො. මිලියන 2,146.7 ක් දක්වා සියයට 25.7 කින් ද, මිලියන 2,433.0 ක් දක්වා සියයට 25.1 කින් ද අඩු විය.

සමස්ත ගෙවුම් ශේෂය 2021 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ.ඩො. මිලියන 2,573 ක හිඟයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,927 ක හිඟයක් වාර්තා කර ඇත. 2022 වසරේ මුල් මාස නවය තුළ රජයේ දළ ගලා ඒම් ඇ.ඩො. මිලියන 1,798 ක් ලෙස වාර්තා විය. 2022 වසරේ සැප්තැම්බර් මස අවසානයේදී මුළු විදේශ වත්කම් ප්‍රමාණය ඇ.ඩො. බිලියන 6.0 ක් වූ අතර, චීන මහජන බැංකුවේ ඇ.ඩො. බිලියන 1.4 ක විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළුව දළ නිල සංචිත 2022 වසරේ සැප්තැම්බර් මස අවසානයේ දී ඇ.ඩො. බිලියන 1.8 ක් විය. මේ අතර, 2022 වසරේ නොවැම්බර් මස 04 වන දින වන විට ශ්‍රී ලංකා රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 44.9 කින් අවප්‍රමාණය විය.

### අපනයන

ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ඉපැයීම් වැඩි වීම හේතුවෙන් අපනයන ඉපැයීම් 2021 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ.ඩො. මිලියන 8,938.5 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො.මිලියන 9,981.1 දක්වා සියයට 11.7 කින් වර්ධනය විය. කාර්මික අපනයන ඉපැයීම් 2021 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ.ඩො. මිලියන 6,903.1 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 8,000.6 දක්වා සියයට 15.9 කින් වැඩි වී ඇත. ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය සහ එක්සත් රාජධානිය ඇතුළු සියලුම ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල් වෙත අපනයනය වැඩි දියුණු වීමත් සමග රෙදිපිළි සහ ඇඟලුම් වලින් ඉපැයීම් පෙර වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වූ ඇ.ඩො. මිලියන 3,893.3 සිට ඇ.ඩො. මිලියන 4,577.2 දක්වා සියයට 17.6 කින් වැඩි වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. මීට අමතරව, 2022 වසරේ පළමු මාස නවය තුළ ඛනිජ තෙල් නිෂ්පාදන වලින් ඇ.ඩො. මිලියන 439.9 ක් දක්වා සියයට 26.2 කින් ද, යන්ත්‍රෝපකරණ සහ යාන්ත්‍රික උපකරණ ඇ.ඩො. මිලියන 427.9 දක්වා සියයට 16.7 කින් ද, මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ ඇ.ඩො. මිලියන 325.7 ක් දක්වා සියයට 63.2 කින් ද, රසායනික නිෂ්පාදන ඇ.ඩො. මිලියන 171.4 ක් දක්වා සියයට 5.2 කින් ද, මූල ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත ඇ.ඩො. මිලියන 134.6 ක් දක්වා සියයට 20.9 කින් ද ඉපැයීම් ඉහළ යාම වාර්තා විය. මේ අතර, රබර්, පොල් සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදන වලින් ඉපැයීම් ඉහළ යාමක් වාර්තා වී තිබිය දීත්, තේ, කුළුබඩු, එළවළු, සකස් නොකළ දුම්කොළ නිෂ්පාදන වලින් ඉපැයීම් පහත වැටීමත් සමග කෘෂිකාර්මික අපනයන ඉපැයීම් 2021 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ.ඩො. මිලියන 1,986.7 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 1,939.8 ක් දක්වා සියයට 2.4 කින් අඩු වී ඇත. රබර්, පොල් සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදන වලින් ඉපැයීම් පිළිවෙලින් ඇ.ඩො. මිලියන 32.7 ක් දක්වා සියයට 0.9 කින් ද, ඇ.ඩො. මිලියන 314.0 ක් දක්වා සියයට 0.4 කින් ද, ඇ.ඩො. මිලියන 138.9 ක් දක්වා සියයට 33.0 කින් ද, ඉහළ ගොස් ඇත. තේ සඳහා ඉහළ සාමාන්‍ය මිලක් තිබියදීත් තේ අපනයන පරිමාව අඩු වීමත් සමග තේ අපනයනයෙන් වූ ඉපැයීම් ඇ.ඩො. මිලියන 986.6 සිට ඇ.ඩො. මිලියන 937.1 ක් දක්වා සියයට 5.0 කින් පහළ ගියේය. ලෝපස්, ලෝබොර සහ අළු යටතේ වර්ගීකරණය කරන ලද ටයිටේනියම් ලෝපස් සහ සර්කෝනියම් ලෝපස් වලින් ඉපැයීම් අඩුවීම හේතුවෙන් ඛනිජ අපනයන ඉපැයීම් ද ඇ.ඩො. මිලියන 24.1 ක් දක්වා සියයට 28.6 කින් පහත වැටීමක් වාර්තා කළේය. මේ අතර, 2022 වසරේ පළමු මාස නවය තුළ අනෙකුත් වර්ගීකරණය නොකළ අපනයන ඉපැයීම් ඇ.ඩො. මිලියන 16.6 ක් දක්වා සියයට 11.2 කින් වැඩි විය.

**රූපසටහන 2.10 : වෙළඳ ශේෂය සහ විනිමය අනුපාත වෙනස්වීම**




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

### ආනයන

පාරිභෝගික හා ආයෝජන භාණ්ඩ ආනයන වියදමෙහි අඩු වීමත් සමග 2021 වසරේ පළමු මාස නවය තුළ වූ

**රූපසටහන 2.11 : අපනයන සංයුතිය**




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

**වගුව 2.7 : විදේශීය වෙළෙඳාම**

ඇ. ඩො. මිලියන

| අයිතමය | 2019 | 2020 | 2021 | ජන. - සැප්. 2021 | ජන. - සැප්. 2022[අ] |
|---|---|---|---|---|---|
| **අපනයන** | **11,940** | **10,047** | **12,502** | **8,939** | **9,981** |
| **කෘෂිකාර්මික අපනයන** | **2,462** | **2,336** | **2,730** | **1,987** | **1,940** |
| තේ | 1,346 | 1,241 | 1,324 | 987 | 937 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 1,116 | 1,095 | 1,405 | 1,000 | 1,003 |
| **කාර්මික අපනයන** | **9,427** | **7,672** | **9,705** | **6,903** | **8,001** |
| ඇඟලුම් හා නිමි ඇඳුම් | 5,597 | 4,423 | 5,435 | 3,893 | 4,577 |
| ආහාර පාන සහ දුම්කොළ | 447 | 464 | 587 | 398 | 406 |
| රබර් නිෂ්පාදන | 866 | 786 | 1,050 | 773 | 755 |
| යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 400 | 338 | 501 | 367 | 428 |
| ඛනිජතෙල් නිෂ්පාදන | 521 | 374 | 506 | 349 | 440 |
| අනෙකුත් කාර්මික අපනයන | 1,596 | 1,288 | 1,625 | 1,124 | 1,395 |
| **ඛනිජමය අපනයන** | **34** | **25** | **45** | **34** | **24** |
| **වර්ගීකරණය නොකළ අපනයන** | **18** | **14** | **23** | **15** | **17** |
| **ආනයන** | **19,937** | **16055** | **20,637** | **14,938** | **14,085** |
| **පාරිභෝගික භාණ්ඩ** | **3,957** | **3,402** | **3,849** | **2,890** | **2,147** |
| ආහාර සහ පාන | 1,427 | 1,554 | 1,667 | 1,262 | 1,228 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 2,530 | 1,847 | 2,182 | 1,628 | 919 |
| **අතරමැදි භාණ්ඩ** | **11,369** | **9,077** | **12,309** | **8,791** | **9,497** |
| ඛනජතෙල් | 3,892 | 2,543 | 3,743 | 2,597 | 3,694 |
| රෙදිපිළි හා ඇඟලුම් | 2,909 | 2,335 | 3,067 | 2,206 | 2,407 |
| තිරිඟු සහ බඩ ඉරිඟු | 346 | 384 | 418 | 291 | 189 |
| අනෙකුත් | 4,222 | 3,814 | 5,081 | 3,697 | 3,207 |
| **ආයෝජන භාණ්ඩ** | **4,603** | **3,563** | **4,463** | **3,249** | **2,433** |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 2,490 | 2,176 | 2,810 | 2,049 | 1,571 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,509 | 1,036 | 1,249 | 901 | 747 |
| ප්‍රවාහන උපකරණ | 597 | 348 | 399 | 295 | 113 |
| අනෙකුත් | 8 | 3 | 6 | 4 | 3 |
| **වර්ගීකරණය නොකළ ආනයනය** | **8** | **14** | **17** | **8** | **8** |
| **වෙළඳ හිඟය** | **-7,997** | **-6,008** | **-8,136** | **-5,999** | **-4,104** |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව
[අ] තාවකාලික

ආනයන වියදම ඇ.ඩො. මිලියන 14,937.5 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 14,085.2 දක්වා සියයට 5.7 කින් අඩු වී ඇත. ආහාර පාන වර්ග සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යන කාණ්ඩයන්හි ආනයන වියදම අඩුවීම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඇ.ඩො. මිලියන 2,146.7 දක්වා සියයට 25.7 කින් පහළ ගියේය. කිරි නිෂ්පාදන, එළවළු, සීනි සහ රසකැවිලි සහ මුහුදු ආහාර ආනයන වියදම පහළ යෑම හේතුවෙන් ආහාර සහ පාන වර්ගයන්හි ආනයන වියදම 2021 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ.ඩො. මිලියන 1,261.7 සිට 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 1,227.7 දක්වා සියයට 2.7 කින් පහත ගොස් ඇත. පුද්ගලික රථ වාහන, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදන, විදුලි සංදේශ උපාංග, ගෘහ සහ දැව භාණ්ඩ ආනයන වියදම අඩුවීම හේතුවෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා වන වියදම ඇ.ඩො. මිලියන 919.0 දක්වා සියයට 43.6 කින් පහත වැටී ඇත. කෙසේ වෙතත්, රෙදිපිළි සහ උපාංග ආනයන වියදම ඇ.ඩො. මිලියන 156.8 සිට ඇ.ඩො. මිලියන 169.9 දක්වා සියයට 8.4 කින් වැඩි විය. මේ අතර, ප්‍රධාන වශයෙන් ඉන්ධන, රෙදිපිළි සහ රෙදිපිළි උපාංග ආනයන වියදම ඉහළ යාම හේතුවෙන් අතරමැදි භාණ්ඩ ආනයන වියදම ඇ.ඩො. මිලියන 8,790.8 සිට ඇ.ඩො. මිලියන 9,497.4 දක්වා සියයට 8.0 කින් ඉහළ ගොස් ඇත. ආනයන පරිමාව අඩු වුවද බොර තෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල්වල සාමාන්‍ය ආනයන මිල ගණන් ඉහළ යාම ඉන්ධන ආනයන වියදම ඇ.ඩො. මිලියන 3,694.3 දක්වා සියයට 42.3 කින් ඉහළ ගියේය.

2022 වසරේ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය, ප්‍රවාහන උපකරණ සහ වෙනත් ආයෝජන භාණ්ඩ ඇතුළු සියලුම උප කාණ්ඩයන්හි ආනයන වියදම් අඩුවීම හේතුවෙන් ආයෝජන භාණ්ඩ ආනයන වියදම, 2021 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ.ඩො. මිලියන 3,248.8 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,433.0 දක්වා සියයට 25.1 කින් පහළ ගියේය. යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ආනයන වියදම ඇ.ඩො. මිලියන 1,570.7 දක්වා සියයට 23.4 කින් ද, ගොඩනැගිලි ද්‍රව්‍ය ඇ.ඩො. මිලියන 747.1 දක්වා සියයට 17.0 කින් ද, ප්‍රවාහන උපකරණ ඇ.ඩො. මිලියන 112.5 දක්වා සියයට 61.8 කින් ද පහත වැටී ඇත.

**රූපසටහන 2.12 : ආනයන සංයුතිය**




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

**සංචාරක ඉපයීම් සහ සේවක ප්‍රේෂණ**

කොවිඩ්-19 වසංගතයෙන් යථා තත්ත්වයට පත් වීමත් සමඟ සංචාරක පැමිණීම්, 2021 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ පුද්ගලයින් 37,924 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පුද්ගලයින් 526,232 දක්වා ඉහළ ගොස් ඇත. ඒ අනුව, සංචාරක ඉපැයීම් 2021 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ.ඩො. මිලියන 98.8 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 946.4 දක්වා ඉහළ ගොස් ඇත. මේ අතර, සේවක ප්‍රේෂණ 2021 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ.ඩො. මිලියන 4,577.5 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,574.1 දක්වා සියයට 43.8 කින් අඩු විය.

## 2.6 ලෝක ආර්ථික සංදර්භය

කොවිඩ්-19 වසංගතය මගින් අවපාතයට පත්ව ඇති ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් තවදුරටත් තීව්‍ර විය. රුසියා - යුක්රේන ගැටුම, ඉහළ උද්ධමනය හේතුවෙන් ඇති වූ ජීවන වියදම් අර්බුදය සහ විශාලතම ආර්ථිකයන් තුන වන ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය සහ චීනය මන්දගාමී වීම හේතුවෙන් 2022 වසරේ ඔක්තෝබර් මාසයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලෝක ආර්ථික ඉදිරි දැක්මට අනුව, ගෝලීය වර්ධනය 2021 වසරේ පැවති සියයට 6.0 සිට 2022 වසරේ දී සියයට 3.2 දක්වා සහ 2023 වසරේ දී සියයට 2.7 දක්වා මන්දගාමී වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. විශාලතම ආර්ථිකයන්හි ඇති වූ සැලකිය යුතු පසුබෑම හේතුවෙන් ගෝලීය මූල්‍ය අර්බුදයේ දී හැර 2001 වසරේ සිට ඇති වූ දුර්වලම වර්ධන යුගය ලෙස මෙය පෙන්නුම් කළ හැක. එසේම, දියුණු ආර්ථිකයන්හි උද්ධමනය 1982 වසරේ සිට ගත් කල 2022 වසරේ දී එහි ඉහළම අගයට ළඟා වී ඇත. ලොව පුරා බොහෝ රටවල පවතින ප්‍රතිපත්තීන්හි අවිනිශ්චිතතාවය, ණය බර, සමාජ අසහනය, ආහාර සුරක්ෂිතතාවය නොමැති වීම සහ ප්‍රචණ්ඩත්වය සඳහා විශාල වශයෙන් ඉහළ යන ජීවන වියදම හේතු වී ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 2022 වසරේ ඔක්තෝබර් මාසයේ වාර්තාවට අනුව, ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා ආර්ථිකයන්හි මන්දගාමීත්වය හේතුවෙන් දියුණු ආර්ථිකයන්හි වර්ධනය 2021 වසරේ තිබූ සියයට 5.2 සිට පිළිවෙලින් 2022 වසරේ සහ 2023 වසරේ දී සියයට 2.4 සහ සියයට 1.1 දක්වා පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. වැය කල හැකි ආදායම අඩු වීම සහ ඉහළ පොළී අනුපාත හේතුවෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ වර්ධනය 2021 වසරේ දී පැවති සියයට 5.7 සිට 2022 වසරේ දී සියයට 1.6 දක්වා සහ 2023 වසරේ දී සියයට 1.0 දක්වා පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. යුරෝ කලාපයේ වර්ධනය 2021 වසරේ පැවති සියයට 5.2 සිට 2022 වසරේ දී සියයට 3.1 දක්වා ද 2023 වසරේ දී සියයට 0.5 දක්වා ද මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජපානයේ වර්ධනය 2021 සහ 2022 වසර දෙකෙහිදීම සියයට 1.7 ක ස්ථාවර මට්ටමේ පවතිනු ඇති අතර 2023 වසරේ දී එය සියයට 1.6 ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මිල ගණන් සහ ඉහළ උද්ධමනය සමඟ

ඇති වූ ක්‍රය ශක්තිය හීන වීම මෙම වර්ධන අපේක්ෂාවන් පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් 2021 වසරේ පැවති සියයට 6.6 සිට 2022 වසරේ දී සියයට 3.7 දක්වා පහත වැටෙනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර 2023 වසරේ දී ද එලෙසම පවතිනු ඇත. නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආසියාවේ වර්ධනය 2021 වසරේ පැවති සියයට 7.2 සිට 2023 වසරේ දී සියයට 4.9 දක්වා ඉහළ යාමට පෙර 2022 වසරේ දී සියයට 4.4 දක්වා පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. කොවිඩ්-19 ආශ්‍රිත අගුලු ලෑම් සහ වඩාත් තීව්‍ර වෙමින් පවතින දේපල වෙළෙඳපොළ අර්බුදය හේතුවෙන් චීනයේ වර්ධනය 2021 වසරේ පැවති සියයට 8.1 සිට 2022 වසරේ දී සියයට 3.2 දක්වා පහත වැටී 2023 දී සියයට 4.4 දක්වා වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, චීනයට වඩා ඉන්දියාව සඳහා වන වර්ධන පුරෝකථනයන් ඉහළය. ඉන්දියාව සඳහා වන ඇස්තමේන්තුගත වර්ධනය 2022 වසර සඳහා සියයට 6.8 ක් වන අතර 2023 වසර සඳහා සියයට 6.1 ක් වේ. රුසියාව ඇතුළු නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින යුරෝපයේ වර්ධනය 2022 වසරේ දී සියයට 0.0 ක් සහ 2023 වසරේ දී සියයට 0.6 ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර යුක්රේන යුද්ධය සහ රුසියාවට එරෙහිව පවතින ජාත්‍යන්තර සම්බාධක හේතුවෙන් රුසියාවේ වර්ධනය 2021 වසරේ පැවති සියයට 4.7 සිට 2022 සහ 2023 වසරේ දී පිළිවෙලින් සියයට 3.4 ක් සහ 2.3 ක් දක්වා හැකිලෙනු ඇතැයි ඇස්තමේන්තු ගත කර ඇත.

චීනයේ සැපයුම් හා බෙදා හැරීම් චාර ගණන අඩුවීම හේතුවෙන් ගෝලීය වෙළඳාම 2021 වසරේ පැවති සියයට 10.1 සිට 2022 වසරේ දී සියයට 4.3 දක්වා සහ 2023 වසරේ දී සියයට 2.5 ක් දක්වා අඩු වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. 2022 වසරේ සැප්තැම්බර් මස වන විට ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරයේ නාමික අගය 2021 වසරේ සාමාන්‍ය හා සසඳන විට සියයට 13 කින් පමණ අධි ප්‍රමාණය වූ අතර, එය තවදුරටත් ලෝක වෙළඳ වර්ධනයයෙහි මන්දගාමීත්වයට හේතු විය.

රුසියා - යුක්රේන ගැටුම හේතුවෙන් බොර තෙල් බැරලයක මිල, මාර්තු මස මුලදී ඇ. ඩො. 120 දක්වා වැඩි වූ අතර, 2022 වසරේ පෙබරවාරි සහ අගෝස්තු මාස අතර කාලසීමාවේදී සියයට 3.5 කින් වැඩි විය.

කෙසේ වෙතත්, යුරෝපය සහ ඇමෙරිකා එක්සත් ජනපදය රුසියානු තෙල් මිලදී ගැනීම අඩු කිරීමත් සමඟ රුසියාව එම තෙල් චීනයට සහ ඉන්දියාවට වට්ටම් අනුපාතයකට ලබා දෙන ලදී. 2022 වසරේ දී තෙල් මිල සියයට 41.4 කින් ඉහළ යනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර, බොර තෙල් බැරලයක මිලේ සාමාන්‍යය ඇ. ඩො. 98.2 ක් වනු ඇත. එසේ වුවද, 2025 වසරේ දී බොර තෙල් බැරලයක මිල ඇ. ඩො. 76.3 දක්වා පහත වැටෙනු ඇත.

යුරෝපයේ ස්වභාවික ගෑස් මිල ඉහළ යාමට සැපයුම් අංශයේ බාධාවන් හේතු වී තිබේ. පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ සැප්තැම්බර් මාසයේදී රුසියාව යුරෝපයට ගෑස් අපනයනය සියයට 80 කින් පමණ අඩු කරන ලදී. ගෑස් භාවිතය වෙනුවට ගල් අඟුරු භාවිතය වෙත නැඹුරු වීම පිළිබිඹු කරමින් ගල් අඟුරු මිල සියයට 61.4 ක් දක්වා ඉතිහාසගත ඉහළ මට්ටමක් වාර්තා කරන ලදි.

වගුව 2.8 : තෝරාගත් රටවල ප්‍රධාන ආර්ථික දර්ශක - 2022 (පුරෝකථනය)

| රට | ද.දේ.නි.වර්ධනය % | උද්ධමනය % | සේවා වියුක්තිය % | මූල්‍ය හිඟය (ද.දේ.නි. % ලෙස) | දළ ණය (ද.දේ.නි. % ලෙස) |
|---|---|---|---|---|---|
| ආජන්ටිනාව | 4.0 | 72.4 | 6.9 | -3.5 | 76.0 |
| ඕස්ට්‍රේලියාව | 3.8 | 6.5 | 3.6 | -3.4 | 56.7 |
| බ්‍රසීලය | 2.8 | 9.4 | 9.8 | -5.8 | 88.2 |
| කැනඩාව | 3.3 | 6.9 | 5.3 | -2.2 | 102.2 |
| චිලී | 2.0 | 11.6 | 7.9 | 0.9 | 36.2 |
| චීනය | 3.2 | 2.2 | 4.2 | -8.9 | 76.9 |
| ප්‍රංශය | 2.5 | 5.8 | 7.5 | -5.1 | 111.8 |
| ජර්මනිය | 1.5 | 8.5 | 2.9 | -3.3 | 71.1 |
| ග්‍රීසිය | 5.2 | 9.2 | 12.6 | -4.4 | 177.6 |
| ඉන්දියාව | 6.8 | 6.9 | ලැ.නො. | -9.9 | 83.4 |
| ඉන්දුනීසියාව | 5.3 | 4.6 | 5.5 | -3.9 | 40.9 |
| ඉතාලිය | 3.2 | 8.7 | 8.8 | -5.4 | 147.2 |
| ජපානය | 1.7 | 2.0 | 2.6 | -7.9 | 263.9 |
| කොරියාව | 2.6 | 5.5 | 3.0 | -1.8 | 54.1 |
| මැලේසියාව | 5.4 | 3.2 | 4.5 | -4.9 | 69.6 |
| මෙක්සිකෝව | 2.1 | 8.0 | 3.4 | -3.8 | 56.8 |
| රුසියාව | -3.4 | 13.8 | 4.0 | -2.3 | 16.2 |
| සිංගප්පූරුව | 3.0 | 5.5 | 2.1 | 1.4 | 141.1 |
| දකුණු අප්‍රිකාව | 2.1 | 6.7 | 34.6 | -4.9 | 68.0 |
| ස්පාඤ්ඤය | 4.3 | 8.8 | 12.7 | -4.9 | 113.6 |
| තායිලන්තය | 2.8 | 6.6 | 1.0 | -5.6 | 61.5 |
| එක්සත් රාජධානිය | 3.6 | 9.1 | 3.8 | -4.3 | 87.0 |
| ඇමරිකා එක්සත් ජනපදය | 1.6 | 8.1 | 3.7 | -4.0 | 122.1 |
| වියට්නාමය | 7.0 | 3.8 | 2.4 | -4.7 | 40.2 |

මූලාශ්‍ර : ලෝක ආර්ථික දර්ශකය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2022 ඔක්තෝබර්, ෆිසිජ්ක එදබසඑදරල ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2022 ඔක්තෝබර්, මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව
ලැ.නො. - ලැබී නොමැත

# රජය සතු ව්‍යවසායයන්හි කාර්යසාධනය 03

### 3.1 සමාලෝචනය

රටෙහි ඇති වූ දුෂ්කර ආර්ථික තත්ත්වයන් හමුවේ සැපයුම් දාමයන්ට බාධාවන් එල්ලවීම හේතුවෙන්, 2022 වසරේ පළමු මාස අටෙහි රජය සතු ව්‍යවසායයන්හි ව්‍යාපාර මෙහෙයුම් කටයුතු අඩාල විය. රුපියල අවප්‍රමාණය වීමෙන් පෙර නොවූ විරූ ලෙස ඇති වූ පීඩාකාරී තත්ත්වයන්, රජය සතු ව්‍යවසායයන් කැපී පෙනෙන ලෙස මූල්‍යමය පාඩු වාර්තා කිරීමෙහිලා හේතුවක් විය. රජය සතු ව්‍යවසායයන්වලට භාණ්ඩාගාර ඇපකර ලබා දීම මත රාජ්‍ය මූල්‍ය අවදානම් ද 2022 පළමු මාස අට තුළ කැපී පෙනෙන ලෙස වර්ධනය විය. රජය සතු ව්‍යවසායයන් ණය ගැනීම හේතුවෙන් ප්‍රධාන රාජ්‍ය බැංකු දෙක ණය අවදානම් වෙත දැඩි ලෙස නිරාවරණය වීම හේතුවෙන් එම බැංකුවල මෙහෙයුම් කටයුතු මත පීඩනයක් ඇති කර තිබේ. එම නිසා, රාජ්‍ය මූල්‍ය මත ඇති වන මූල්‍ය අවදානම් අවම කිරීම සඳහා ප්‍රධාන රජය සතු ව්‍යාපාර සඳහා ඵලදායී සහ දැනුවත්භාවයනික් යුත් ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීමේ උපාය මාර්ගයන් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය.

රට තුළ පවතින දුෂ්කර ආර්ථික තත්ත්වයන් යටතේ, සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය මත ඇති වන අමතර පීඩනය අවම කිරීම සඳහා රජය සතු ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණ කිරීම අවශ්‍ය වේ. එබැවින්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ (CPC) සහ ලංකා විදුලිබල මණ්ඩලයේ (CEB) අලාභ අවම කිරීම සඳහා ඉන්ධන සහ විදුලිය ඇතුළු බලශක්ති මිල ගණන් ගැලපුම් කර ඇත. මේ අතර, රාජ්‍ය ව්‍යවසායයන්ගේ කාර්යසාධනය වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ඉහළ නැංවීම සඳහා මෙන්ම මහා භාණ්ඩාගාරය විසින් දරනු ලබන අතිරේක මූල්‍ය බර අවම කර ගැනීමේ ක්‍රමවේදයන් හඳුනා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් විශේෂ ඒකකයක් පත් කර ඇත. 2022 වසරේ අගෝස්තු මස 08 දිනැති අංක 04/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය නිකුත් කිරීමත් සමග වියදම් තාර්කීකරණය මඟින් සියළුම රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන වියදම් අවම කිරීමටත්, ආයතනික අභිප්‍රාය ප්‍රකාශය (SCI) ඇතුළු කාර්යසාධනය පාදක කරගත් ගිවිසුම් ඇතිකර ගැනීමටත් රජය විසින් මුල පුරා ඇත.

2022 වසරේ පළමු මාස අට සඳහා ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි මුළු අලාභය රු. බිලියන 726.9 ක් වූ අතර, ඒ අතරින් රාජ්‍ය ව්‍යවසායයන් 31 ක බදු අය කිරීමට පෙර ලාභය රු. බිලියන 134.9 ක් වූ අතර, ඉතිරි රාජ්‍ය ව්‍යවසායයන් 21 රු. බිලියන 861.7 ක අලාභයක් වාර්තා කර ඇත. සැළකිය යුතු කරුණක් ලෙස, සමස්ත අලාභයෙන් සියයට 99 ක් ජනනය කර ඇත්තේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලි බල මණ්ඩලය සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගම යන රාජ්‍ය ව්‍යවසායයන් වන අතර, එම ආයතනවල සමස්ත අලාභය රු. බිලියන 854.5 කි. මෙම ආයතන තුන වර්ෂ ගණනාවක් තිස්සේ අලාභ ලබන තත්ත්වයක පවත්වා ගෙන යාම මත විශාල ණය බරක් ඇති වී තිබෙන බැවින්, විශාල රාජ්‍ය මූල්‍ය අවදානම් අවම කර ගැනීම සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ ලංකා විදුලිබල මණ්ඩලය සඳහා පිරිවැය මත පදනම් වූ මිලකරණයක් මෙන්ම ශ්‍රී ලංකන් ගුවන් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමේ අවශ්‍යතාවය මතුව ඇත. ආර්ථිකය සංකෝචනය වීම හේතුවෙන් රජය සතු ව්‍යාවසායයන්ගේ අයබදු/ ලාභාංශ රැස් කිරීම 2022 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 17.8 ක් පමණ දක්වා අඩු විය.

### 3.2 රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් දහය පිළිබඳ සමාලෝචනය

මෙම පරිච්ඡේදය මඟින්, මූල්‍ය හා රක්ෂණ, විදුලිය, ජලය සහ ගුවන් සේවා ආවරණය කරන රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් දහයක කාර්යසාධනය සමාලෝචනය කෙරේ.

#### ලංකා බැංකුව

මෙරට ප්‍රමුඛ වාණිජ බැංකුව ලෙස සිය ස්ථාවරය අඛණ්ඩව තහවුරු කර ගනිමින්, 2021 වසර අවසානය වන විට රු. බිලියන 3,803.2 ක් වූ ලංකා බැංකුවේ වත්කම් පදනම 2022 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට රු. බිලියන 4,368.9 ක් දක්වා සියයට 14.9 කින් ඉහළ ගොස් ඇත. 2021 වසර අවසානය වන විට රු. බිලියන 2,866.8 ක් වූ තැන්පතු පදනම ද, 2022 අගෝස්තු මාසය අවසානය වන විට රු. බිලියන 3,264.3 ක් දක්වා සියයට 13.9 කින් ඉහළ යන ලදී. ආර්ථික ක්‍රියාකාරකම් සංකෝචනය වීම හා මූල්‍ය අංශය මුහුණපාන වෙනත් අවිනිශ්චතා හේතුවෙන් 2021 වසර අවසානය වන විට වාර්තා වූ සියයට 5.1 ක් වූ සමස්ත ණය ප්‍රමාණයට සාපේක්ෂව අදියර III හි ණය අනුපාතය 2022 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට සියයට 6.2 ක් දක්වා ඉහළ ගොස් ඇත. 2021 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 36.9 ක බදු අය කිරීමට පෙර ලාභයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුල වාර්තා වූ බදු අය කිරීමට පෙර ලාභය රු. බිලියන 27.0 ක් දක්වා පහළ ගොස් ඇත.

#### මහජන බැංකුව

2021 වසර අවසානය වන විට රු. බිලියන 2,647.6 ක් වූ මහජන බැංකුවේ වත්කම් පදනම 2022 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට රු. බිලියන 2,934.0 ක් දක්වා සියයට 10.8 කින් ඉහළ ගොස් ඇත. 2021 වසරේ අවසානය වන විට රු. බිලියන 2,034.7 ක් වූ තැන්පතු පදනම 2022 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට රු. බිලියන 2,216.6 ක් දක්වා ඉහළ ගොස් ඇත. 2021 වසර අවසානය වන විට රු. බිලියන 1,798.7 ක් වූ ණය සහ අත්තිකාරම් වටිනාකම 2022 වසරේ අගෝස්තු මාසය වන විට රු. බිලියන 1,693.1 ක් දක්වා සියයට 5.9 කින් පහළ ගොස් ඇත. 2021 වසර අවසානය වන විට වාර්තා වූ සියයට 3.2 ක් වූ සමස්ත අක්‍රීය ණය ප්‍රතිශතය 2022 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට සියයට 4.8 ක් දක්වා ඉහළ ගොස් ඇත. 2021 වසරේ මුල් මාස අට තුල වාර්තා වූ රු. බිලියන 16.6 ක බදු අය කිරීමට පෙර ලාභයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුල වාර්තා වූ බදු අය කිරීමට පෙර ලාභය රු. බිලියන 15.7 ක් දක්වා පහළ ගොස් ඇත.

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

2021 වසර අවසානය වන විට රු. බිලියන 1,579.0 ක් වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම් පදනම 2022 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට රු. බිලියන 1,611.6 ක් දක්වා සියයට 2.06 කින් ඉහළ ගොස් ඇත. වත්කම් වැඩිවීම ප්‍රධාන වශයෙන් මූල්‍යනය කරනු ලැබුවේ පාරිභෝගික තැන්පතු මගින් වන අතර, 2021 වසර අවසන් වන විට රු. බිලියන 1,428.4 ක් වූ පාරිභෝගික තැන්පතු ප්‍රමාණය 2022 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට රු. බිලියන 1,459.8 ක් දක්වා සියයට 2.2 කින් ඉහළ ගොස් ඇත. 2022 වසරේ පළමු මාස අට තුළ බැංකුව විසින් රු. බිලියන 31.4 ක් වටිනා තැන්පතු ප්‍රමාණයක් උපයා ඇත. 2021 වසර අවසන් වන විට රු. බිලියන 538.9 ක් වූ ණය සහ අත්තිකාරම් කළඹ 2022 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට රු. බිලියන 561.5 ක් දක්වා ඉහළ ගොස් ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 2021 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 18.9 ක බදු අය කිරීමට පෙර ලාභයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ බදු අය කිරීමට පෙර ලාභය රු. බිලියන 6.6 ක් දක්වා පහළ ගොස් ඇත.

## ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 2021 වසරේ උපයා ගත් රු. බිලියන 11.7 ක බදු අය කිරීමට පෙර ලාභයට සාපේක්ෂව, 2022 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 9.5 ක බදු අය කිරීමට පෙර ලාභයක් වාර්තා කර ඇත. තවද, සමස්ත ආදායම 2021 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 38.8 ට සාපේක්ෂව, 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 15.2 කින් රු. බිලියන 44.7 ක් දක්වා වැඩි විය. 2022 වසරේ පළමු මාස අට තුළ රක්ෂණ වෙළඳපොළෙහි පැවති හිතකර තත්ත්වයන් ප්‍රයෝජනයට ගනිමින් 2022 අගෝස්තු මාසය අවසානය වන විට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වත්කම් පදනම රු. බිලියන 272.2 දක්වා පුළුල් කරගනිමින්, පිළිවෙළින් ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ අරමුදල් රු. බිලියන 156.1 සහ රු. බිලියන 22.2 දක්වා වර්ධනය කරගෙන ඇත.

## ලංකා විදුලිබල මණ්ඩලය

ලංකා විදුලිබල මණ්ඩලයේ 2021 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 164.5 ක් ව පැවැති සමස්ත ආදායමට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 172.0 ක් දක්වා සියයට 4.6 කින් වර්ධනය වී ඇත. රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීමත් සමඟ ගෝලීය වෙළෙඳපොළේ ගල් අඟුරු සහ ඉන්ධනවල විශාල වශයෙන් මිල උච්චාවචනයන් සිදු වීම හේතුවෙන්, ඍජු උත්පාදන පිරිවැය 2021 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 104.7 සිට, 2022 සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 209.5 දක්වා දෙගුණ වී ඇත. ඒ අනුව, විකුණුම් ස්ථානයේ දී ඒකකයක කි.වො. පැයක් සඳහා පිරිවැය 2021 වර්ෂයේ පළමු මාස අට තුළ වූ රු. 17.33 ට සාපේක්ෂව 2022 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. 29.17 ක් දක්වා වැඩි වී ඇත. ඒ අනුව, 2021 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 1.9 ට සාපේක්ෂව, 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ලංකා විදුලිබල මණ්ඩලයට රු. බිලියන 108.7 ක විශාල මෙහෙයුම් අලාභයක් සිදු වී ඇත. මේ අතර, දැවි තෙල් ආනයනය සඳහා විදේශ විනිමය සීමා බලපෑම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදුව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් විදුලි ඉල්ලුම කළමනාකරණය කිරීම සඳහා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව දෛනික විදුලි කප්පාදු ක්‍රියාත්මක කර ඇත. ජලː තාප (ඉන්ධන)ː තාප (ගල් අඟුරු)ː සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සහ සුළං සම්බන්ධයෙන් වන උත්පාදන මිශ්‍රණය 2021 වර්ෂයේ පළමු මාස අට තුළ පිළිවෙළින් 28:18:38:16 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ 28ː19ː37ː16 ලෙස වෙනස් වී ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යන ආයතනයන්හි අහිතකර ද්‍රවශීලතා

**වගුව 3.1 : විදුලි උත්පාදන සංයුතිය හා ධාරිතාවය**

| | 2021 ජනවාරි - අගෝස්තු විදුලි උත්පාදනය | | | 2022 ජනවාරි - අගෝස්තු (තාවකාලික) විදුලි උත්පාදනය | | |
|---|---|---|---|---|---|---|
| | ස්ථාපිත ධාරිතාව මෙ.වො. | සමස්ත උත්පාදන ප්‍රතිශතයක් ලෙස (%) | ගි. වො. පැ. | ස්ථාපිත ධාරිතාව මෙ.වො. | සමස්ත උත්පාදන ප්‍රතිශතයක් ලෙස (%) | ගි. වො. පැ. |
| ජලවිදුලි | 1,383 | 28 | 3,227 | 1,418 | 28 | 3,134 |
| තාප විදුලිය - ලංවිම (ඉන්ධන) | 654 | 8 | 911 | 654 | 10 | 1,132 |
| තාප විදුලිය - ස්වාධීන තාප විදුලි උත්පාදකයන් (ඉන්ධන) | 457 | 10 | 1,184 | 550 | 9 | 1,028 |
| සුළං -ලංවිම | 31 | 2 | 204 | 104 | 2 | 246 |
| තාප විදුලිය - ගල්අඟුරු | 900 | 38 | 4,440 | 900 | 37 | 4,095 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනනීය බලශක්ති | 699 | 12 | 1,363 | 729 | 11 | 1,209 |
| පියසි මත ඉදිකරන සූර්ය පැනල | 309 | 2 | 249 | 515 | 3 | 345 |
| **එකතුව** | 4,433 | 100 | 11,578 | 4,870 | 100 | 11,189 |

මූලාශ්‍ර - ලංකා විදුලිබල මණ්ඩලය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

තත්ත්වයන් සළකා බලා, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවීමට ඇති බැදීම් පියවීම වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයට මහා භාණ්ඩාගාරය විසින් රු. බිලියන 80.0 ක් ප්‍රාග්ධන සම්පාදනයක් වශයෙන් 2022 අගෝස්තු දක්වා ලබා දී ඇත. කෙසේ වෙතත්, ඉන්ධන මිල සැළකිය යුතු ලෙස ඉහළ යාම හේතුවෙන් 2022 වසරේ අගෝස්තු මාසය අවසානයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් වෙත ලංකා විදුලිබල මණ්ඩලයේ මුළු හිඟ වගකීම් රු. බිලියන 148.1 ක් දක්වා නැවතත් වැඩි වී ඇත. තවද, අයිරා පහසුකම වැඩි වීම සහ ණය ගැනීම් ඉහළ යාම හේතුවෙන් 2022 වසරේ අගෝස්තු මස අවසානය වන විට රාජ්‍ය බැංකුවලින් ලබා ගත් ණය ප්‍රමාණය රු. බිලියන 168.1 දක්වා ඉහළ ගොස් ඇත. මේ අතර ව්‍යාපෘති ණය ඇතුළුව බැංකුවලට ගෙවිය යුතු මුළු මුදල 2022 වසරේ අගෝස්තු මස අවසානයේ දී රු. බිලියන 395.5 ක් විය.

මේ අතර, ප්‍රධාන වශයෙන් පිරිවැය නිරූපිත මිල සූත්‍රයක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය මුහුණ දී ඇති දැඩි මූල්‍ය අර්බුදය සැළකිල්ලට ගනිමින්, මහජන උපයෝගිතා කොමිසන් සභාව විසින් 2022 අගෝස්තු මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම පාරිභෝගික කාණ්ඩ සඳහා සාමාන්‍යයෙන් සියයට 75 කින් විදුලි ගාස්තු වැඩි කරන ලදී.

**ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව**

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙහි 2022 වසරේ මුල් මාස අට තුළ බණිජතෙල් ආනයන වියදම ඇ.ඩො. බිලියන 2.2 ක් දක්වා වැඩි වී ඇත. මෙයට හේතු වූයේ, ජාත්‍යන්තර වෙළඳපොලේ බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල 2021 වසරේ පළමු මාස අට තුළ පැවති ඇ.ඩො. 67 සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. 105 දක්වා ඉහළ යාමයි.

ජාත්‍යන්තර බණිජතෙල් මිල ඉහළ යාමත් සමග සීමිත සැපයුම්කරුවන් විසින් ඉහළ මිලක් නියම කිරීම හේතුවෙන් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙහි මුළු විකුණුම් පිරිවැය 2021 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 358.3 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 737.4 ක් දක්වා සියයට 106 කින් වැඩි වී ඇත. රටේ මූල්‍ය අර්බුදය හේතුවෙන් බැංකු විසින් නොගෙවූ ණයවර ලිපි ඉහළ යාමත් සමග ඛනිජතෙල් නිෂ්පාදනවල තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලියට වූ බාධා වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මෙම ජාත්‍යන්තර බණිජතෙල් මිල ඉහළ යාමේ ප්‍රවණතාවය තුළ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් පිරිවැයට වඩා අඩුවෙන් ඛනිජතෙල් නිෂ්පාදන අලෙවි කිරීම හේතුවෙන් 2022 වසරේ පළමු මාස පහක කාලය තුළ සැලකිය යුතු අලාභයක් සිදු වී ඇත. කෙසේ වෙතත්, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් මෙහෙයුම් අලාභය සහ මූල්‍ය දුෂ්කරතාවයන් අවම කිරීමේ උපායමාර්ගික පියවරක් ලෙස 2022 වසරේ මැයි මස අවසානයේ පිරිවැය මත පදනම් වූ මිල සූත්‍රයක් හඳුන්වා දෙන ලදී. නිතර මිල ගැලපීම් සිදු වුව ද, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙහි 2021 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 19.8 ක් වූ මෙහෙයුම් අලාභය, 2022 සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 52.0 ක් විය.

රුපියල අවප්‍රමාණය වීම, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ කාර්යසාධනයට අහිතකර ලෙස බලපා ඇත. විදේශ විනිමය අනුපාතිකයේ බලපෑම 2021 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 44.8 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 546.0 ක් විය. මේ අතර ඇමෙරිකානු ඩොලර්වලින් නාමනය කරන ලද නොපියවූ ණය ගෙවීමේ පිඩනයත් සමග ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය පිරිවැය 2021 පළමු මාස අට තුල වූ රු. බිලියන 16.0 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 57.6 ක් දක්වා සියයට 260 කින් වැඩි විය.

අධි අවදානම් තත්ත්වය සමඟ, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ සමුච්චිත අලාභය 2022 අගෝස්තු අවසානය වන විට රු. බිලියන 1,051.0 ක් ලෙස වාර්තා විය. එබැවින්, 2022 වසරේ අගෝස්තු මස අවසානය විට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, ලංකා බැංකුව සහ මහජන බැංකුව වෙත ගෙවිය යුතු මුළු මුදල රු. බිලියන 1,042.0 ක් දක්වා වර්ධනය වී ඇත. එසේම, ඉන්දියානු ණය පහසුකම හරහා ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව රජයට රු. බිලියන 228.8 ක් ගෙවිය යුතුව ඇත.

මීට අමතරව, ලංකා විදුලිබල මණ්ඩලයෙන් හා ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් ඇතුළුව නොපියවූ ණය රු. බිලියන 206.6 දක්වා වර්ධනය වීම හේතුවෙන්, එම ආයතන දෙකෙහි දුර්වල මූල්‍ය තත්ත්වය ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙහි ශේෂ පත්‍රය මත ද්විත්ව බලපෑමක් ඇති කර ඇත.

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙහි ණය බර වැඩිවීම එහි අනාගත ආයෝජන හා මෙහෙයුම් කටයුතු කෙරෙහි බලපා ඇත. ගෝලීය සැපයුම්කරුවන්ට වෙළඳ මෙහෙයුම්වලට ඇතුළු වීමට ඉඩ සලසා දීම තුළින් දේශීය ඛනිජ තෙල් වෙළඳපොලේ ද්වි අධිකාරය ඉවත් කිරීමට සහ බලශක්ති ක්ෂේත්‍රය ලිබරල්කරණය කිරීමට, ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) සංශෝධන පනත් කෙටුම්පත 2022 වසරේ ඔක්තෝම්බර් මාසයේ දී පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලදී. ඊට සමගාමීව, දිගු කාලීන ගිවිසුම් මත පදනම්ව ශ්‍රී ලංකාව තුළ ඛනිජතෙල් නිෂ්පාදන ආනයනය, බෙදා හැරීම හා විකිණීම සඳහා ඛනිජතෙල් නිෂ්පාදනය කරන රටවල ස්ථාපිත ආයතනවල අරමුදල් යොදා ගනිමින් සුදුසු ව්‍යාපාර ආකෘතියක් ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාවය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින්, එම ආයතනවලින් අභිලාෂ කැඳවීම මගින් ශ්‍රී ලංකාවේ ඉන්ධන වෙළඳපොළ විවෘත කිරීමට රජය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයක් ගෙන ඇත. මෙම සමාගමට ශ්‍රී ලංකාවේ විදේශ විනිමය වෙළෙඳපොළ මත රඳා නොසිට එකඟ වූ කාල සීමාවක්

සඳහා එහි විදේශ විනිමය භාවිතා කරමින් බනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමේ හැකියාව තිබිය යුතුය. මේ සඳහා සේවා සැපයීමේ ගාස්තුවක් මත පදනම්ව, ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව සතුව හෝ එම සංස්ථාව මඟින් විවෘත කිරීමට නියමිත ඉන්ධන පිරවුම්හල් භාවිතයෙන් මෙන්ම සීමාසහිත ලංකා බනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමෙහි යටිතල පහසුකම් භාවිතා කිරීමෙන් අඛණ්ඩව බනිජතෙල් නිෂ්පාදන මෙරටට සැපයීම තහවුරු කිරීම සඳහා ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව සමඟ දිගුකාලීන ගිවිසුම්වලට එළඹීමට අවශ්‍ය වේ.

#### ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2022 වසරේ පළමු මාස නවය තුළ 1,494,883 ක බහලු මෙහෙයුම් ප්‍රමාණයක් සහ භාණ්ඩ මෙට්‍රික් ටොන් 6,397,640 ක් හසුරුවා ඇත.

2022 වසරේ පළමු මාස හත තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත ආදායම රු. බිලියන 36.7 ක් සහ සමස්ත වියදම රු. බිලියන 20.6 ක් වූ අතර, රු. බිලියන 16.1 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කර ඇත. 2022 වසරේ පළමු මාස හත සඳහා ඇස්තමේන්තුගත ලාභය වූ රු. බිලියන 19.3 ට සාපේක්ෂව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් රු බිලියන 31.2 ක ලාභයක් වාර්තා කර ඇත. තවද, ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2022 වසරේ පළමු මාස හත තුළ රු. බිලියන 4.3 ක විදේශ විනිමය ලාභයක් ද වාර්තා කර ඇත.

#### ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ජාතික ප්‍රතිපත්තියට අනුකූලව පිරිසිදු හා සුරක්ෂිත පානීය ජලය සැපයීම සඳහා අඛණ්ඩව කැපවී සිටියි. 2025 වසර වන විට ඉලක්ක සපුරා ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මහජනතාවගේ ජල සැපයුම් ආවරණය හා සනීපාරක්ෂක කටයුතු අඛණ්ඩව ඉහළ නැංවීමේ නියැළී සිටින අතර, 2022 වසරේ පළමු මාස අට තුළ සමස්ත නල ජල ආවරණය සියයට 55.50 ක් ද, ආරක්ෂිත ජල සැපයුම් ආවරණය සියයට 95.6 ක් ද, නල ජලාපවහන ආවරණය සියයට 2.08 ක් ද ලෙස ජල සැපයුම් ආවරණය වාර්තා වී ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ආදායම, 2021 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 17.2 ට සාපේක්ෂව, 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 18.3 ක් විය. කෙසේ වෙතත්, 2022 වසරේ පළමු මාස අට තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මෙහෙයුම් අලාභය රු. බිලියන 1.8 ක් දක්වා සැළකිය යුතු ලෙස වර්ධනය වී ඇත. 2022 වසරේ පළමු මාස අට තුළ ඉන්ධන මිල ඉහළ යාම හා අනෙකුත් වියදම් වැඩිවීම හේතුවෙන් විකුණුම් පිරිවැය රු. බිලියන 12.7 දක්වා සියයට 7.6 කින් සහ පරිපාලන වියදම් සියයට 9.7 කින් වර්ධනය වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, මිලියන 2.83 ක සමස්ත සම්බන්ධතා ප්‍රමාණයක් සමඟ 2022 වසරේ පළමු මාස අට තුළ පද්ධතියට නව සම්බන්ධතා 185,614 ක් ලබා දී ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජලය ඝන අඩි මිලියන 413 ක විකිණීම් ප්‍රමාණයකට සාපේක්ෂව ජලය ඝන අඩි මිලියන 553 ක් නිෂ්පාදනය කර ඇත. මේ අතර, 2021 වසරේ අගෝස්තු මස අවසන් වන විට සියයට 25.43 ක්ව පැවති ආදායම් නොලබන ජල ප්‍රතිශතයට සාපේක්ෂව, 2022 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 24.88 දක්වා වර්ධනය වී ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සංවර්ධන ව්‍යාපෘතිවල ණය ආපසු ගෙවීම සඳහා 2022 වසරේ අගෝස්තු මස අවසානය වන විට මහා භාණ්ඩාගාරය විසින් අඛණ්ඩව සහාය ලබා දෙමින් ප්‍රාග්ධන දායකත්වය ලෙස රු. බිලියන 12.9 ක් ලබා දී ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මත පදනම්ව, ආයතනයේ මූල්‍ය බැඳීම් සැලකිල්ලට ගනිමින් වසර දහයකට පසුව පිරිවැය නිරූපිත ජල ගාස්තු සංශෝධනයක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර, එවැනි ගාස්තු සංශෝධනය වාර්ෂික පදනමින් සිදු කිරිමට නියමිතය.

#### ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම

ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් 2022 පළමු මාස හත තුළ රු. බිලියන 13.7 ක ආදායමක් උපයා ඇති අතර, එයින් රු. බිලියන 10.4 ක් ගගනගාමී නොවන ආදායම විය. ප්‍රධාන වශයෙන්ම, විදුලිය ගාස්තු සහ සේවක පිරිවැය ඉහළ යාම හේතුවෙන් 2022 පළමු මාස හත තුළ ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ මුළු පිරිවැය රු. බිලියන 8.0 දක්වා වැඩි වී ඇත. ඒ අනුව, 2022 වසරේ පළමු මාස හත තුළ ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම රු. බිලියන 5.6 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කර ඇත. කෙසේවෙතත්, විනිමය අලාභයේ බලපෑම හේතුවෙන් 2022 පළමු මාස හත තුළ රු. බිලියන 1.1 ක බදු පෙර අලාභයක් වාර්තා කිරීමට ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමට සිදු විය.

මේ අතර, වත්මන් ණය කළමනාකරණ ප්‍රතිපත්තිය ප්‍රකාරව, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ මගී පර්යන්තය අදියර 2 සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇත.

**ශ්‍රී ලංකන් ගුවන් සමාගම**

ශ්‍රී ලංකන් ගුවන් සමාගම, 2022/23 මූල්‍ය වර්ෂයේ පළමු භාගය තුළ රු. බිලියන 170.4 ක ආදායමක් උපයා ඇති අතර, ප්‍රධාන වශයෙන් ගුවන් යානා ඉන්ධන පිරිවැය, ගුවන් තොටුපොළ, ගමන් හා මගී පිරිවැය සහ විනිමය අලාභ ඉහළ යාම් හේතුවෙන් ශ්‍රී ලංකන් ගුවන් සමාගම රු. බිලියන 284.2 සමස්ත වියදමක් දරන ලදී. මෙසේ මිල ඉහළ යාම් හේතුවෙන් ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් රු. බිලියන 113.8 ක මෙහෙයුම් අලාභයක් 2022/23 මූල්‍ය වර්ෂයේ පළමු භාගය තුළ වාර්තා කර ඇත. වසර ගණනාවක් පුරා ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් අඛණ්ඩව දරන ලද සමුච්චිත පාඩු සැලකිල්ලට ගෙන එම සමාගම සතු රජයේ කොටස් අයිතිය ප්‍රතිව්‍යුහගත කිරීමට තීරණය කර ඇත. ඒ අනුව, රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකයේ සහාය ඇතිව, ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් සිදු කරනු ඇත.

**වගුව 3.2 : ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි ලාභදායීත්වය**

රු. මිලියන

| | රාජ්‍ය ව්‍යවසාය | 2020* | 2021* | වෙනත් අයුරකින් සඳහන් කර නොමැති නම් 2022.08.31 න් අවසන් වන කාලපරිච්ඡේදය සඳහා (කෙටුම්පත්) |
|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව | 23,552 | 43,190 | 27,033 |
| 2 | මහජන බැංකුව | 21,227 | 30,387 | 15,697 |
| 3 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 15,645 | 28,555 | 6,575 |
| 4 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 790 | 621 | 185 |
| 5 | නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව | 1,381 | 1,199 | 390 |
| 6 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 2,061 | 1,927 | 431 |
| 7 | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | 32,500 | 33,159 | 26,814 |
| 8 | සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 7,972 | 11,725 | 9,459 |
| 9 | ජාතික රක්ෂණභාර අරමුදල | 8,866 | 5,936 | 2,583** |
| 10 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 265 | 310 | 95** |
| 11 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | 1,257 | 1,780 | 579 |
| 12 | ලංකා විදුලිබල මණ්ඩලය | -60,486 | -21,450 | -108,670 |
| 13 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 2,371 | -82,208 | -632,044 |
| 14 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 20,328 | 25,601 | 31,189** |
| 15 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 643 | -2,996 | -1,324 |
| 16 | සීමාසහිත ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | -3,733 | -755 | -1,113** |
| 17 | සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම [අ] (2022 අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා) | -45,230 | -170,751 | -113,767 |
| 18 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | -2,105 | -3,143 | 2,114 |
| 19 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | -1,066 | -1,020 | -522 |
| 20 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 261 | 250 | -41 |
| 21 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | -257 | 43 | 31 |
| 22 | සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම | 230 | 330 | -412*** |
| 23 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | - | 158 | -14*** |
| 24 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | -150 | -232 | 22 |
| 25 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | -351 | -481 | 50 |
| 26 | සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම | 214 | 468 | 400 |
| 27 | සීමාසහිත හලාවත වැවිලි සමාගම | 283 | 511 | 321** |
| 28 | සීමාසහිත කළුබෝවිටියන තේ කර්මාන්තශාලාව | 43 | -15 | 247 |
| 29 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | 15 | 16 | 1 |
| 30 | ශ්‍රී ලංකා ඛනිජ වැලි සමාගම | 69 | 1,205 | 3,124 |
| 31 | සීමාසහිත ලංකා පොස්පේට් සමාගම | 150 | 117 | -7** |
| 32 | සීමාසහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම [අ] | 14 | 4 | 41 |
| 33 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 2,994 | 2,954 | 2,202 |
| 34 | ජාතික ලොතරැයි මණ්ඩලය | 1,435 | 1,003 | 638 |
| 35 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 1,161 | 1,238 | 808 |
| 36 | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | 9 | -21 | -21 |
| 37 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 2,546 | 3,157 | -2,080 |
| 38 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 174 | -258 | -10 |
| 39 | සීමාසහිත ස්වාධීන රූපවාහිනී ජාලය | -251 | -344 | -234 |
| 40 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | -236 | -224 | -338 |
| 41 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | -2 | 9 | -111 |
| 42 | සීමාසහිත ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) | -98 | -35 | 33 |
| 43 | රාජ්‍ය දැව සංස්ථාව | 464 | 1,236 | 201 |

## ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි ලාභදායීත්වය

රු. මිලියන

| | රාජ්‍ය ව්‍යවසාය | 2020* | 2021* | වෙනත් අයුරකින් සඳහන් කර නොමැති නම් 2022.08.31 න් අවසන් වන කාලපරිච්ඡේදය සඳහා (කෙටුම්පත්) |
|---|---|---|---|---|
| 44 | ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව | -120 | 63 | 12 |
| 45 | සීමාසහිත ලංකා සතොස සමාගම | -1,381 | -880 | -360 |
| 46 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | -44 | -208 | -213 |
| 47 | ලංකා ධීවර සංස්ථාව | -48 | -63 | -60 |
| 48 | ලංකා ධීවර වරාය නිෂ්පාදන නීතිගත සංස්ථාව | -236 | -140 | -97 |
| 49 | සීමාසහිත ලංකා පොහොර සමාගම | 268 | 124 | 12 |
| 50 | සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 241 | 260 | 138 |
| 51 | සීමාසහිත හොටෙල් ඩිවලොපර්ස් ලංකා ලිමිටඩ් | -877 | -947 | -297 |
| 52 | සීමාසහිත ලංකා සීනි සමාගම | 1,171 | 1,577 | 3,435 |
| | **එකතුව** | **33,929** | **-87,058** | **-726,875** |

මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
* කෙටුම්පත්
** 2022.07.31 දිනට ලාභය (2022 ජනවාරි මස සිට ජූලි මස දක්වා)
*** 2022.06.30 දිනට ලාභය (2022 ජනවාරි මස සිට ජූනි මස දක්වා)
(අ) 2022 මාර්තු 31 න් අවසන් වන මූල්‍ය වර්ෂය

## වගුව 3.3 : රාජ්‍ය ව්‍යවසායයන් වෙතින් ලද අයබදු/ලාභාංශ ආදායම

රු. මිලියන

| රාජ්‍ය ව්‍යවසාය | සත්‍ය | | 2022.08.31 දිනට | පුරෝකථන | |
|---|---|---|---|---|---|
| | 2020 | 2021 | | 2023 | 2024 |
| **අයබදු** | **14,769** | **25,919** | **12,931** | **30,039** | **30,639** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 1,000 | 3,500 | - | 2,100 | 2,142 |
| ලංකා බැංකුව | 1,250 | 1,500 | - | 6,500 | 6,630 |
| මහජන බැංකුව | 2,500 | 1,977 | - | 1,750 | 1,785 |
| විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | 5,000 | 8,500 | 7,200 | 9,000 | 9,180 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | - | - | - | - | - |
| රාජ්‍ය දැව සංස්ථාව | - | 100 | 150 | 100 | 102 |
| ජාතික රක්ෂණභාර අරමුදල | 782 | 1,824 | 1,508 | 2,500 | 2,550 |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | - | 2,000 | 650 | 1,500 | 1,530 |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | - | 15 | 35 | 30 | 31 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 156 | - | 416 | 450 | 459 |
| සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | - | - | - | - | - |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | - | 25 | - | 20 | 20 |
| ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය | - | 25 | - | - | - |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | - | - | - | 50 | 51 |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | - | 50 | 500 | 500 | 510 |
| රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | - | 100 | 100 | 100 | 102 |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | - | - | 128 | 100 | 102 |
| ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | - | 110 | 290 | 200 | 204 |
| ශ්‍රී ලංකා විදේශ සේවා හා නියුක්ති කාර්යාංශය | - | - | 1,200 | 750 | 765 |
| ජාතික ගමනාගමන කොමිෂන් සභාව | - | - | 10 | - | - |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | - | - | - | 50 | 51 |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධන අධිකාරිය | - | - | - | 5 | 5 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | - | - | - | 1,499 | 1,529 |
| ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 81 | 147 | 400 | 250 | 255 |

## රාජ්‍ය ව්‍යවසායයන් වෙතින් ලද අයබදු/ලාභාංශ ආදායම

රු. මිලියන

| රාජ්‍ය ව්‍යවසාය | තත්‍ය | | 2022.08.31 දක්වා | පුරෝකථන | |
|---|---|---|---|---|---|
| | 2020 | 2021 | | 2023 | 2024 |
| ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය | - | 16 | 33 | 35 | 36 |
| ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | - | 5 | - | 10 | 10 |
| මාර්ග සංවර්ධන අධිකාරිය | 4,000 | 4,000 | - | 1,000 | 1,020 |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | - | 1,100 | - | 500 | 510 |
| ජාතික ලොතරැයි මණ්ඩලය | - | 900 | 261 | 500 | 510 |
| පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය | - | - | 50 | 20 | 20 |
| සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | - | 25 | - | 10 | 10 |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | - | - | - | 10 | 10 |
| වෙනත් | - | - | - | 500 | 510 |
| **ලාභාංශ** | **2,854** | **4,672** | **4,851** | **5,633** | **5,700** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 60 | 60 | 60 | 60 | 61 |
| ලංකා බැංකුව | 346 | 346 | 346 | 350 | 354 |
| මහජන බැංකුව | 316 | 316 | 316 | 300 | 304 |
| සීමාසහිත ජාතික සංවර්ධන බැංකුව | 1 | 1 | 1 | 2 | 2 |
| කොමර්ෂල් බැංකුව | - | - | 0.17 | 2 | 2 |
| සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 695 | 899 | 1,511 | 900 | 911 |
| සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම | - | - | - | 100 | 101 |
| සීමාසහිත ලංකා ඛණිජ වැලි සමාගම | - | 700 | 359 | 500 | 506 |
| සීමාසහිත ලංකා පොස්පේට් සමාගම | - | 20 | 20 | 15 | 15 |
| සීමාසහිත ලංකා ලේලන්ඩ් සමාගම | 2 | 3 | - | 3 | 3 |
| සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම | - | - | - | 50 | 51 |
| සීමාසහිත මාන්තායි සෝල්ට් සමාගම | 2 | 15 | - | 11 | 11 |
| සීමාසහිත ලංකා පොහොර සමාගම | 304 | 29 | 15 | 35 | 35 |
| සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | - | - | 10 | 10 | 10 |
| සීමාසහිත පරන්තන් කෙමිකල් සමාගම | 10 | 3 | 50 | 30 | 30 |
| සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | 947 | 1,331 | 1,805 | 2,100 | 2,125 |
| සීමාසහිත ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම | - | 345 | - | 130 | 132 |
| සීමාසහිත ලංකා විදුලිබල සමාගම | - | 327 | 218 | 250 | 253 |
| සීමාසහිත ලංකා කාර්මික වතු සමාගම | 82 | 82 | - | 25 | 25 |
| සීමාසහිත ලංකා කෘෂි කර්මාන්ත සමාගම | 77 | 95 | 24 | 30 | 30 |
| ලංකා ලොජිස්ටික්ස් ලිමිටඩ් | - | - | - | - | - |
| සීමාසහිත ලංකා ත්‍රිපෝෂ සමාගම | - | - | - | 10 | 10 |
| ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව | - | - | 11 | 15 | 15 |
| වැවිලි සමාගම් | 12 | 98 | 95 | 155 | 157 |
| වෙනත් | - | 2 | 10 | 550 | 557 |
| **එකතුව** | **17,623** | **30,591** | **17,782** | **35,672** | **36,339** |

මූලාශ්‍රඃ රාජ්‍ය ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

# 2023 අයවැය සැකසීම සඳහා පදනම් වූ සාධක

# 04

## 2023 අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා භාවිතා කරන පදනම

අයවැය සකස් කිරීමේදී යොදා ගන්නා ලද උපකල්පන, විශ්ලේෂණ සහ කාර්ය මණ්ඩල විනිශ්චයන් මාලාවක් මත 2023 වර්ෂයේ අයවැයෙහි සාර්ව ආර්ථික සහ මූල්‍ය ඇස්තමේන්තු පදනම් වී ඇත. ඇස්තමේන්තුවල සංවේදීතාවය ලබා දෙන අතරතුර, ආදායම් සහ වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේ දී යොදා ගන්නා දළ දේශීය නිෂ්පාදිතය, උද්ධමනය, විදේශීය අංශයේ ප්‍රවණතා සහ විරැකියාව වැනි ප්‍රධාන සාර්ව ආර්ථික දර්ශක සම්බන්ධයෙන් වන උපකල්පන පිළිබඳ විස්තරාත්මක කරුණු ද මෙමගින් ලබාදෙනු ඇත.

### දළ දේශීය නිෂ්පාදිතය

පවතින නොවූ විරූ සාර්ව ආර්ථික අර්බුදයෙන් මිදීමට ශ්‍රී ලංකාව වර්තමානයේ ප්‍රයත්න දරමින් සිටියි. අනෙකුත් කරුණු අතර, විදේශ මුදල් ද්‍රවශීලතාවය සම්බන්ධයෙන් ඇති වූ උග්‍ර සීමාවලට තුඩු දෙමින් විදේශ සංචිත ඉතා අඩු මට්ටමක පැවතීම සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉන්ධන, ගෑස්, ඖෂධ සහ අමු ද්‍රව්‍ය වල හිගයන් ඇති වීම, ඉතා ඉහළ උද්ධමන මට්ටම සහ ඉහළ යන ආහාර මිල ගණන්, තිරසාර නොවන ණය මට්ටම හා විදේශ ණය ගෙවීම තාවකාලිකව නැවැත්වීම යනාදී කරුණු මඟින් මෙම බහුවිධ අර්බුදය නිරූපිත වේ. අර්බුදය නිසා ආර්ථික ක්‍රියාකාරකම්වලට ඇති වූ බාධා හේතුවෙන් 2022 පළමු අර්ධයේදී ආර්ථිකය සියයට 4.8 කින් සංකෝචනය විය. මෙම වාර්තාව සම්පාදනය කරන අවස්ථාව වන විට, ඉන්ධන මිල දී ගැනීම සඳහා සලාක ක්‍රමයක් හඳුන්වා දීම සහ ගෑස් සැපයුම අඛණ්ඩව පවත්වා ගෙන යාම සමඟ අර්බුදයේ බලපෑම යම් තාක් දුරකට මඟ හැරී ගොස් තිබුණ ද, විදේශ විනිමය සම්බන්ධ ගැටලු අඛණ්ඩව පවතින අතර, එය අමුද්‍රව්‍ය හිඟය ඇති වීම, යෙදවුම්වල මිල ඉහළ යාම සහ විදුලිය කප්පාදු කිරීම් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා හේතු වී ඇත. සැපයුම් අංශයේ පවතින මෙම සීමාවන්, රැකියා සහ ආදායම් අහිමි කිරීමට බලපෑමක් එල්ල කරමින්, නිෂ්පාදනයට බලපානු ලබයි. ඉල්ලුම් අංශය සැලකීමේ දී, ඉහළ උද්ධමනකාරී වාතාවරණය තුළ, පෞද්ගලික පාරිභෝජනය ද, රාජ්‍ය ආයෝජනය ද සීමා සහිත වනු ඇත. එමෙන්ම, 2023 වසරේ දී බොහෝ රටවල ඇති වනු ඇතැයි අපේක්ෂිත ආර්ථික පසුබෑස්ම සහ එක්සත් ජනපදය, යූරෝ කලාපය සහ චීනය යන ප්‍රධාන ආර්ථිකයන් තුන මන්දගාමී වීම මඟින්, ශ්‍රී ලංකා අපනයන සඳහා පවතින ඉල්ලුම මෙන්ම ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන් ගණන සම්බන්ධයෙන් බලපෑම් එල්ල කරනු ඇත. මෙම තත්ත්වය මත, ආර්ථික අර්බුදයෙන් එල්ල වන පීඩනයන් ඊළඟ වසර තෙක් පවතිනු ඇතැයි ද, 2023 වසරේ දී ආර්ථිකය සියයට 3.0 කින් සංකෝචනය වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

### පාරිභෝගික මිල ගණන්

2023 වසරේ සිට මුදල් මූල්‍යයනය අත්හැරීමත් සමඟ, මෙම වාර්තාව සම්පාදනය කරන විට සියයට 60 කට අධික මට්ටමක පවතින උද්ධමනය මධ්‍යස්ථ ලෙස අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම සහ ඉහළ ගෝලීය භාණ්ඩ මිල ගණන් හේතුවෙන් සියයට 30 ක පමණ සාමාන්‍යයක් යටතේ 2023 වසරේ දී උද්ධමනය ඉලක්කම් දෙකක අගයක් ගනු ඇත. ගෝලීය උද්ධමනය 2022 වසරේ අග භාගයේදී ඉහළම මට්ටමකට ළඟා වනු ඇති අතර, 2023 වසරේ සිව් වැනි කාර්තුවේ දී සියයට 4.7 කට අඩු වන තෙක් 2023 වසරේ දී ඉහළ අගයක පවතිනු ඇත. බ්‍රෙන්ට් බොර තෙල් මිල ගණන්, 2024 වසරේ දී බැලරයකට ඇ.ඩො. 80 දක්වා අඩු වීමට පෙර, 2023 වසරේ දී බැලරයකට ඇ.ඩො. 92 ක සාමාන්‍ය අගයක් ගනු ඇතැයි පුරෝකථනය කර තිබේ.

### සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය

ආර්ථික අර්බුදයේ බලපෑම හේතුවෙන්, 2022 වසරේ දෙවන කාර්තුවේදී, සේවා වියුක්ති අනුපාතය සියයට 4.6 දක්වා වැඩි වීමක් ද, ශ්‍රම බලකා දායකත්ව අනුපාතය සියයට 50.2 දක්වා ද අඩු වීමක් ද වාර්තා වී ඇත. කෙසේ වුවද, ක්‍රමයෙන් වේගවත් වනු ඇතැයි අපේක්ෂිත ආර්ථික ක්‍රියාකාරකම් සමඟ, 2023 වසරේ දී සේවා වියුක්ති අනුපාතය සියයට 5 කට අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂිතය. පොහොර ලබා ගැනීමේ හැකියාව තහවුරු කිරීම සමඟ කෘෂිකාර්මික අංශය පුනර්ජීවනය වනු ඇති අතර, අපේක්ෂිත පරිදි ක්‍රමයෙන් ආනයන සීමා ඉවත් කිරීම සමඟ කාර්මික අංශය සැළකිය යුතු ලෙස යථා තත්ත්වයට පත් වනු ඇත.

### විදේශ අංශය

2022 පළමු මාස නවය තුළ ඇති වූ ඇ.ඩො. මිලියන 4,104 කට අඩු වන ලද වෙළඳ ශේෂය සමඟ ඉදිරියට යමින්, නිෂ්පාදනය සඳහා පවතින බාධා ක්‍රමයෙන් අඩු වීම සමඟ අපනයනවල වර්ධනය සහ ඉහළ මිල ගණන්, මූල්‍යයනය සීමා සහිත වීම සහ ආනයන සීමා කිරීම නිසා ආනයන භාණ්ඩ සඳහා ඇති වන ඉල්ලුම අඩු වීම හේතුවෙන් 2023 වසරේ දී වෙළඳ ශේෂය තවදුරටත් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, අයෝජන සහ අතරමැදි භාණ්ඩ සඳහා වැඩි වූ ඉල්ලුමට සරිලන පරිදි ආනයන සීමා කිහිපයක් ලිහිල් කිරීමට අපේක්ෂා කෙරේ. තවද, 2023 වසරේ දී සංචාරක පැමිණීම් සහ ශ්‍රමික ප්‍රේෂණ ඉහළ යනු ඇතැයි අපේක්ෂිත අතර, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමත් සමඟ සෘජු විදේශ ආයෝජන ගලා ඒම් යථා තත්ත්වයට පත් වනු ඇත.

### මුදල් සමස්තයන්

මුදල් සැපයුම සුදුසු මට්ටමක පවත්වා ගෙන යාමට අපේක්ෂා කෙරේ. ආදායම් මූලික රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න සහ 2023 වසරේ දී තව දුරටත් අඩු වෙතැයි අපේක්ෂිත අයවැය හිඟය සමඟ රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීම හා ඉන්ධන සහ විදුලිය සඳහා පිරිවැය ආවරණය කරන මිල ක්‍රමයක් හඳුන්වා දීම සමඟ රජයට ලබා දෙන ශුද්ධ ණය ක්‍රමයෙන් අඩු වනු ඇති අතර, පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා පහසුකම් සලසනු ඇත.

### ආදායම

